# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,871 — 1969 සැප්තැම්බර් 12 වැනි සිකුරාද — 1969.9.12**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ජේදය—පළකිරීම්

**(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)**


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1565 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1582 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1587 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1599 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1603 |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1602 | විවිධ දැන්වීම් ... ... ... | — |


**සැලකිය යුතුයි.**—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ආයුර්වේද වෛද්‍යවරයන්ගේ නාම ලේඛනයක් සහ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් ද පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම් කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණාලය.**
**කොළඹ.**

ඇල්. ඩබ්ලිව්. පී. පිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ඇ) රසායන විද්‍යාව
(ඈ) කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව

සැ.යු.—ලංකාවේ විශ්ව විද්‍යාලවල අවසාන පරීක්ෂණවලට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන් ද අයදුම් පත් භාරගනු ලැබේ. එහෙත් විශ්ව විද්‍යාලයෙන් ප්‍රතිඵල නිකුත් කළ වහාම එම පරීක්ෂණයෙන් තමා සමත් වී තිබේ ද යන වග ඔවුන් විසින් මා වෙත දැනුම් දිය යුතුය. නොඑසේ නම් ඔවුන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ.

නැතහොත්

(II) පහත දැක්වෙන ඕනෑම ක්ෂෙත්‍රයක් පිළිබඳ විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් තිබිය යුතුය :—

(i) ව්‍යවහාර කීට විද්‍යාව
(ii) පැළෑටි රෝග නිදාන විද්‍යාව
(iii) පාංශු ශුද්‍රජීව විද්‍යාව
(iv) පාංශු විද්‍යාව
(v) උද්‍යාන විද්‍යාව
(vi) පැළෑටි අභිජනනය
(vii) කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව හෝ
(viii) ශස්‍ය විද්‍යාව

නැතහොත්

(III) අවුරුදු 10 ක සේවයක් ඇත්තාවූ ද පර්යේෂණ කටයුතු කෙරෙහි උද්‍යෝගයක් ඇත්තාවූ ද පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳව.

හෝ

පහත දැක්වෙන විෂයයන්ගෙන් ඕනෑම එකක් ප්‍රධාන විෂය වශයෙන් ගෙන ලබා ඇති උපාධියක් දරණ, දෙපාර්තමේන්තුවේ නියුක්ත නිලධාරි යෙකු විය යුතුය :—

(අ) උද්භිද විද්‍යාව
(ආ) සත්ත්ව විද්‍යාව
(ඇ) රසායන විද්‍යාව
(ඈ) කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව.

**සටහන :**

පළපුරුද්දක් සහ/හෝ පශ්චාත් උපාධි සුදුසුකම් ඇති අපේක්ෂකයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුයි:—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මාහාචාර්යවරයා ගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතිකය.

සැ.යු. :—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන් ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද (බී''' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (''ඒ'' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම් කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 සැප්තැම්බර් මස 5 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500.

9—425/3—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනය

### විදේශ පුහුණුව

නෙදර්ලන්ත රජය මගින් ලබාදී ඇති, හේග් නුවර සමාජ අධ්‍යයන ආයතනයෙහි පහත සඳහන් ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා ලංකාණ්ඩුව වෙනුවෙන් නම් කිරීමට රාජ්‍ය සේවයේ හා සංස්ථාවන්හි මාණ්ඩලික ශ්‍රේණිවල නිල ධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අවසාන වශයෙන් අපේක්ෂකයින් තේරීම සහ ශිෂ්‍යත්ව ප්‍රදානයද නෙදර්ලන්ත රජයේ අභිමතය පරිදි සිදුවන බවත්, යෝජිත නම් ඉදිරිපත් කිරීම අවශ්‍යයෙන්ම අවසාන තේරීම නොවන බවත් පැහැදිලි වශයෙන්ම අවබෝධ කටයුතුය.

යෝග්‍යත්වය.—(i) රාජ්‍ය සේවයෙහි අයදුම්කරුවන් මාණ්ඩලික තනතුරක අඩුම වශයෙන් හත් අවුරුද්දක සේවයක් ඇති මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන් විය යුතුය.

(ii) 1970.1.1 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

(iii) අවශ්‍යයයි සඳහන් කොට ඇති විට, නියමිත අධ්‍යයන ක්ෂෙත්‍රය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අයදුම්කරුවන්ට තිබිය යුතුය. එම අධ්‍යයන ක්ෂෙත්‍රයන්හි පශ්චාත් උපාධි කටයුතු කර ඇතොත් වෙනත් ක්ෂෙත්‍රයන්හි උපාධිධාරීන් ගැනද සලකා බලනු ඇත.

1. ජාතික සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව.—කාලය—70.9.7 වැනි දින සිට 1971.7.13 වැනි දින දක්වා මාස 10 කි.

අරමුණ—සංවර්ධන ක්‍රියා පද්ධතීන් හැදෑරීම. අයදුම්කරුවන් ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, මානව විද්‍යාව, දේශපාලන විද්‍යාව හෝ රාජ්‍ය පරිපාලනය විශේෂකොට, සමාජ විද්‍යාවක් පිළිබඳ උපාධිධාරීන් විය යුතුයි.

2. රාජ්‍ය පරිපාලන ඩිප්ලෝමා පාඨමාලාව.—කාලය—1970.1.5 වැනි දින සිට 1970.7.10 වැනි දින දක්වා මාස 6 කි.

අරමුණු—සංවර්ධනය වෙමින් පවත්නා රටවල පරිපාලන ගැටළු පිළිබඳව නව දර්ශනයක් ලබා පරිපාලන දක්ෂතාවයන් දියුණු කරගැනීම සඳහා අවස්ථාවක් සැලසීම. මෙම පාඨමාලාව විධායක තනතුරු උසුලන්නාවූ හෝ ඉසිලීමට ආසන්නව සිටින්නාවූ හෝ මධ්‍යම වෘත්තීය නිලධාරීන් සඳහා මූලික වශයෙන් අරමුණු වූවකි.

අයදුම්කරුවන් දේශපාලන විද්‍යාව, රාජ්‍ය පරිපාලනය, නීතිය, ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ උපාධිධාරීන් විය යුතුය.

3. සමාජ ප්‍රතිපත්ති ඩිප්ලෝමා පාඨමාලාව.—කාලය—1970.9.7 වැනි දින සිට 1971.5.21 වැනි දින දක්වා 8 මාසයකි.

අරමුණු—ආර්ථික වර්ධනයට අදළ තත්ත්වයන් යටතේ මානුෂික ශුභ සාධනය හා ප්‍රශස්ත සම්බන්ධතාවයන් උදෙසා වූ සවිඥානක අඛණ්ඩ ප්‍රයත්නයක් වශයෙන් සමාජ ප්‍රතිපත්තිය හැදෑරීම. මෙම පාඨ මාලාවෙහි සංකේන්ද්‍රණ ක්ෂෙත්‍රයන් දෙකක් ඇත :—

(1) නගරබද හා ගම්බද පෙදෙස් සඳහා සමාජ ක්‍රම සම්පාදනය හා ප්‍රජා සංවර්ධනය (සමාජ ප්‍රතිපත්තිය පිළිබඳ ක්ෂෙත්‍රයෙහි සංවිධානය ක්‍රම සම්පාදනය හා පර්යේෂණ ශිල්පී ධර්මයන්; ප්‍රජා සංවර්ධනය පිළිබඳ ක්‍රම හා ශිල්පී ධර්මයන් හා සමස්ත ක්‍රම සම්පාදනයෙහිලා පසුව සඳහන් කළ අංගයෙහි සංදේශ කාර්යයද පිළිබඳව කරුණු හැදෑරීම).

(2) කාර්මික හා කම්කරු සම්බන්ධතා (කාර්මික කිරීමේ ක්‍රියා පද්ධතිය සහ සමාජය කෙරෙහි එහි බලපෑම පිළිබඳ විග්‍රහයක්; කාර්මික හා කම්කරු සම්බන්ධතා ඇතිකොට දියුණු කරනු ලබන ආයතනයන්හි හා මාර්ගයන්හි රාමුව මූළු වශයෙන් පිරික්සා බැලීම; කර්මාන්ත ව්‍යාපාරවල මානුෂික සම්බන්ධතාවන්හි විශේෂ ස්වභාවය විග්‍රහ කිරීම. කර්මාන්ත ක්ෂෙත්‍රයෙහි ප්‍රතිපත්ති සකස් කරන්නන්ට (ව්‍යාපාරයන්හි සේවක කළමනාකරුවන්, වෘත්තීය සමිති නායකයින්, රජයේ නිලධාරීන්) ප්‍රයෝජනවත් වන නවීන ක්‍රම හා ශිල්ප ධර්ම පිළිබඳව පුහුණුවක්ද ලබාදෙනු ඇත.

**4. ආර්ථික ක්‍රම සම්පාදන ඩිප්ලෝමා පාඨමාලාව.**—කාලය—1970.11.2 වැනි දින සිට 1971.5.27 වැනි දින දක්වා මාස 7 කි.

අරමුණු—ආර්ථික ක්‍රම සම්පාදනය පිළිබඳ දර්ශනය වැඩි දියුණු කිරීම හා එහි ප්‍රායෝගික ප්‍රයෝජනය හා සම්බන්ධ ගැටළු හැදෑරීම. අයදුම්කරුවන්ට, ක්‍රම සම්පාදනය, ජාතික ගණන් තැබීම හෝ සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳව පළපුරුද්දක්ද සහිතව ආර්ථික විද්‍යාව පිළිබඳ ගැඹුරු දැනීමක් හා ගණිත සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ මූලික දැනුමක්ද තිබිය යුතුය.

**5. කාර්මික සංවර්ධන වැඩපිළිවෙලවල් සකස් කිරීම.**—කාලය—1970.11.2 වැනි දින සිට 1971.3.25 වැනි දින දක්වා මාස 5 කි.

අරමුණු—සංවර්ධනය වෙමින් පවත්නා රටවල සර්ව ආර්ථික ක්‍රම සම්පාදනය පිළිබඳ රටාව ඇතුළත ක්‍රම නිෂ්පාදන සකස් කිරීම හා අගය කිරීම.

අයදුම්කරුවන්, ඉංජිනේරු ශිල්පය, ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව උපාධිධාරී තත්ත්වයක් සහිත කාර්මික හෝ ආර්ථික ක්‍රම සම්පාදනය පිළිබඳ පළපුරුද්දක් ඇති පුද්ගලයින් විය යුතුය.

**6. ප්‍රදේශ කලාපීය සංවර්ධන ක්‍රම සම්පාදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව.**—කාලය—1970.10.9 වැනි දින සිට 1971.7.13 වැනි දින දක්වා මාස 9 කි.

අරමුණ—සංවර්ධනය වෙමින් පවත්නා රටවල ප්‍රදේශ කලාපීය සංවර්ධනය පිළිබඳ ගැටළු මෙන්ම ප්‍රදේශ කලාපීය සංවර්ධන ක්‍රම සම්පාදනය පිළිබඳ අධ්‍යයන ක්‍රම හා ශිල්ප ධර්ම පිළිබඳවද දර්ශනයක් ලබාගැනීමට අවස්ථාවක් සලසාදීම.

අයදුම්කරුවන්, සමාජ විද්‍යාව හෝ ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ උපාධිධාරීන් හෝ ක්‍රම සම්පාදනයට අදාළ වෘත්තීය තත්ත්වයෙහි සිටින්නාවූ පුද්ගලයින් හෝ විය යුතුය.

**ප්‍රදානයේ කොන්දේසි.**—(i) නෙදර්ලන්තයේ හේග් නුවරට යාම සහ ඒම පිළිබඳ ගමන් ගාස්තු

(ii) මාසික ජීවන දීමනාවක්

(iii) අධ්‍යයන වියදම.

**අයදුම්පත්.**—ආදර්ශ ආකෘතියකට අනුව සාරානුකූලව පිළියෙල කළයුතු අයදුම්පත් (එක් එක් පාඨමාලාවක් සඳහා එක් පිටපතක් බැගින්) 1969 සැප්තැම්බර් 26 වැනිදට පළමු කොළඹ 3, ග්ලෙන් ආබර් පෙදෙසේ, අංක 32, දරන ස්ථානයේ පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂට ලැබිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කළයුත්තේ අදළ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් මගිනි. වැඩිපුර විස්තර අවශ්‍ය නම් සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී පරිපාලන අභ්‍යාස ආයතනයට (දුරකථනය 86236) කථා කරන්න.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ,
භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවට.

## පරිපාලන අභ්‍යාස ආයතනය—මහා භාණ්ඩාගාරය

### විදේශ පුහුණුව සඳහා ඉල්ලුම් පත්‍රය

(ඉල්ලුම්පත්‍රයේ II හා III කොටස් දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ස්ථිරලේකම් විසින් පෞද්ගලිකව අත්සන් කළයුතුය.)

**(I වැනි කොටස)**

1. අයදුම්කර සිටින පාඨමාලාව :————.
2. නිලධාරියාගේ නම (අගනම මුලට) හා සම්පූර්ණ තැපැල් ලිපිනය : ————.
3. උපන් දිනය හා 1970.1.1 දිනට වයස :————.
4. සේවය හා ශ්‍රේණිය :————.
5. රාජ්‍ය සේවයට (මාණ්ඩලික ශ්‍රේණියට) බැඳුනු දිනය :————.
6. රාජ්‍ය සේවයේ දැරූ තනතුරු සහ දින වකවානු :————.
7. ශාස්ත්‍රීය සුදුසුකම් :————.
8. භාෂා ප්‍රවීණත්වය :————.
9. නිලධාරියා සහභාගිවී ඇති විදේශ අභ්‍යාස පාඨමාලා, සම්මන්ත්‍රණ, සාකච්ඡා සම්මේලන ආදියේ විස්තර :————.
10. නිලධාරියා ලංකාවේදී හදරා ඇති අභ්‍යාස පාඨමාලා හෝ වෙනත් ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ විස්තර :————.
11. ඉහත 9 සහ 10 වැනි අංකයන් යටතේ දක්වා ඇති කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් යම් විශේෂ කාර්යක්ෂෙත්‍රයක නිලධාරියා ඇති කර ඇති වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් පිළිබඳ විස්තර :————.
12. මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු ඔබ දැරීමට බලාපොරොත්තුවන වගකීම් මොනවාද? :————.
13. නිලධාරිතැන විසින් වෙනත් එතෙර පුහුණුවීම් සඳහා ඉල්ලුම්කර එම් තීරණයක් මෙතෙක් නොලැබී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

මා විසින් සපයා ඇති ප්‍රකාශනයන් මගේ හොඳම විශ්වාසයේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත්, ........... වන/මම සහතික කරමි. පුහුණුව සඳහා පිළිගනු ලැබුවහොත්, ලංකා රජය සඳහා හා ඒ වෙනුවට පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන උපදෙස් පිළිපැදීමටත්, කොන්දේසිවලට අනුව ක්‍රියා කිරීමටත් මම පොරොන්දුවෙමි.

අත්සන :————.

දිනය :————.

**(II වැනි කොටස)**

මෙම පුහුණුවීමේ පාඨමාලාව හැදෑරීම සඳහා සෑම අතින්ම සුදුසුකම් ඇති ———— මහතාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. තෝරාගනු ලැබුවහොත් අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු මුදහරිනු ලැබේ.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.

දිනය :————.

**(III වැනි කොටස)**

———— දෙපාර්තමේන්තුවේ ———— (පදවි නාමය) ———— (නම) මහතාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. තෝරාගනු ලැබුවහොත් අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු මුදහරිනු ලැබේ.

———— මහතා/මහත්මිය, මෙම පුහුණුවීමේ පාඨමාලාවට සහභාගි වූවහොත් ඔහුගේ/ඇගේ පුහුණුව මැනවින් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිලධාරිතැන දිවයිනට පැමිණි පසු පහත සඳහන් වගකීම් ඔහුට/ඇයට භාරදෙනු ඇත.

මෙම අතිරේක වගකීම් සඳහා පුහුණුවීමේ වැඩ සටහනෙහි පහත සඳහන් විෂයයන්/අංගයන්/ලක්ෂණයන් ———— මහතාට සුදුසුයැයි මම අදහස් කරමි.

————,
ස්ථිර ලේකම්,
———— අමාත්‍යාංශය.

දිනය :————.

9–395/1—69.9.12 වැනි දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනය

### විදේශ පුහුණුව

බැංකොක්හි එක්සත් ජාතීන්ගේ ආර්ථික සංවර්ධන හා සැලසුම් ආයතනය මගින් පිරිනමනු ලබන, 1970.2.2 දින සිට 1970.7.31 දින දක්වා පැවැත්වෙන ආර්ථික හා සමාජ සංවර්ධන පාඨමාලාව සඳහා ශිෂ්‍යත්වයක් ප්‍රදානය කිරීම සඳහා ලංකාණ්ඩුව වෙනුවෙන් නම් කිරීමට රාජ්‍ය සේවයේ හා සංස්ථාවන්හි මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**යෝග්‍යත්වය :**

(i) රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් මාණ්ඩලික තනතුරක අවුම වශයෙන් පස් අවුරුද්දක සේවයක් ඇති මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන් විය යුතුය.

(ii) 1970.2.1 දිනට වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය.

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඊට සමාන තත්ත්වයේ වෘත්තිය සුදුසුකම් හෝ රාජ්‍ය මුදල් කළමනාකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමාව හෝ තිබිය යුතුය.

මෙම පාඨමාලව සකස්කර ඇත්තේ සංවර්ධන සැලසුම්හි නියැලී සිටින මධ්‍යම හෝ ප්‍රාදේශීය සැලසුම් මණ්ඩල, සංස්ථා, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වගකිවයුතු තනතුරු දරණ නිලධාරීන් සඳහාය. පාඨමාලාව සඳහා නම් කරනු ලබන අයදුම්කරුට සැලසුම්, ආර්ථික හා සමාජ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ පළපුරුද්දක් තිබීම අත්‍යවශ්‍යවේ. ආර්ථික විද්‍යාව, සංඛ්‍යා ලේඛනය, සමාජ විද්‍යාව, වෙළඳ පරිපාලනය හෝ සමාන සමාජ විද්‍යා උපාධි දරණ අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. එහෙත් සංවර්ධන යෝජනා ක්‍රම සම්බන්ධ කාර්යයන්හි නියුක්තව ඇත්නම්, කෘෂිකර්මය, ඉංජිනේරු විද්‍යා, කාර්මික විද්‍යා හා කායික විද්‍යා උපාධි දරණ අයදුම්කරුවන්ගේ ද ඉල්ලුම් පත් සැලකිල්ලට භාජනය කරනු ඇත.

**ප්‍රදානයේ කොන්දේසි :**

(i) බැංකොක් නගරයට යෑම සහ ඒම පිළිබඳ ගමන් ගාස්තු
(ii) මාසික ජීවන දීමනාවක්
(iii) අධ්‍යයන වියදම

**අයදුම්පත් :**

ආදර්ශ ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කළයුතු අයදුම් පත් 1969 සැප්තැම්බර් මස 26 වෙනි දිනට පෙර කොළඹ 3, ග්ලේන් ආබ

පෙදෙස් අංක 32 දරණ ස්ථානයේ පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂට ලැබිය යුතුයි. ආදර්ශ ආකෘති පත්‍රයේ අංක i, ii හා iii දරණ කොටස්වල සඳහන් කර ඇති කොන්දේසිවලට අනුව අයදුම්පත් එවිය යුතුය. වැඩිපුර විස්තර අවශ්‍ය නම් සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී පරිපාලන අභ්‍යාස ආයතන යට (දුරකතනය 86236) කථාකරන්න. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ,
භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවට.

## පරිපාලන අභ්‍යාස ආයතනය—මහා භාණ්ඩාගාරය

### විදේශ පුහුණුව සඳහා ඉල්ලුම් පත්‍රය

(ඉල්ලුම් පත්‍රයේ ii හා iii කොටස් දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ස්ථිර ලේකම් විසින් පෞද්ගලිකව අත්සන් කළයුතුය.)

### (I වැනි කොටස)

1. අයදුම්කර සිටින පාඨමාලාව :————.
2. නිලධාරියාගේ නම (අගනම මුලට) හා සම්පූර්ණ තැපැල් ලිපිනය : ————.
3. උපන් දිනය හා 1970.2.1 දිනට වයස :————.
4. සේවය හා ශ්‍රේණිය :————.
5. රාජ්‍ය සේවයට (මාණ්ඩලික ශ්‍රේණියට) බැඳුනු දිනය :————.
6. රාජ්‍ය සේවයේ දරූ තනතුරු සහ දින වකවානු :————.
7. ශාස්ත්‍රීය සුදුසුකම් :————.
8. භාෂා ප්‍රවීණත්වය :————.
9. නිලධාරියා සහභාගීවී ඇති විදේශ අභ්‍යාස පාඨමාලා, සම්මන්ත්‍රණ සාකච්ඡා සම්මේලන ආදියේ විස්තර :————.
10. නිලධාරියා ලංකාවේදී හදරා ඇති අභ්‍යාස පාඨමාලා හෝ වෙනත් ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ විස්තර :————.
11. ඉහත 9 සහ 10 වැනි අංකයන් යටතේ දක්වා ඇති කටයුතුවල ප්‍රතිඵ යක් වශයෙන් යම් විශේෂ කාර්යක්ෂෙත්‍රයක නිලධාරියා ඇති කර ඇති වෙනස්කම් හා වැඩි දියුණු කිරීම් පිළිබඳ විස්තරය :————
12. මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු ඔබ දැරීමට බලාපොරොත්තු වන වගකීම් මොනවාද ?————.
13. නිලධාරීතැන විසින් වෙනත් එතෙර පුහුණුවීම් සඳහා ඉල්ලුම්කර එහි තීරණයක් මෙතෙක් නොලැබී ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ————.

මා විසින් සපයා ඇති ප්‍රකාශනයන් මගේ හොඳම විශ්වාසයේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත් ............වන මම සහතික කරමි. පුහුණුව සඳහා පිළිගනු ලැබුවහොත්, ලංකා රජය සඳහා හා ඒ වෙනුවට පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන උපදෙස් පිළිපැදීමටත්, කොන්දේසිවලට අනුව ක්‍රියාකිරීමටත් මම පොරොන්දුවෙමි.

————,
අත්සන.

දිනය :————.

### (II වැනි කොටස)

මෙම පුහුණුවීමේ පාඨමාලාව හැදෑරීම සඳහා සෑම අතින්ම සුදුසුකම් ඇති ————. මහතාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. තෝරා ගනු ලැබුවහොත් අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු මුදා හරිනු ලැබේ.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා.

දිනය :————.

### (III වැනි කොටස)

———— දෙපාර්තමේන්තුවේ ————(පදවි නාමය) ———— (නම) මහතාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. තෝරාගනු ලැබුවහොත් අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු මුදාහරිනු ලැබේ.

———— මහතා/මහත්මිය මෙම පුහුණුවීමේ පාඨමාලාවට සහභාගිවූව හොත් ඔහුගේ/ඇගේ පුහුණුව මැනවින් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිලධාරි තැන දිවයිනට පැමිණි පසු පහත සඳහන් වගකීම් ඔහුට/ඇයට භාරදෙනු ඇත.

මෙම අතිරේක වගකීම් සඳහා පුහුණුවීමේ වැඩ සටහනෙහි පහත සඳහන් විෂයයන්/අංශයන්/ලක්ෂණයන් ———— මහතාට සුදුසුයැයි මම අදහස් කරමි.

————
ස්ථිර ලේකම්,
———— අමාත්‍යාංශය.

දිනය :————.

9–395/2—69.9.12 වැනි දින අංක 14,871 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය—කටුබැද්ද, මොරටුව

### සටහන් ඇඳීම පිළිබඳ 1 ශ්‍රේණියේ උපදේශක තනතුර

මොරටුවේ, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ සටහන් ඇඳීම පිළිබඳ උපදේශක තනතුර සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ අයදුම් පත් 1969.9.30 දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. **සුදුසුකම්.**—මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරු වෙකුම පහත දක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(I) 1969.9.30 වැනි දිනට වයස අවුරුදු 25ට නො අඩු අවුරුදු 40ට නො වැඩි බව (දනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාල නොවේ.)

(II) විශිෂ්ඨ චරිතයක් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව;

(III) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්; හෝ
(ආ) දෙකකට නො වැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ
(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුයි. සහ

(IV) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යා උපාධියේ 1 වැනි කොටස සමග අවුරුදු 8ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්දක්; හෝ

(V) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සිවිල් ඉංජිනේරු සහතිකය සමග අවුරුදු 10ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්දක්; හෝ

(VI) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නිර්මාණ විද්‍යාව පිළිබඳ සන්ධ්‍යා සහතිකය සමග අවුරුදු 12 ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්දක්;

හෝ

(VII) සමාන හෝ උසස් සුදුසුකම්; හා

(VIII) සිංහලයෙන් ඉගැන්වීමේ හැකියාවක් තිබිය යුතුය. නැතහොත් පත්වීම ලැබී අවුරුදු 3ක් ඇතුළත සිංහලෙන් ඉගැන්වීමේ හැකි යාවක් ලබා ගත යුතු ය.

4. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය, රු. 3,900—180 × 9—360 × 8—8,400 වේ.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාර ගනු නො ලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී, ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු ලැබේ.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතු ය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුළත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාර ගත නො හැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තිය සහතික;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්;

**සැළකිය යුතුයි :**

දනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීමට නුවුවමනා ය.

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදල ලියකියවිලි මොරටුවේ, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ගෙවුනු කල පිළිතුරක් නොලදහොත් විහාම ඒ බැව් ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

ඇල්. එච්. සුමණදස,
අධ්‍යක්ෂ,
ලංකා උසස් කාර්මික විද්‍යායතනය.

1969 සැප්තැම්බර් මස 4 වෙනි දින,
මොරටුව, කටුබැද්දේ
ලංකා උසස් කාර්මික විද්‍යායතනයේදිය.

## ඉල්ලුම් පත්‍රය

### ලංකා උසස් කාර්මික විද්‍යායතනය, කටුබැද්ද, මොරටුව

### සටහන් ඇඳීම පිළිබඳ I වැනි ශ්‍රේණියේ උපදේශක තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න): ————.
2. තැපැල් ලිපිනය (ලිපිනය වෙනස්වූ වහාම ඒ බව දන්වා එවිය යුතුය) : ————.
3. ජාතිය : (ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද (ආ) ලියා පදිංචි වීමෙන්ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියෙකු වන්නේ ලියා පදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳසුම් අංකයත් සඳහන් කරන්න) : ————.
4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස : —— අවුරුදු———මාස————දිනය————
   (ආ) උපන් දිනය : ————අවුරුද්ද : ————මාසය : ———— දිනය : ———— (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)
5. උපන් ස්ථානය : (අ) අයදුම්කරු : ———— (ආ) ඔහුගේ/ඇගේ පියා : (ඇ) අයදුම්කරුගේ සීයා : ———— (ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා : ————.
6. (අ) විවාහකද? අවිවාහකද? වැන්දඹු ද? : ————
   (අ) විවාහක නම්, (i) විවාහ වූ දිනය : (ii) ළමයි ගණන : ————
7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන: —

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය ලබා ඇත්නම් | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

   (ආ) අන්තිමට ඉගෙනගත් පාසැලෙන් අස්වූ දිනය : ————.
8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත්වූ විභාගය, දිනයන් සමග : —
   (අ) සිංහල : ————.
   (ආ) ඉංග්‍රීසි : ————.
   (ඇ) දෙමළ : ————.
9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින, හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————
10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවන් තිබේද? : ————.
   (අ) සිංහල : ————.
   (ආ) ඉංග්‍රීසි : ————.
   (ඇ) දෙමළ : ————.
11. විශේෂ සුදුසුකම් (නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානුව සහිතව සඳහන් කරන්න) : ————.
12. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය, හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න ————.
13. මුදල් කරදරවලින් නිදහස්ද? නො එසේ නම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද ? : ————.
14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) : ————.
15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටි නම් මේ අවශ්‍ය නැත) : ————.
16. සේවාමුක්ත හටයෙක් නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර : ————.
17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකි රක්ෂා : ————.
   (i) දරණ ලද තනතුර : ————.
   (ii) නියුක්තව සිටි දින වකවානුව :————.
   (iii) අස්වීමට හේතුව : ————.
   (ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න : ——
18. දැනට යෙදී සිටින රක්ෂාව : —
   (i) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය : ————.
   (ii) විශ්‍රාම වැටුප් සහිතද? තාවකාලික හෝ අනියම්ද ?: ————.
   (iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හ වැටුප් ක්‍රමය :————.
   (iv) මීලඟ වැටුප් වැඩිවීමේ දිනය : ————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කර්න ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරනය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

දිනය : ————.

......................................
අයදුම්කරුගේ අත්සන.

9–408—69.9.12 දින අංක 14,871 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය

### පුස්තකාලයාධිපති තනතුර

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ පුස්තකාලයාධිපති තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව, පිළියෙල වූ අයදුම්පත් 1969.10.8 දිනට හෝ ඊට පෙර කොළඹ 2, යූනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. සේවය නියුක්ත කරවීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත්වේ.

3. අවශ්‍ය සුදුසුකම්.—මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1969.10.8 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු, අවුරුදු 35 ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත)

(ii) විශිෂ්ය චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) සිංහල භාෂාව, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, කෘෂිකර්මය හෝ ජීව විද්‍යාව යන විෂයයන්ගෙන් හතරකින් සම්මාන සාමාර්ථය ද, ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම්.

සටහන.—ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාලයාධිපති පළමුවැනි විභාගයෙන් සමත්වූ අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—(අ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථ යන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(i) ඔහුගේ ආධුනික කාලය අවුරුදු තුනක් විය යුතුය.

(ii) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නා වූත්, හෝ මතුවට පනවනු ලැබිය හැකිවූ හෝ යම් නීති රීතිවලට සහ ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

(iii) ඔහුගේ ආධුනික කාලය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික කාලය අවසානයේ පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර පත්වීමේ දිනයේ සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත I වැනි ශ්‍රේණියේ II වැනි ශ්‍රේණියේ සහ III වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන් (නැතහොත් අදාල වන අවස්ථාවල අවුරුද්දක් සහ අවුරුදු 2 ක් ඇතුළත I වැනි සහ II වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන්) සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවක් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුව හොත්, එය ඔහුගේ වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතුවේ. නියමිත කාලයෙන් පසු තවත් සමසක් ගතවන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවුවහොත්, වැටුප් වැඩිවීම අත්හිටුවීම, වැටුප් වැඩිවීම නතර කිරීමට පරිවර්තනය කර පරීක්ෂණය සමත් වන තෙක් හෝ මෙහි පහත (v) වැනි අංකය යටතේ ඇති විධිවිධාන අදල වන කාලය වන තෙක් හෝ ඒවා නතර කිරීම ක්‍රියාත්මකවනු ඇත.

(v) ආධුනික කාලය අවසාන වන විට, නියමිත සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගතහොත්, අංක 120 සහ 121 යන පරිපාලන රෙගුලාසි වල විධිවිධාන අදල වනු ඇත. (ඉහත සඳහන් (iii), (iv) සහ (v) යන කොන්දේසි සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවාගනු ලැබූවන්ට අදල නොවේ.)

(vi) කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා විසින් නියම කරන ආකාරයකින් ඇපයක් තැබිය යුතුය.

5. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 960—72 × 24—රු. 2,688 වේ. රු. 1,608 ට සහ 2,184 යන වාර්ෂික වැටුප් පියවරවලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

6. සෑම අයදුම්කරුවෙකු විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුනා එවිය යුතුය. :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ඉල්ලුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) මෙම තනතුර සඳහා ඉල්ලුම්කරුගේ චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික 2 ක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් මෙම උප ඡෙදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත්කොට නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් එම දෙපාර්ත මේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට කලින් ලැබී එහි ප්‍රමාදවී නම් ඊට හේතුව වශයෙන් පිළිගත හැකි කරුණු දක්වා එය භාරගන්නා ලෙස එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළොත් මිස භාරගනු නොලැබේ.

8. මෙම තනතුර සඳහා එවන ඉල්ලුම් පත්‍රද, ඒ සම්බන්ධ එවන ලියුම් ආදියද එවිය යුත්තේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 සැප්තැම්බර් මස 4 වෙනි දින,
කොළඹ 2, යූනියන් පෙදෙසේ,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ දී ය.

## කෘෂිකර්ම හා ආහාර අමාත්‍යංශයේ පුස්තකාලයාධිපති තනතුර පිළිබඳ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.

4. 1969 ඔක්තෝබර් මස 8 වැනි දිනට නියම වයස :——
අවුරුදු :——, මාස :——, දින :——.

5. ජාතිය :————.

6. ලබාගත් දිනත් සමග අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

7. වෘත්තීය සුදුසුකම් :————.

8. ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාල (ඇතුළත්වූ දින හා අස්වූ දින සඳහන් කරන්න) :————.

9. පුස්තකාල වැඩ පිළිබඳ පළපුරුද්ද :————.

10. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් සහ නිලතල :
————.

11. වෙනත් සුදුසුකම් :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍යයක් හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත්, මා නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා පත් කිරීමෙන් පසු මේ බව දැනගන්නට ලැබුනොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහ කරනු ලැබීමට යටත් බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9–401—69.9.12 දින අංක 14,871 දරණ ගැසට් පත්‍රය

---

අංකය විආ/2/197.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970 ජපන් රජයේ ශිෂ්‍යත්ව

පහත සඳහන් විෂයයන්හි අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා ජපන් රජය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

ඉංජිනේරු විද්‍යාව
කෘෂිකර්මය
ධීවර කර්මාන්තය
වෛද්‍ය විද්‍යාව
දන්ත වෛද්‍ය විද්‍යාව
ආර්ථික විද්‍යාව

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**— ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් 1970 අප්‍රේල් මස සිට වර්ෂ දෙකක් හෝ 1970 ඔක්තෝබර් මස සිට වර්ෂ එකහමාරක් වන්නේය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ජපන් බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථා වකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1970.4.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි. (එනම් 1935.4.2 වැනි දින හෝ එදිනට පසු උපන් අය විය යුතුයි.)

(iii) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන පශ්චාත් උපාධි පාඨමාලා වට උචිත වනසේ (පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබා ගත්) දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුය. (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම් පත් භාර ගනු නොලැබේ.)

(iv) ජපන් භාෂාව ඉගෙනීමට කැමති විය යුතුය. (ඉගැන්වීමේ මාධ්‍යය ජපන් භාෂාව වන හෙයිනි.)

**සංලක්ෂ්‍යය 1.**— රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.4.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේය.

**සංලක්ෂ්‍යය 2**—. එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේය. එසේ අස්වීමට කැමති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත්ය :—

(අ) ලංකාවේ සිට ජපානයට යාම සහ ආපසු පැමිණීම සඳහා සංචාරක පන්තියේ ගුවන් ගමන් පහසුකම්.

(ආ) මසකට යෙන් 33,000 බැගින් යැපීම් දීමනාවක්.

(ඉ) ජපානයට ගොඩ බැසීමේදී අවශ්‍ය හදිසි වියදම් සඳහා යෙන් 15,000 කට අඩු දීමනාවක්.

(ඊ) ඉගෙනීම පිළිබඳ ජපානය ඇතුළත ගමන් වියදම් සඳහා වර්ෂයකට යෙන් 25,000 ක පමණ දීමනාවක්.

(උ) ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු ආදියෙන් නිදහස් කිරීම.

(ඌ) නේවාසික පහසුකම්.

**සංලක්ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් ව සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ජපානය බලා පිටත්ව යාමට පෙර :—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමටද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම් ලංකා රජයට ආපසු ගෙවීමටද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ජපානයේ අධ්‍යයන පාඨ මාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරණ තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන් ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයෙකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දම කින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකරන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1969.9.26 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේය. අයදුම් පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන් කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයන් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයන් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාවය සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 සැප්තැම්බර් මස 5 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

9–429—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යාන්ත්‍රික අංශය

### මිකැනික්වරු, යන්ත්‍ර ශිල්පීන් ආදීන්ගේ තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, රත්මලානේ, යාන්ත්‍රික අංශයේ පහත සඳහන් තනතුරු පුරවීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව සකස් කරගත් ඉල්ලුම් පත්‍ර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රත්මලානේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත 1969.10.5 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

2. **ඉහත සඳහන් කරන ලද තනතුරු.**—

| | | |
|---|---|---|
| (i) මැකැනික්වරු | — | I සහ II පංති |
| (ii) යන්ත්‍ර ශිල්පීන් | — | I සහ II පංති |
| (iii) බෙලෙක් වැඩකරුවන් | — | I සහ II පංති |
| (iv) පැස්සුම්කරුවන් | — | I සහ II පංති |
| (v) කම්හල්කරුවන් | — | II පංතිය |
| (vi) රබර් පැස්සුම්කරුවන් | — | II පංතිය |

3. **වැටුප් පරිමාණයන්.**—

I පංතිය—වර්ෂයකට රු. 1,170—42—1,674.
II පංතිය—වර්ෂයකට රු. 750—42—1,296.

රජයේ නීතිරීති අනුව ජීවනාධාර, විශේෂ ජීවනාධාර හා ගෙවල් කුලී දීමනාද ගෙවනු ඇත.

4. **සේවයෙහි යෙදවීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය, තෝරාගත් අයදුම්කරුවන්ට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට සිදුවනු ඇත.

5. **සේවා කොන්දේසි.**—තෝරාගත් අයදුම්කරුවන් තුන් අවුරුදු කාලසීමාවක් ආධුනික තත්ත්වයේ තබනු ලැබේ. ඔවුහු දිවයිනේ නියම් කරනු ලබන ඕනෑම පෙදෙසක සේවය කිරීමට සූදානම් විය යුතුය.

6. **අවශ්‍ය සුදුසුකම්.**—(i) වයස අවුරුදු 21ට වැඩි විය යුතුය.

(ii) I පංතියේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට ඉල්ලුම් කෙරෙන වෘත්තියෙහි අවුරුදු 10කට නොඅඩු සේවයක් තිබිය යුතුය. මින් අඩු වශයෙන් අවුරුදු 6ක් වත් I වන පංතියෙහි වෘත්තිකයෙකු වශයෙන් සේවය කොට තිබීම අවශ්‍ය වෙයි.

(iii) පිළිගත් ආයතනයක, තමන් ඉල්ලුම් කරන වෘත්තියෙහි පස් අවුරුද්දකට නොඅඩු සේවයක් ඇති අයදුම්කරුවන්ට II පංතියේ තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකිය.

(iv) අයදුම්කරුවන්ට කියවීමට, ලිවීමට හා කෘති සටහන් තේරුම් ගැනීමට හැකියාවක් තිබිය යුතුය.

(v) තමන් ඉල්ලුම් කරන වෘත්තියට අයත් උපකරණ හා ආවුද පාවිච්චි කිරීම ගැන හොඳ දැනුමක් තිබිය යුතුය.

(vi) වෘත්තීය පරීක්ෂණයකින් සමත්වීමට පිළිවන්කම තිබිය යුතුය.

7. සෑම ඉල්ලුම්කරුවෙකුම පහත දැක්වෙන සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පතට ඇමිණිය යුතු වෙයි:—

(i) උප්පැන්න සහතිකය,

(ii) මෑතදී ලබාගත් චරිත සහතිකය,

(iii) ඉහත 6 (i) සිට (v) ඡේදයෙහි විස්තර වූ කරුණු සම්බන්ධයෙන් ඇති පළපුරුද්ද තහවුරු කෙරෙන සහතික තුනක්.

8. අයදුම්කරුවන්ට කිසිදු ගමන් වියදමක් ගෙවීම හෝ ඔවුන්ගේ අයදුම්පත් ලද බව දැන්වීමක් හෝ නොකරනු ලැබේ.

9. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂෙප කරනු ඇත.

10. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) ඡේදයේ ආරම්භයේ පළවන රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් පිළිබඳ සාමාන්‍ය කොන්දේසි බලන්න.

එස්. මුදලිගේ,
වැඩබලන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු.

යාන්ත්‍රික අංශය,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
රත්මලාන,
1969 අගෝස්තු මස 29 වැනි දින.

### ආදර්ශ ආකෘතිය

1. ඉල්ලුම් කෙරෙන වෘත්තිය සහ පංතිය :————.
2. සම්පූර්ණ නම පැහැදිලිව :————.
3. පුද්ගලික ලිපිනය :————.
4. වයස සහ උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපත ඇමිණිය යුතුයි)
5. පළපුරුද්ද පිළිබඳ විස්තර :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුය)
6. වෙනත් සුදුසුකම් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–310—69.9.12 දින අංක 14,871 දරණ ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ:—

**සහකාර ගොඩනැගිලි ඉංජිනේරු තනතුරු**

අවශ්‍ය සුදුසුකම්.—පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ බී. ඇස්. සී. උපාධිය හෝ කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි කාර්මික විද්‍යායතනයේ සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ කාර්මික නිලධාරී සහතිකය සමග, සුදුසුකම් ලැබීමෙන් පසුව ගොඩනැගිලි වැඩ කටයුතු පිළිබඳව යටත් පිරිසෙයින් 10 වසරක පළපුරුද්දක් තිබිය යුතු ය.

වයස.—1969.9.19 වැනි දිනට අවුරුදු 35ට වැඩි නොවිය යුතු ය.

වැටුප් තිණ.—මසකට රු. 800—රු. 40 × 5—රු. 50 × 5—රු. 1,250 (සියල්ල ඇතුලුව)

තෝරාගත් අයදුම්කරුවන්, ස්වකීය වැටුප් තිණේ රු. 1,000/-හේ (සියල්ල ඇතුලත්) වැටුප් පියවර ඉක්මවා වැටුප් වැඩිවීම ලැබීමට සුදුසුවීම සඳහා සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ආයතනයේ ආශ්‍රිත සාමාජික (ඒ. ඇම්. අයි. සී. ඊ.) විභාගය හෝ නිර්මාන ඉංජිනේරු ශිල්පය පිළිබඳ ආයතනයේ ආශ්‍රිත සාමාජික (ඒ. ඇම්. අයි. එස්. ඊ.) විභාගය සමත්විය යුතු ය. දැනටමත් මෙකී සුදුසුකම් ඇති අය මෙම වැටුප් තිණ උඩ කිසියම් සුදුසු පියවරක තැබීමට සුදුස්සන් වනු ඇත.

මෙකී තනතුර සම්බන්ධයෙන් වූ අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගෙන් සියයට 10ක් සහ සේව්‍යයාගෙන් සියයට 15ක් ගෙවිය යුතු වන්නේ ය.

රජයේ සේවකයින්ගේ සහ රජයේ සංස්ථාවල සේවකයින්ගේ ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානින් මගින් එවිය යුතු අතර, ඒවා සලකා බලනු ලබන්නේ තෝරාගනු ලබන අයදුම්කරු නිදහස් කිරීමට එකී දෙපාර්තමේන්තු ප්‍රධානියා එකහවන්නේ නම් පමණි.

පහත දැක්වෙන පෝර්මයට අනුකූලවන සේ පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969.9.19 වැනිදින හෝ ඊට පෙර කොළඹ 2, වැක්ෂෝල් වීදියේ අංක 21 දරන තැන සතොස සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත ලැබෙන සේ එවිය යුතු ය.

සේවක මණ්ඩල කළමනාකරු.

සතොස මූලස්ථානය,
අංක 21, වැක්ෂෝල් වීදිය,
කොළඹ 2.
1969.9.2.

### ආදර්ශ පෝර්මය

............................තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය.

1. නම සහ ලිපිනය :————.
2. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
3. ජාතිය :————.
4. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)
5. පළපුරුද්ද :————.
6. අයදුම්කරුගේ හැකියාව සහ චරිතය ගැන තොරතුරු අසා බැලියහැකි සැලකියයුතු තත්ත්වයන් දරණ පුද්ගලයන් දෙදෙනෙකුගේ නම සහ ලිපිනයන් :————.

මෙම ඉල්ලුම් පතෙහි මවිසින් සඳහන් කර ඇති කරුණු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි.

......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–405—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ආධුනික සැලසුම්කරු තනතුරු (තාවකාලික)

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුරු (තාවකාලික) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පළකොට ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කළ අයදුම්පත්, 1969 සැප්තැම්බර් මස 26 වැනි දින හෝ ඊට පෙර හෝ කොළඹ 7, තැ.පෙ. 1138, වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත ලැබිය යුතුයි. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

2. **වැටුප් සහ සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—ආධුනික සැලසුම් කරු තනතුර තාවකාලිකය. එම තනතුරට අදාල වැටුප් ක්‍රමය වසකට රු. 960—72 බැගින් 2—රු. 1,104 වේ. මෙම පත්වීම නිත්‍ය වශයෙන්ම තාවකාලික පදනමක් උඩ වන අතර රජයෙන් හෝ නිලධාරීන් විසින් හෝ එක් මසක දැන්වීමකින් පසු සේවය නතර කළ හැකිය.

සටහන.—කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික අභ්‍යාසායතනයේ හෝ රජය විසින් අනුමත කොට ඇති වෙනත් ඒ හා සමාන ආයතනයක හෝ සැලසුම් ශිල්පය පිළිබඳ පූර්ණ කාලීන පාඨමාලාව හෝ ගෘහනිර්මාණ ශිල්පීය තුන් අවුරුදු අර්ධ දිවාකාල පාඨමාලාව සේවයට බඳවා ගනු ලබන අවස්ථාවේදී සාර්ථක ලෙස සම්පූර්ණ කොට ඇති සැලසුම්කරුවන්ට වර්ෂයකට රු. 1,032ක් වූ වැටුප් පියවරෙහි තබනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම තමා—

(අ) ලාංකිකයෙකු බවටද, (පෙලපතින් හෝ ලියාපදිංචිවීමෙන් හෝ ලක්දිව පුරවැසියා ලාංකිකයෙකි).

(ආ) 1969 සැප්තැම්බර් මස 12 දිනදී වයස අවුරුදු 18 හා 30 අතර බවටද (අනෙකුත් සුදුසුකම් ඇත්නම් උපරිම වයස් සීමාව වාරිමාර්ග දෙපාර්තමේන්තුමය අයදුම්කරුවන් කෙරෙහි බලපානු නොලැබේ.)

(ඇ) ඉතා යහපත් චරිතයකින් යුක්ත බවටද ;

(ඈ) කටුබැද්දේ ප්‍රායෝගික කාර්මිකාභ්‍යාසායතනයේ හෝ රජය විසින් අනුමත කර ඇති වෙනත් ඒ හා සමාන ආයතනයක හෝ සැලසුම් ශිල්පය පිළිබඳ වූ පූර්ණ කාලීන පාඨමාලාව හෝ ගෘහනිර්මාණ ශිල්පීය තුන් අවුරුදු අර්ධ දිවාකාල පාඨමාලාව සම්පූර්ණ කර ඇති බවටද සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් සමග පහත දක්වා ඇති සහතික පත්වල පිටපත් (මුල් ලියවිලි නොවෙ) ඉදිරිපත් කළ යුතුය:—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා ශිල්පමය සුදුසුකම් පිළිබඳ සහතික ;

(ආ) උප්පැන්න සහතිකය (අධ්‍යාපනික අභිප්‍රායයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම සහතික භාරගනු නොලැබේ) ;

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක් (මෙයින් එකක් අයදුම් කරු අවසාන වශයෙන් උගත් පාසැලේ ප්‍රධානාචාර්‍යතුමාගෙන් විය යුතුය.) ;

**සැලකිය යුතුයි.**—මෙම සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

5. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සවකීය අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

6. අයදුම්කරුවන් සවකීය වියදමින්ම කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතුය.

7. අයදුම්පතේ දී ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරාගනු ලැබීමට ප්‍රථම සොයාගත හොත් අයදුම්කරු නුසුදුස්සකු කිරීමටද තෝරාගනු ලැබීමෙන් පසු සොයාගත හොත් සේවයෙන් පහ කිරීමටද සිදුවනු ඇත.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡෙදයේ ආරම්භයේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීමේදී අදාලවන පොදු කොන්දෙසිවලට මෙයින් අවධානය යොමු කරවමි.

9. 1969.5.9 දිනැති අංක 14,853 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයට පිළිතුරු වශයෙන් ඉල්ලුම් පත් එවූ අයදුම්කරුවන් අලුතෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් කළයුතු නොවේ.

10. 1969.9.12 දිනදී වයස අවුරුදු 18 හා 24 අතර වන, කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික අභ්‍යාසායතනයේ හෝ රජය විසින් අනුමත කොට ඇති වෙනත් ඒ හා සමාන ආයතනයක හෝ සැලසුම් ශිල්පය පිළිබඳ පූර්ණ කාලීය පාඨමාලාව සම්පූර්ණකොට ඇති අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවක සංඛ්‍යාවට ඇතුළත් කිරීම සලකා බලනු ලැබේ.

එස්. එම්. ආරුමුගම්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1969 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 7,
තැ. පෙ. 1138,
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

## ආධුනික සැලසුම්කරු තනතුරු සඳහා අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්)—
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනිකුත් නම් :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. (අ) අයදුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
   (ආ) මොවුන් උපන් ස්ථානය—
   (i) අයදුම්කරුගේ පියා :————.
   (ii) අයදුම්කරුගේ පිය පක්ෂයේ සීයා :————.
   (iii) අයදුම්කරුගේ පිය පක්ෂයේ සීයාගේ පියා :————.
   (අයදුම්කරු ලක්දිවහි ඉපදිනි නම් (ආ) (i) හෝ (ii) සහ (iii) පිරවිය යුතුය. අයදුම්කරු ඉපදුනේ ලක්දිවහි නොවේ නම් (ආ) (i) හා (ii) හෝ (iii) පිරවිය යුතුය).
5. ලබාගත් අධ්‍යාපනික සුදුසුකම්—පරීක්ෂණයේ වසර සහ මාසයද සමත්වි ඇති විෂයයන් හා එක් එක් විෂයයෙන් ලත් තත්ත්වය සඳහන් කළ යුතුය) :————.
6. ලබාගත් ශිල්පමය සුදුසුකම් :————.
7. අයදුම්කරු විවාහක හෝ අවිවාහක බව :————.
8. පාසැලෙන් අස්වූ පසු කරන ලද රැකියාවන් :————.
9. දැනට තනතුරක් දරන්නේ නම් එය :————.
10. අමුණා ඇති චරිත සහතික කාගෙන්ද :————.

මේ අයදුම්පතේ මවිසින් සපයා ඇති විස්තර අව්‍යාජ බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.
දිනය :————.

9–317—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### පෝර්මන් මැනේජර් තනතුර

රාජ්‍ය දැව සංස්ථාවේ ඉහත සඳහන් තනතුර සඳහා නියමිත සුදුසුකම් ඇති ලාංකික අයදුම් කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම්.**—(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙවර වකට නොවැඩි වාර ගණනකදී භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව ඇතුළුව විෂයයන් 6 කින් පොදු අධ්‍යයන සහතිකය ; සහ

රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක, විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පයේ අවුරුදු දෙකකට නොඅඩු ආධුනිකත්වයක් සතුටුදයක ලෙස අවසන් කිරීම, සහිතව ;

ලංකා කාර්මික විද්‍යාලයයේ හෝ අම්පාරේ හාර්ඩි කාර්මික අභ්‍යාස ආයතනයේ විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු II ශ්‍රේණියේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය ; හෝ

(ආ) කනිෂ්ඨ පාඨශාලා සහතිකය සමග රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු වෘත්තීය පිළිබඳ අවුරුදු 10 කට නොඅඩු පලපුරුද්දක් තිබීම. යටත් පිරිසෙයින් ඉන් අවුරුදු 5ක් වත් පරිපාලන සේවයේ විය යුතුය.

**වයස් සීමාව.**—1969.9.22 දිනට වයස අවුරුදු 40 ට අඩු නොවිය යුතුය.

**වැටුප් ක්‍රමය.**—මසකට රු. 500—30 × 10—80=රු.800 කි. (සියළු දීමනා ඇතුළුව)

**සාමාන්‍ය.**—තෝරාගනු ලබන අයදුම්කරු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

2. පත්වීම අවුරුදු 3ක කාලයකට ආධුනික තත්ත්වයේ පවතිනු ඇති අතර තෝරා ගනු ලබන අයදුම්කරු වැටුපෙන් සියයට පහක් සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුවේ. සංස්ථාව විසින් සියයට දහයක් ගෙවනු ලැබේ.

3. රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක දැනටමත් සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම් පත් තම දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

4. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරගත් අයදුම් පත් 1969 සැප්තැම්බර් මස 22 දිනට හෝ ඊට පෙර කොළඹ 4, අශෝක උයනේ, අංක 30 දරණ ස්ථානයෙහි, රාජ්‍ය දැව සංස්ථාවේ සේවක කළමනාකාර තැනට ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

5. මෙම දැන්වීමේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. අයදුම් පත් ලැබුන බව දන්වනු නොලැබේ.

සේවක කළමනාකාර,
රාජ්‍ය දැව සංස්ථාව.

30, අශෝක උයන,
කොළඹ 4,
1969.8.31.

## අයදුම් පත් ආකෘතිය

### රාජ්‍ය දැව සංස්ථාව—පෝර්මන් මැනේජර් තනතුර

1. සම්පූර්ණ නම :————.
   (පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. (I) උපන් දිනය :————.
   (II) 1969.9.22 දිනට වයස :—
   අවුරුදු :————. මාස :————. දින :————.
4. අධ්‍යාපන සුදුසුකම් ————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුය)
5. කාර්මික/වෘත්තීය සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුය)
6. පලපුරුද්ද :————.
7. පාසැල හැරයාමෙන් පසු කළ රැකියාවන් :————.
8. දැනට කරන රක්ෂාව :————.
9. විශේෂ හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.
10. ඔබ ගැන විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :—
    (I) :————. (II) :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති සියලු විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–404—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව—යාපනය

### යාපනය කණිෂ්ඨ කාර්මික ආයතනයේ බාහිර උපදේශක තනතුරු—1969/70

යාපනය, කණිෂ්ඨ කාර්මික ආයතනයේ බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර යාපනය කණිෂ්ඨ කාර්මික ආයතනයේ විදුහල්පති වෙත 1969 සැප්තැම්බර් මස 24 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ යැවිය යුතුය. (අයදුම්පත් යාපනය ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත නොඑවිය යුතු අතර එවැනි අයදුම්පත් ගැන මෙම දෙපාර්තමේන්තුව කිසිදු වගකීමක් භාර නොගන්නා බව විශේෂයෙන් සැලකුව මැනවි). අපේක්ෂකයින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය, කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

2. යාපනය කණිෂ්ඨ කාර්මික ආයතනයේ ඇති බාහිර උපදේශක ඇබෑර්තු අදාළ විෂයයන් මෙහි පහත සඳහන් වේ :—

| | | |
|---|---|---|
| 1. | ඉංග්‍රීසි භාෂාව | ඉංග්‍රීසි මාධ්‍යය |
| 2. | උසස් මාණක විද්‍යාව | |
| 3. | භෞතික විද්‍යාව | |
| 4. | තාප යන්ත්‍ර | |
| 5. | විදුලි කාර්මික විද්‍යාව | |
| 6. | ජ්‍යාමිතික ඇඳීම | |
| 7. | කර්මාන්තශාලා පිරිවැය මිළ | |
| 8. | දෙමළ භාෂාව | දෙමළ මාධ්‍යය |
| 9. | ජලනල සවි කිරීම | |
| 10. | සවි කිරීම | |
| 11. | වාණිජ අංක ගණිතය | ඉංග්‍රීසි සහ/හෝ දෙමළ මාධ්‍යය |
| 12. | පොත් තැබීම | |
| 13. | වාණිජ්‍යය | |
| 14. | වාණිජ භූගෝලය | |
| 15. | ලඝුලේඛනය හා යතුරු ලියනය | |
| 16. | ගොඩනැගිලිවල පරිමාණ | |
| 17. | සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව | |
| 18. | මැනීම සහ මට්ටම් කිරීම | ඉංග්‍රීසි සහ/හෝ දෙමළ මාධ්‍යය |
| 19. | ගණිතය | |
| 20. | ව්‍යවහාරික යාන්ත්‍රික විද්‍යාව | |
| 21. | ද්‍රව්‍ය හා ව්‍යුහ | |

3. බාහිර උපදේශකවරුනට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා උගන්වන පංතිය අනුව පැයකට රුපියල් 5 සිට රු. 15 දක්වා වෙනස් වනවා ඇත.

4. මෙම තනතුර අවුරුද්දේ ඔක්තෝබර් මස පටන්ගෙන ඊළඟ අවුරුද්දේ අගෝස්තු මස අවසන් වේ. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුවද අවසන් කෙරෙනු ඇත.

5. පංති පැවැත්වෙනුයේ උදේ 8.30 සිට සවස 4.30 දක්වා සහ සවස 5.00 සිට රාත්‍රි 7.00 දක්වාද හෙයින් මේ කාලය ඇතුළත උගැන්වීමට හැකි අයගෙන් පමණක් ලැබෙන ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාල වේලා ඉල්ලුම් පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුය.

6. බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂණයන් නොයොදවන වර්ෂ අවසාන පරීක්ෂණයන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පන්තිවල ශිෂ්‍යයන් පරීක්ෂා කළ යුතුය.

7. රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට පෙර යාපනය කණිෂ්ඨ කාර්මික විදුහල්පති වෙත නොලැබුණහොත්, එවා ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂෙප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානින්ට ඒවා කලට වේලාවට ලැබී, පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාද වුවහොත් පමණි.

8. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදළ විෂයය පැහැදිලිව දැක්වීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව සැලකුව මැනවි.

එස්. තණිකාසලම්,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, යාපනය.

1969 සැප්තැම්බර් මස 4 වැනි දින,
යාපනය, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

9–397—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## කාර්මික සංවර්ධන මණ්ඩලය

### මාණ්ඩලික ඇබෑර්තු

මාණ්ඩලික තනතුරු වෙනුවෙන් 1969 අගෝස්තු මස 29 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතුය.

සියළුම මාණ්ඩලික තනතුරු සඳහා විදේශික අයදුම්කරුවන්ගේ අයදුම්පත් බාරගන්නා අන්තිම දිනය 1969 සැප්තැම්බර් 30 වෙනි දින වේ.

විධායක සහකාර තනතුරුවලට හැර, අනිකුත් තනතුරු සඳහා දේශීය අයදුම්කරුවන්ගේ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 1969 සැප්තැම්බර් 15 වෙනි දින වේ.

**උපාධිධාරී ආධුනිකයින් —**

විද්‍යාව, අර්ථ ශාස්ත්‍රය, සමාජ විද්‍යාව, වානිජ විද්‍යාව, ඉන්ජිනේරු විද්‍යාව හෝ නීතිය පිළිබඳ පන්තියක් සහිත උපාධිධාරීන්.

**වැටුප් පරිමාණය.**—උපාධිධාරී ආධුනිකයින්ට පළමුවන වර්ෂ දෙක තුල මසකට සියළු දීමනා ඇතුළුව රු. 500 බැගින් ගෙවනු ලබන අතර ඉන්පසු මසකට සියළු දීමනා ඇතුළුව රු. 600—40—රු. 1,000 වැටුප් ක්‍රමයේ තබා වැටුප් ගෙවීම අරඹනු ලැබේ.

**විධායක සහකාරවරුන්—**

කාර්මික පරිපාලනය, ආර්ථික පර්යේෂණ, වානිජ විද්‍යාව, පරිපාලන සංවර්ධනය හෝ සංඛ්‍යා ලේඛන විමර්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිධර පළපුරුද්දක් ඇති උපාධිධාරීන් විය යුතුය.

**වැටුප් පරිමාණය.**—මසකට සියළු දීමනා අඩංගුව රු. 600—40—රු. 1,000 වේ. විශේෂ අධ්‍යයන විශිෂ්ඨතා හෝ විශේෂ පළපුරුදුකම් ඇති අය අදාල වැටුප් ක්‍රමයේ යෝග්‍ය වැටුප් තලයක තැබීම සඳහා සලකා බලනු ඇත. මෙම තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අන්තිම දිනය 1969 සැප්තැම්බර් මස 30 වෙනි දින වේ.

සභාපති,
කාර්මික සංවර්ධන මණ්ඩලය.

අංක 16, ග්‍රෙගරි පාර,
කොළඹ 7.

9–251—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ ලැඟුන්දෙනිය කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩ පළාත කොට්ඨාශයේ විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

ලැගුන්දෙනිය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදළ නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කායර්‍යාලයේ සහ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාල, ග්‍රාමසේවක කායර්‍යාල, පළාත් පාලන ආයතන කායර්‍යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායර්‍යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායර්‍යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කායර්‍යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 ඔක්තෝබර් මස 15 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
දිස්ත්‍රික් ලේකම්.

1969 අගෝස්තු මස 31 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කායර්‍යාලයේ දීය.

9–385—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

## විශ්ව විද්‍යාලයීය සාමාන්‍ය ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී/ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධිය සඳහාද, ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ ඩිප්ලෝමා සහතිකය සඳහාද ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු—1969

පේරාදෙනිය ලංකා විශ්ව විද්‍යාලයේ හෝ කොළඹ ලංකා විශ්ව විද්‍යාලයේ හෝ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ හෝ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ හෝ සාමාන්‍ය ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී/ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධිය සඳහාද, ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ ඩිපලෝමා සහතිකය සඳහාද අභ්‍යන්තර පාඨමාලා අනුගමනය කිරීම පිණිස 1969 වර්ෂයේ ඇතුළත් කර ගැනීමට තෝරා ගෙන තිබෙන්නාවූ පහත සඳහන් සුදුසුකම් තිබෙන ගුරුවරුන්ගෙන් අධ්‍යයන නිවාඩු සඳහා අයදුම් පත්‍ර භාරගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම් පත්‍ර පහත දැක්වෙන ආකෘතිය අනුව සකස්කර, 1969 සැප්තැම්බර් මස 22 වැනි දින හෝ ඊට පෙර පාඨශාලා ප්‍රධානියා මගින් ලියාපදිංචිකළ තැපෑලෙන් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස් කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ඉල්ලුම් පත්‍රය ඇතුළත් ලියුම් කවරය මත ''අධ්‍යයන නිවාඩු ඉල්ලීම'' යන වචන පැහැදිලිව ලිවිය යුතුය.

2. 1969 වර්ෂය සඳහා අභ්‍යන්තර පාඨමාලා අනුගමනය කිරීම පිණිස ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු අනුමත කරනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇත්නම් පමණි:—

(අ) 1969.10.1 වැනි දින වන විට වයස අවුරුදු 45ට අඩු විය යුතුයි.

(ආ) අ. පො. ස. ප. (උසස් පෙළ) විභාගයේදී යටත්පිරිසෙයින් පහත සඳහන් විෂයයන් දෙකකින් සමත්ව එම විෂයයන් දෙක උපාධිය සඳහා හැදෑරිය යුතුයි.

රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භූගෝල විද්‍යාව, ඉංග්‍රීසි.

එසේ නොමැතිනම්, විශ්ව විද්‍යාලයීය ප්‍රථම යෝග්‍යතා පරීක්ෂණයේදී හෝ මධ්‍ය පරීක්ෂණයේදී යටත්පිරිසෙයින් පහත සඳහන් විෂයයන් එකකින් සමත්ව එම විෂයය උපාධිය සඳහා හැදෑරිය යුතුයි.

රාසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, ඉංග්‍රීසි.

සැ.යු .— ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධි හා වාණිජ ඩිප්ලෝමා සහතිකය සඳහා ඉදිරිපත්වන අපේක්ෂකයන්ට ඉහත 2(ආ) ඡේදය අදාළ නොවේ.

පහත සඳහන් තැනැත්තන්ට නිවාඩු දෙනු නොලැබේ :—

(අ) ශිෂ්‍ය ගුරුවරු,

(ආ) 1969.10.1 වැනි දිනට යටත්පිරිසෙයින් අවුරුද්දක්වත් සේවයක් නොමැති ගුරුවරු (මේ සඳහා ශිෂ්‍ය ගුරු සේවය ගණන් ගනු නො ලැබේ.)

(ඉ) කිසියම් විනයානුකූල පරීක්ෂණයකට භාජන වී පරීක්ෂණ කටයුතු අවසාන නොවී සිටින ගුරුවරු.

(ඊ) විශ්ව විද්‍යාලයන්හි හෝ/කාර්මික විද්‍යාලයේ බාහිර පාඨමාලා හැදෑරීමට පමණක් ලේඛ්‍යාරූඪ වූ ගුරුවරු.

(උ) අධ්‍යයන වර්ෂය මුලදී විශ්ව විද්‍යාලයන්හි අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස තෝරා නොගත් ගුරුවරු.

(ඌ) ගෞරව ශාස්ත්‍රවේදී හෝ පශ්චාත් උපාධි හෝ සඳහා පාඨමාලා හදාරණ ගුරුවරු (අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ ශාස්ත්‍රපති (අධ්‍යාපන විද්‍යාව) මේ තහනමට අදල නොවේ.)

(එ) ඇපකරයකට බැඳී සිටින ගුරුවරු (ගුරු පුහුණුව සඳහා අට අවුරුදු ඇපකරයකට ඇතුළත්වූද, පුහුණුවීමේ වියදම රු. 10,000ට වැඩි නොවූද, ගුරුවරු අධ්‍යයන නිවාඩු සඳහා පස් අවුරුදු බැඳුම් කරයකට ඇතුළත් වූවාක් සේ සලකනු ලැබෙත්. ඒ අනුව, දැනට අට අවුරුදු ඇපකරයකට ඇතුළත් වී ඇති, එහෙත් අවුරුදු පහක් සම්පූර්ණකර නැති ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු දෙනු නොලැබේ.)

ඩී. ජී. දයාරත්න,
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අංකය : සාප/17/250
1969 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී.

### *සාමාන්‍ය ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී/ශාස්ත්‍රපති (අධ්‍යාපන)/වාණිජ ඩිප්ලෝමා සහතිකය සඳහා අධ්‍යයන නිවාඩු අයදුම් පත්‍රය

1. (අ) සම්පූර්ණ නම : ————.

(ආ) තනතුරු නාමය : ————.

(ඇ) ස්ත්‍රී පුරුෂ භාවය : ————.

(ඈ) දීමනා හැර දැනට ලබන වැටුප : ————.

(ඉ) වැටුප් ක්‍රමය : ————.

2. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි අංකයක් වේ නම් එය : ————

3. (අ) උපන් දිනය : ————.
(ආ) 69.10.1 දිනට වයස : ————.

4. පෞද්ගලික ලිපිනය : ————.

5. ගුරුවරයා සේවයේ නියුතු පාසැලේ නම සහ ලිපිනය : ————
(දිස්ත්‍රික්කය හඳුන්වන අක්ෂරය සමග)

6. අධ්‍යාපන සුදුසුකම් : ————.

7. (අ) 1969.10.1 දින දක්වා සම්පූර්ණ සේවා කාල පරිච්ඡේදය :—
අවුරුදු : ———— මාස : ————.

(ආ) 1969.10.1 දින දක්වා සේවා සටහන් :
(ශිෂ්‍ය ගුරු සේවා කාලය වෙනම සඳහන් කළ යුතුය.)

| | පැසැල | සිට | දක්වා |
|---|---|---|---|
| (1) | ———— | ———— | ———— |
| (2) | ———— | ———— | ———— |
| (3) | ———— | ———— | ———— |

8. ගුරු විද්‍යාලයක අධ්‍යයන පාඨමාලාවක් ඔබ අනුගමනය කර තිබේනම් එම පාඨමාලාවේ කාල පරිච්ඡේදය හා ගුරු විද්‍යාලයේ නම සඳහන් කරන්න :

| ගුරු විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| ———— | ———— | ———— |

9. (එබඳු පාඨමාලාවක් අනුගමනය කර තිබේනම්) ඒ වෙනුවෙන් බැඳුනු ඇපකරයේ කාල පරිච්ඡේදය :—
————සිට ————දක්වා

10. අන්‍ය කවර හෝ පාඨමාලාවක් අනුගමනය කර තිබේද? එසේනම් එබඳු නිවාඩු කාලපරිච්ඡේදය සහ කවර කරුණු සඳහාද යන වග සඳහන් කරන්න : ————.

12. දැනට ඔබ ගුරු විද්‍යාලයක පාඨමාලාවක් අනුගමනය කරන්නේ නම් එම පාඨමාලාව ඇරඹුන දිනය හා ගුරු විද්‍යාලයේ නම සඳහන් කරන්න : ————.

13. *1969 වර්ෂයේදී ඇතුළත් කර ගැනීමට ඔබ තෝරා ගන්නා ලද විශ්ව විද්‍යාලයේ/කාර්මික විද්‍යාලයේ නම : ————.
(එසේ තෝරාගත් බව දන්වන ලද ලිපියේ පිටපතක් මීට අමුණන්න.)

14. *විශ්ව විද්‍යාලයේදී/ලංකා කාර්මික විද්‍යාලයේදී ඔබ අනුගමනය කිරීමට අදහස් කරන අධ්‍යයන පාඨමාලාව සහ මාධ්‍යය : ————.

| | විෂයයෝ | මාධ්‍යය |
|---|---|---|
| (1) | ———— | ———— |
| (2) | ———— | ———— |
| (3) | ———— | ———— |
| (4) | ———— | ———— |

15. (අ) විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය/ලංකා කාර්මික විද්‍යාල ප්‍රවේශ විභාගය හෝ අ. පො. ස. ප. (උසස් පෙල) විභාගය සමත් වූ වර්ෂය සහ සමත්වූ විෂයයන්) : ————.

(ආ) විශ්ව විද්‍යාලයීය ප්‍රථම යෝග්‍යතා පරීක්ෂණයේදී හෝ මධ්‍ය පරීක්ෂණය සමත්වූ වර්ෂය සහ සමත්වූ විෂයයන් : ————.

16. පාඨමාලාව ආරම්භ වන දිනය : ————.

17. පාඨමාලාවේ කාල පරිච්ඡේදය : ————.

18. (අ) ඉකුත් පස් වර්ෂය තුළ ඔබ කවර හෝ විනයානුකූල පරීක්ෂණයකට භාජනවීද? එසේනම්, ඒ පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්/අමාත්‍යාංශයෙන් ලද ලිපිවල යොමු අංක හා දින සඳහන් කරමින් විස්තර සපයන්න————.

(ආ) ඔබට විරුද්ධව කවර හෝ විනයානුකූල පරීක්ෂණයක් පැවැත් වීමට නියමව තිබේනම් ඒ පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්/ආමාත්‍යාංශයෙන් ලද ලිපිවල යොමු අංකය හා දින සඳහන් කරමින් විස්තර සපයන්න :————.

ඉහතින් දී ඇති මගේ සේවා විස්තර සහ අනෙකුත් කරුණු සත්‍ය බවත් නිරවද්‍ය බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————

————,
විද්‍යාලයාධිපති/ප්‍රධානාචාර්ය/ප්‍රධානාචාර්යවරියගේ අත්සන.

————විද්‍යාලය,
————1969.

*අනවශ්‍ය වචන කපා හරින්න.

## සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව

### II වෙනි ශ්‍රෙණියේ සහකාර ගගන නාවික පරීක්ෂක තනතුර

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රෙණියේ සහකාර ගගන නාවික පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා වන අයදුම්පත් පහත දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කොට, 1969 සැප්තැම්බර් 27 වැනි දිනට හෝ ඊට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, ලෝටස් පාර, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 2,820කින් පටන් ගෙන රු. 120 බැගින් වන වාර්ෂික වර්ධකයන් 9කින් හා රු. 180 බැගින් වන වාර්ෂික වර්ධකයන් 8කින් වර්ෂයකට රු. 5,340 දක්වා වැඩිවේ. රුපියල් 3,900 පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.

3. **වයස් සීමා.**—1969 සැප්තැම්බර් 27 වන දිනට අවුරුදු 21කට නොඅඩු විය යුතු වන අතර, අවුරුදු 40කට නොවැඩි විය යුතුය. දනටමත් රජයේ සේවයෙහි නියුතු වූවනට මෙම වයස් සීමාවන් බල පවත්වනු නොලැබේ.

4. **අයදුම්කරුවනට තිබිය යුතු අධ්‍යාපනික හා සෙසු සුදුසුකම්.**—

(අ) පළමු වතාවේදී අඩුම වශයෙන් විෂයයන් පහකින්වත්, සාමාර්ථය ලබාගෙන ඇතොත් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් වශයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා භෞතික විද්‍යාව ඇතුලු විෂයයන් හයකින් ලබන ලද පොදු අධ්‍යයන සහතික පත්‍රය නැතහොත් ගණිතය හා භෞතික විද්‍යාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට උසස් අධ්‍යාපනික සුදුසුකම්,

(ආ) ගුවන් යානා හා ඇන්ජින් නඩත්තු පිළිබඳ අවුරුදු 5කට නොඅඩු පළපුරුද්දක්.

(ඇ) ගුවන් යානා හා ඇන්ජිනුත් ඒවායේ උපාංගයන් හා උපකරණයන් පිළිබඳව මනා දැනුමක්.

(ඈ) ගුවන් යානාවන්හි ගුවන් යෝග්‍යතාවට අදල වන කාර්ය පරිපාටීන් පිළිබඳව මනා දැනුමක්.

5. **සේවයෙහි යෙදවීමේ වගන්ති.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය.

6. පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පතට ඇමිණිය යුතුය. මෙම පිටපත් අයදුම්කරුවන්ට ආපසු එවනු නොලැබේ. සියලුම සහතිකපත් හා ලියවිලිවල මුල් පිටපත් අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. මෙම සහතික පත්‍ර හෝ ලියවිලි කිසිවක් ඉදිරිපත් නොකිරීම අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත් කිරීමට හේතු වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ බාරගනු නොලැබේ)

(ආ) උසස්ම අධ්‍යාපනික සහතික,

(ඇ) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික,

(ඉ) චරිත සහතික දෙකක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳව පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත් හෝ මේ තනතුරට අදල වන අනෙකුත් ලියවිලි සිංහල්ලක්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියෙකු ගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

ඩබ්. එල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1.

### අයදුම්පතෙහි ආකෘතිය

#### II වෙනි ශ්‍රෙණියේ සහකාර ගගන නාවික පරීක්ෂක තනතුර

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය හා වයස :————.
4. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—
(i) පරම්පරාවෙන්ද :————.
නැතහොත්
(ii) ලියාපදිංචිවීමෙන්ද :————.
5. සමත්වූ උසස්ම විභාගය :————.
(විෂයයන් සඳහන් කළ යුතුයි.)
6. සමත්වූ කාර්මික විභාග :————.
7. ගුවන් යානා හා ඇන්ජින් නඩත්තුව පිළිබඳ පළපුරුද්ද :————.
8. විශේෂ සුදුසුකම් හා හිමිකම් :————.
9. දනට කරන/කලින් කළ රක්ෂාවල් පිළිබඳ විස්තර :————.

මේ අයදුම්පතෙහි මවිසින් සපයනු ලැබ ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත්, මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බව හා පත්වීමෙන් පසු අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–346—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පාංශු ප්‍රස්ථාරක තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාංශු ප්‍රස්ථාරක තනතුරු සඳහා අයදුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද අයදුම් පත්, 1969 සැප්තැම්බර් මස 26 දිනට හෝ ඊට පෙර "කොළඹ, තැ. පෙ. 1138, වාරිමාර්ග අධ්‍යක්ෂ", යන ලිපිනයට එවිය යුතුය. අයදුම් පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

2. **සේවයට භාරගැනීම පිළිබඳ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක විය යුතුය.

3. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 1,260—120 × 21— රු. 3,780 (රු. 2,820 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම තමා—

(i) ලාංකිකයෙකු බවත් (පරම්පරාවෙන් පැවත එන හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියා ලාංකිකයෙකි.)

(ii) 1969 සැප්තැම්බර් මස 12 දිනදී වයස අවුරුදු 20ට නො අඩු සහ අවුරුදු 30ට නොවැඩි බවත් (නියමිත අන් සියළුම සුදුසුකම් ඇත්නම් දනටමත් රජයේ සේවයේ යෙදී සිටින අපේක්ෂකයින් කෙරෙහි මෙම වයස් සීමාව බලපානු නොලැබේ),

(iii) විශිෂ්ඨ චරිතයකින් හා යහපත් සෞඛ්‍යයෙන් යුක්ත බවත්,

(iv) පහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් සහ අවශ්‍ය පළපුරුද්ද ඇති බවත් සනාථ කළ යුතුය :—

(අ) (i) ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළත් පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළත් ඒ හා සමාන වෙනත් සහතිකයක්.

හෝ (ii) සිංහල/දෙමළ, ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂය යන් තුනද ඇතුළුව පිට පිට දෙවතාවකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් හයක් සඳහා ලබා ගත් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) පෙළ පත්‍රය.

සංලක්ෂ්‍යය : (1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර/අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) පත්‍ර විභාගයේදී හෝ ඒ සමාන වෙනත් විභාගයකදී ඇඳීම විෂයයෙන් ලබාගත් සාමාර්ථ යක් ඇතොත් එය අමතර සුදුසුකමක් වනු ඇත.

(2) මෙහි පහත (ආ) උප ඡෙදයෙහි නියමිත පුහුණුව සහ පළපුරුද්ද ඇති මෙම දෙපාර්තමේන්තුවේ අපේක්ෂක යින්ට, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ගණිතය/ අංක ගණිතය සහ සිංහල/දෙමළ යන විෂයයන් දෙකද ඇතුළුව විෂයයන් හයක් සඳහා ලබාගත් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) පත්‍රය හෝ ඒ හා සමාන වෙනත් සහතික පත්‍රයක් හෝ ඇත්නම් මෙම තනතුරට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇත.

(ආ) පාංශු ප්‍රස්ථාරණය පිළිබඳව අඩුම වශයෙන් හය මාසයකවත් පූර්ව පුහුණුවක් සහ පාංශු සමීක්ෂණ අත්පොත් අංක 18 හි සඳහන් ක්‍රියා පිළිවෙල අනුව පාංශු සමීක්ෂණ සහ පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීමෙහි සහ රාශිභූත කිරීමෙහි අඩුම වශයෙන් තුන් අවුරුද්දකවත් පළපුරුද්දක් තිබීම.

5. රජය යටතේ දනට සේවය කරන අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

6. අයදුම්කරුවන් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) තමන්ගේ ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුය. මේවා ආපසු එවනු නොලැබේ:—

(i) ලබා ඇති අධ්‍යයන සුදුසුකම් පිළිබඳ සහතික.

(ii) පාංශු ප්‍රස්ථාරණය පිළිබඳ පූර්ව පුහුණුව සම්බන්ධයෙන් වූ සහතික.

(iii) පාංශු සමීක්ෂණ සහ පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීමෙහි සහ රාශිභූත කිරීමෙහි පළපුරුද්ද පිළිබඳ සහතික.

(iv) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මින් එකක් අයදුම්කරු අන්තිමට උගත් පාඨශාලාවේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතුයි.)

(v) උප්පැන්න සහතිකය.

**සැ. යු.**—බෞතිස්ම සහතික හෝ උපකෘත පාඨශාලාවල රෙගුලාසි පද්ධතියේ අභ්‍යාසතාවයන් සඳහා නිකුත් කරන ලද සහතික හෝ භාරගනු නොලැබේ. උප්පැන්නය ලියාපදිංචි නොවුනු අයදුම්කරුවෙකු සම්බන්ධයෙන් ඔහුගේ වයස පිළිබඳ තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් වයස පිළිබඳ නිකුත් කර ඇති විශේෂ සහතිකය භාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

ටී. පත්මනාදන්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1969 සැප්නැම්බර් මස 4 දින,
තැ. පෙ. 1138, කොළඹ 7,
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදී.

### ආදර්ශ ආකෘති පත්‍රය

#### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාංශු ප්‍රස්ථාරක තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ————.
2. ලිපිනය : ————.
3. (අ) අයදුම්කරු උපන් දිනය හා ස්ථානය : ————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(ආ) පහත දක්වෙන අයවලුන් උපන් ස්ථාන හා දිනය : —

(i) අයදුම්කරුගේ පියා : ————.

(ii) අයදුම්කරුගේ පියාගේ පියා : ————.

(iii) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා : ————.

අයදුම්කරු ලංකාවෙහි උපන් අයෙක් නම් (ආ) (i) හෝ (ii) සහ (iii) හෝ පිරවිය යුතුය. අයදුම්කරු උපන්නේ ලංකාවේ නොවේ නම් එක්කෝ (ආ) (i) සහ (ii) නැත්නම් (iii) පිරවිය යුතුය.

4. ජාතිය : ————.
5. විවාහකද, අවිවාහකද, වැන්දඹුද යන බව : ————.
6. අධ්‍යයන සුදුසුකම් සමත්වූ විෂයයන් සමඟ : ————.
(සහතික පිටපත් අමුණන්න)
7. පාංශු ප්‍රස්ථාරණය පිළිබඳ පූර්ව පුහුණුවේ විස්තර : ————.
(සහතික පිටපත් අමුණන්න)
8. පාංශු සමීක්ෂණ සහ පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීමෙහි සහ රාශිභූත කිරීමෙහි පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතික පිටපත් අමුණන්න) : ————.
9. දැනට තනතුරක් දරන්නේ නම් එම තනතුර : ————.
(ස්ථිරද, තාවකාලික ද යන බවත් සඳහන් කරන්න)
10. අමුණා ඇති චරිත සහතික ලබාගත් අය : ————.
(i)
(ii)
(iii)

මෙම අයදුම් පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙම අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබුණ බව තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙළිදරව් වුවහොත් කිසිම වන්දියක් නොමැතිව මාව රාජකාරියෙන් පහකර දැමීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය : ————.
දිනය : ————.

9–347—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### II වෙනි ශ්‍රෙණියේ (ඉංග්‍රීසි) ලඝුලේඛක තනතුර

අයදුම්කරුවන්ගේ වයස 69.9.1 දිනට අවුරුදු 30ට අඩුවිය යුතු අතර, පහත සඳහන් අඩුම සුදුසුකම් තිබිය යුතුය :—

i. විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව සමඟ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ එක වරකදී ලබාගන්නා ලද විෂයයන් හයකින් යුත් අධ්‍යයන පොදු සහතිකය සමඟ ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රය (එම වාරයේදී හෝ වෙනත් වාරයකදී) සමත්වී තිබිය යුතුය.

ii. ලඝුලේඛනය—විනාඩියකට වචන 100 (ඉංග්‍රීසි)
යතුරුලියනය—විනාඩියකට වචන 40 (ඉංග්‍රීසි)

iii. ලඝුලේඛන/යතුරු ලියන කාර්යයන් අදලව 2 වසරක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය.**—රු. 345—450 මාසික (සියළුම දීමනා අඩංගු)

7×15

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, අයදුම්කරුවන් විසින් තම අත් අකුරෙන් පිලියෙල කරන ලද, අයදුම් පත් 1969.9.26 දිනට හෝ එයට පෙර පහත සඳහන් ලිපිනය අනුව සාමාන්‍යාධිකාරී වෙත එවිය යුතුය.

අයදුම් පත්‍ර තැපැලෙන් ලබා ගැනීම සඳහා මුද්දර ගැසූ ලිපිනය සඳහන් දිග ලිපි කවරයක් එවිය යුතුය.

කි. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

135, යූනියන් පෙදෙස,
තැ. පෙ. 1367,
කොළඹ 2,
1969 අගෝස්තු 24.

9–350—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාර (ගබඩා)

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාර (ගබඩා) ඇබෑර්තු සඳහා පහත් සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ :—

**සුදුසුකම්.**—අයදුම්කරුවන්—

(1) වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(2) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යා හෝ භෞතික විද්‍යා විෂයයකින් විශේෂ උපාධිය ලබා තිබිය යුතුය.

**පුහුණුව ලබන සමයේදී දීමනා.**—රු. 400—රු. 40×3=රු. 520 (සියළු දීමනා ඇතුළුව මාසික)

තෝරාගනු ලබන අයැදුම්කරුවන් සංස්ථාවේ යටත්පිරිසෙයින් අවුරුදු තුනක ගබඩා පාලනය හා ක්‍රම සම්බන්ධව පුහුණුවක් ලැබිය යුතුය. එසේ තෝරාගනු ලබන අපේක්ෂකයන් ඉහතකී පුහුණුවෙන් පසු මෙම සංස්ථාවට හත් අවුරුද්දක් සේවය කරනා බවට සංස්ථාව සමග ගිවිසුමකට හා ඇපකරයකට අත්සන් තැබිය යුතුය.

රජයේ/සංස්ථා/මණ්ඩල සේවකයන්ගේ අයැදුම් පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අතර, අයැදුම්කරුව ඉහත සඳහන් තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු තම සංස්ථාවේ/මණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ සේවයෙන් මුදහරින බවට එකී දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ විය යුතුය.

මේ සඳහා අවශ්‍ය අයැදුම් පත් මෙම සංස්ථාව මගින් නිකුත් කරනු ලැබේ. මෙම කාර්යාලයට පැමිණ හෝ තැපැල් මගින් ලබාගත් අයැදුම් පත් මගින් පමණක් ඉල්ලුම් කළයුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයැදුම් පත් 1969 සැප්තැම්බර් මස 23 වැනි දිනට හෝ ඊට පෙර " සභාපති, ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව, තැ. පෙ. අංක 670, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 5." යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාදවන අයැදුම් පත් ගැන සංස්ථාව වග කියනු නොලැබේ.

තැපැල් මගින් අයැදුම් පත් ලබාගැනීමට බලාපොරොත්තුවන අයට ශත 10ක මුද්දරයක් ගසන ලද 9″×4″ ප්‍රමාණයේ, ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවීමෙන් අයැදුම් පත් ලබාගත හැක.

සේවක මණ්ඩල කළමනාකාර,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව.

තැ. පෙ. 670,
අංක 242, හැව්ලොක් පාර,
කොළඹ 5,
1969 අගෝස්තු මස 29 වැනි දින.

9–355—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

### කොළඹ කෞතුකාගාර ආරක්ෂක තනතුර

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කොළඹ කෞතුකාගාර ආරක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද අයදුම්පත් 1969 ඔක්තෝබර් 4 වැනි දින හෝ ඊට පෙර හෝ කොළඹ 7, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ ''කොළඹ කෞතුකාගාර ආරක්ෂක තනතුර'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

2. **වැටුප් ක්‍රමය**.— වර්ෂයකට රු. 2,580 — 120 × 11 සහ 180 × 5 — රු. 4,800 වේ.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි**.—(අ) මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත ස්ථිර තනතුරකි. යථා කාලයේදී මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරු රජයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) මෙම පත්වීම තුන් අවුරුදු පරීක්ෂණ කාලයකට යටත් වේ.

4. **අවශ්‍ය සුදුසුකම්**.—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1969 ඔක්තෝබර් 4 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ 35 ට නොවැඩි බව.

**සටහන**.—දැනට රජයේ සේවයේ යෙදී සිටින අයට මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(ආ) ලංකා ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ විෂයයක් වශයෙන් ගෙන පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා සිටීම.

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ඊට සමාන විභාගයකින් හෝ ලංකා ඉතිහාසය හෝ රසායන විද්‍යාව ඇතුළුව යටත්පිරිසෙයින් විෂයයන් තුනකින් සාමාර්ථය ලබා සිටින්නාවූද, ආරක්ෂක තනතුරුවල අවුරුදු 10 කට නොඅඩු සතුටුදායක හා අඛණ්ඩ සේවයක් ඇත්තාවූද දෙපාර්තමේන්තු සේවකයන්ටද මේ සඳහා ඉල්ලුම් කළ හැක.

(ඈ) විශිෂ්ට චරිතයකින් යුක්ත බව.

5. අයදුම්කරුවන් තම අයදුම්පත්වලට පහත සඳහන් ලියකියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතික (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලා හෝ අධ්‍යාපන කටයුතු උදෙසා නිකුත් කෙරෙන විශේෂ උප්පැන්න සහතික භාරගත නොහැක).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික

සහ

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා මෙම තනතුරට පත්කිරීම උදෙසා ඇති හැකියාව හා යෝග්‍යතාවය දක්වෙන මෑතදී ලබාගත් සහතික තුනක්.

දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් මෙම සහතික ඉදිරිපත් කළයුතු නොවේ.

6. රජයේ සේවයේ නියුක්ත වූවන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු අතර, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම නිලධාරියා/නිලධාරිනිය වහාම මුදා හැරිය හැකි බවට සහතිකයක්ද ඉල්ලුම්පතට ඇතුළත් විය යුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි කෙරෙහිද අවධානය යොමු කරවනු ලැබේ.

පී. එච්. ඩී. එච්. ද සිල්වා,
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 1 වැනි දින,
කොළඹ 7,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ දීය.

### නිදර්ශන ආකෘති පත්‍රය

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කොළඹ කෞතුකාගාර ආරක්ෂක තනතුර සඳහා අයදුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. (අ) ජාතිය :————.
   (ආ) ලාංකිකත්වය පෙළපතින් හෝ ලියාපදිංචි කිරීමෙන්ද යන වග :—
   (ඇ) උපන් ස්ථානය—
   (i) අයදුම්කරු :————.
   (ii) අයදුම්කරුගේ පියා :————.
   **සටහන්**.—ඔබ ලියාපදිංචිවීමෙන් ලාංකික පුරවැසිභාවය ලබා ඇත්නම් ඔබ වෙත නිකුත් කර ඇති පුරවැසි සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න.
5. විවාහක, අවිවාහක හෝ වැන්දඹු බව :————.
6. අධ්‍යාපනික සුදුසුකම් හා සමත්වූ ඉහළම විභාගය හා දිනය :————.
7. විද්‍යාලයෙන් අස්වූවාට පසු රැකියාවක යෙදුනේ නම් ඒ පිළිබඳ විස්තර :————.
8. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.
9. ඉදිරිපත්කර ඇති චරිත සහතික ලබාගත් අයවළුන්ගේ නම් සහ ලිපින :————.
10. වෙනත් වැඩි තොරතුරු ඇත්නම් :————.

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය බව හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එමෙන්ම මවිසින් සපයා ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බැව් තෝරාගැනීමට කලින් සොයාගනු ලැබුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු වීමටද, පත්වීමෙන් පසු එම වරද සොයාගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා තනතුරින් පහකිරීමටද ඉඩ ඇතිබව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–344—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

### වෘත්තීය ආධුනිකයන්ගේ තනතුර

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ වෘත්තීය ආධුනිකයන්ගේ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) **සුදුසුකම්**.—සෑම අයදුම් කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(අ) උත්පත්තියෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් ලාංකික විය යුතුයි.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් සිටිය යුතුයි.

(ඇ) 9.10.69 දිනට අවුරුදු 20ට නොඅඩු අවුරුදු 24ට නොවැඩි විය යුතුයි.

(ඈ) අධ්‍යාපන පොදු සහතික පත් (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේදී දෙවර කට නොවැඩි වාර ගණනකින් විෂයයන් 6 කින් සම්මාන හතරක් සහිතව සමත්විය යුතු අතර, ඉන් සම්මාන දෙකක් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය හා ව්‍යවහාරික ගණිතය යන විෂයන්ගෙන් දෙකකට විය යුතුය.

(2) **පුහුණුව**.—තෝරාගනු ලබන අයදුම්කරුවනට සංස්ථාවේ යන්ත්‍රාගාර යන්හි ''යන්ත්‍රාගාර පුහුණුව'' ක් හා/හෝ සංස්ථාවට අවශ්‍යයයි හැඟී ගිය හොත් සංස්ථාවෙන් පරිබාහිර වෙනත් පිළිගත් කර්මාන්ත ශාලාවක පුහුණුවක් ලබාදෙනු ඇත.

(3) **වැටුප්**.—පුහුණුව ලබන කාලය තුල අභ්‍යාසලාභීන්ට පහත සඳහන් දීමනා ගෙවනු ලැබේ :—

1 වන වසර—රු. 150/– (සියළු දීමනා ඇතුළුව)
2 වන වසර—රු. 175/– (සියළු දීමනා ඇතුළුව)
3 වන වසර—රු. 200/– (සියළු දීමනා ඇතුළුව)

(4) **පත්වීමේ කොන්දේසි.**—මාස 6ක පුහුණුවකින් පසු ආධුනිකයන් හා ඔවුන්ගේ දෙමව්පියන් හෝ බාරකරුවන් සමඟ සංස්ථාව බහු පාක්ෂික ගිවිසුමකට අත්සන් තබනු ඇත. පුහුණුවීමේ කාලය තුල ආධුනිකයන්ගේ ප්‍රගතිය හා/හෝ හැසිරීම අසතුටුදයක වුවහොත් එම ගිවිසුම සංස්ථාව විසින් අහෝසි කරනු ලබනු ඇත. එවැනි අවස්ථාවක සංස්ථාවේ තීරණය අවසාන තීරණය වන අතර, අදල ආධුනිකයන්ට තම පුහුණුව සඳහා සංස්ථාව වැය කළ සියළුම වියදම් සංස්ථාවට ගෙවීමට සිදුවනු ඇත.

(5) සතුටුදයක ලෙස පුහුණුව අවසන් කරනු ලබන ආධුනිකයන් සංස්ථාවේ යන්ත්‍රාගාරයන්හි සුදුසු ශ්‍රෙණියක හා තත්වයක පත්වීම් සඳහා සලකා බලනු ලැබේ.

(6) තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නාවූත් මතුවට පනවනු ලැබිය හැකිවූත් නීතිරීති හා ව්‍යවස්ථා වලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුයි. තුන් අවුරුදු පරීක්ෂණාත්මක කාල සීමාවෙන් පසු තනතුරේ ස්ථිර කිරීම බලපවත්වනුයේ වෙනත් කරුනු අතර රාජ්‍ය භාෂා අවශ්‍යතාවයනට අනුකූලතාවය දක්වුවහොත් පමණි.

(7) මෙයට අදල වේතන පරිමාන හා පත්වීමේ කොන්දේසි පත්වීම දෙනු ලබන අවස්ථාවේ සංස්ථාවේ එවකට බලපැවැත්වෙන බඳවා ගැනීමේ කොන් දේසි හා උසස් කිරීමේ පිළිවෙත් වලට අනුකූල වනු ඇත.

(8) අයදුම් ආකෘති පත් කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයට පැමිණ හෝ මුද්දර ගැසූ තම ලිපිනය ලියන ලද 4" × 9" කවරයක් එවීමෙන් හෝ ලබාගත හැක. ආකෘති පත්‍ර පුරවා 9.10.69 දින හෝ ඊට පෙර කොළඹ, තැ.පෙ. 1212, ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපතිට ලැබෙන සේ එවිය යුතුය.

සෝ. ඉගලහේවා,
ලේකම්/සේවක නිළධාරි,
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

තැ.පෙ. 1212,
කොළඹ,
නොපෙ :කෙවි,
1969 අගෝස්තු මස 25 දින.

9–363—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාර අංකය : 1/23/36 (ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා වූ I වැනි සහ II වැනි කායඝක්ෂමතා කඩඉම් විභාගය (සිංහල/දෙමල/ඉංග්‍රීසි) 1969 නොවැම්බර්

1966.10.23 වැනි දින අංකය ජී (134), 1968.2.7 වැනි දින අංකය ජී (170) සහ 1968.11.16 දින අංකය ජී (199) දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපි මඟින් සංශෝධිත, 1955.10.1 දින අංක 10,844 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ලඝු ලේඛක සේවය පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ සඳහන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවත්නා ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා වූ I වැනි සහ II වැනි කායඝක්ෂමතා කඩඉම් විභාග 1969නොවැම්බර් 'මස 15 වැනි දින සිට කොළඹ දී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාග, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාග පැවත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීති වලට විභාගාපේක්ෂකයන් යටත්වේ. විභාගාපේක්ෂකයන් සඳහා වූ නීතිරීති මෙම නිවේදනය අවසානයේ වෙනම පළකර ඇත.

3. මෙම විභාග සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේ දනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂ කයන් විසින් ස්වකීය අයදුම් පත්‍ර පිළියෙල කර ගත යුතුය. අයදුම් පත්‍රය පිළියෙල කළ යුත්තේ බාග ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදාසියක මිස අන් කිසිම ප්‍රමාණයක කඩදාසියක නොවේ. මේ සඳහා එක කඩදාසියක් පමණක් පාවිච්චි කළ යුතුය. අයදුම් පත්‍රය ටයිප් කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අපේක්ෂකයාගේම අත් අකුරින් පිරවිය යුතුය. 1969 ඔක්තෝබර් 15 වැනි දින හෝ එයට පෙර කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි, අයදුම් පත්‍ර, අදළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ලියා පදිංචි තැපැලෙන් යැවිය යුතුය. අයදුම් පත්‍ර විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කෙරෙන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කායඝය සඳහා නව ප්‍රවේශක නිලධාරීහු ඔවුන්ගේ අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් පිළියෙළ කොට, එම භාෂාවෙන් පිරවිය යුතුය. කෙසේවුව ද, ආදි ප්‍රවේශක නිලධාරීන්ට ස්වකීය කැමැත්ත පරිදි රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවාගත් භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ තමන්ගේ අයදුම්පත්‍ර පිළියෙල කිරීමට හා පිරවීමට හැකිය.

4. අයදුම් පත් පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග කාල සටහනේ පිටපතකුත් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. යම්කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකටවත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, ප්‍රවේශ පත්‍රය නොලැබුන බව පහත සඳහන් විස්තර සමඟ කොළඹ තැ.පෙ. 1503, කොම් පඤ්ඤ වීදියේ, මැලේ වීදියේ විභාග කොමසාරිස් (විදුලි පණිවුඩ ලිපිනය : " විභාග ", කොළඹ) වෙත අප්‍රමාදව ලියා දන්විය යුතු ය :—

(1) විභාගයේ නම :————.
(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(3) සම්පූර්ණ ලිපිනය :————.
(4) තැපැල් කායඝාලය, ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය :————.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 සැප්තැම්බර් මස 4 වැනි දික,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

### අයදුම් පතේ ආදර්ශ ආකෘති පත්‍රය

### සථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා වන I වැනි සහ II වැනි කායඝක්‍ෂමතා කඩඉම් විභාගවලට (සිංහල/දෙමල/ඉංග්‍රීසි) ඇතුළත්වීමේ අයදුම් පත 1969 නොවැම්බර්

විභාග අංකය :————.

(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණයි)

1. ඉල්ලුම්කරුගේ අගට යෙදෙන නම මුලකුරු සමග (මහතා/මහත්මිය/මෙනෙවිය) (පැහැදිලි අකුරෙන්) :————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :————.

3. කාර්යාලයේ හෝ දෙපාර්තමේන්තුවේ නම සහ කාර්යාලයීය ලිපිනය :————.

4. ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයට ඇතුළුවූ දිනය :————.

5. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා ඔබ ආදි ප්‍රවේශකයෙක් ද නව ප්‍රවේශකයෙක් ද ? :————.

6. මීට ඉහත පැවැත්වූ විභාගයක දී ලඝුලේඛන සහ යතුරු ලේඛනය හෝ සිංහල/දෙමල යන විෂයයන්ගෙන් ඔබ සමත් වූයෙහි ද ? එසේ නම් විභාගය පැවැත් වූ දිනය සඳහන් කරන්න :————.

7. අංකය ජී (31) සහ 1964.9.9 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ විධිවිධාන ප්‍රකාර සිංහල විෂයයෙන් ඔබ නිදහස් කරන ලද්දේ නම් එසේ නිදහස් කරමින් එවන ලද භාණ්ඩාගාර ලිපියේ යොමුව සඳහන් කරන්න :————.

8. ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගය (I හෝ II) ඒ පරීක්ෂණයයේ විෂයයන් හා මාධ්‍යය සඳහන් කරන්න :—
*අදල නොවෙන වචන කපා හරින්න.

මා විසින් ඉහත දක්වන ලද විස්තර සත්‍ය බැව් සහතික කරමි. මේ විභාගයේ රෙගුලාසි පිළිපැදීමට මම එකඟවෙමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සපයා ඇති තොරතුරුවල නිවැරදි බව පිරික්සන ලදුව, ඒවා නිවැරදි බැව් හෙලි වූ බවත්, අයදුම්පත් ආකෘතියේ 8 වැනි කොටුවේ සඳහන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂකයා සුදුස්සකු බවත් මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

පදවි නාමය :————.

## ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියළුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු ය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව කොයිම අවස්ථාවක දී වුවත් එවැනි විභාග අපේක්ෂකයෙකු හෝ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවාගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ටද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිට වන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතු ය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිට වී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතු ය. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතු යි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්‍ය මණ්ඩලයේ කෙනෙකු සමඟ හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමඟ මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි උවමනාවක් සඳහා කිසිවකු සමඟ කතාබස් කිරීම ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද සිදුවනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතු යි. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවෙන් යුක්තව ක්‍රියාකිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නො කළ යුතු ය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලිය වී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපෙක්ෂකයෙකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙනයාම තහනම් ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබැලි ද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවල දී, ඒවා හැර අන්‍ය අත්බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, fපයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා ළඟ හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදව් දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් වැලකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවහොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන්ගැනීමට පෙර හෝ සියම විභාගාපෙක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපෙක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(I) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(II) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්ණ පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂත්වය අවලංගු වී යාමට හේතුවිය හැකි ය.

(III) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතු ය.

(IV) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රශ්කාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාවම විභාගශාලාධිපතින්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබ ගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්ස මෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(V) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිතිය උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(VI) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිළිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

(VII) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංකය ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(VIII) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්ස මෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(IX) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැණ බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(X) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන කඩදාසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(XI) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවෙකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(XII) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතු ය.

කේ. ඩී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

9–433—69 9.12 දින අංක 14,871 දරණ ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල යතුරු ලියනය පුහුණු කිරීමේ පන්ති

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන්නට යන සිංහල යතුරු ලියනය පුහුණුකිරීමේ පන්තිවලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ඒ සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් දන්වනු ලැබේ. මේ පන්ති සමසක් පමණ කාලයක් කාර්යාල වේලාවන් තුළ කොළඹ දී පවත්වනු ලැබේ. පුහුණුවන්නන් 40 දෙනකුට පමණ ඉඩ ඇත.

2. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියකම—

(අ) ලාංකික විය යුතුය ('' ලාංකිකයා '' යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරනු ලැබීමෙන් හෝ ලංකාවේ පුරවැසියකු වන කෙනෙකි.)

(ආ) (i) සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථ්‍යය සහිතව ලංකා ජ්‍යෙෂ්ඨ සහතිකපත්‍ර විභාගයෙන් ; හෝ

(ii) එකම වාරයකදී අඩු ගණනේ විෂයයන් 5 කින් වත් සමර්ථ වෙමින් විෂයයන් 6 කින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රය ලබා තිබිය යුතුය. මෙකී විෂයයන් 6 අතුරෙන් සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් 4 කින් සම්මාන සාමාර්ථ්‍යය ලබා තිබිය යුතුය.

(iii) පූර්වෝක්ත (i) වැනි හෝ (ii) වැනි ඡේදයේ සඳහන් සහතික පත්‍රයකට සමාන හෝ ඊට උසස් විභාගයක සහතික පත්‍රයක් ලබා තිබිය යුතුය.

(ඇ) 1969.10.9 වැනි දිනට වයස 17 ට අඩු හෝ 22ට වැඩි හෝ නොවිය යුතුය.

(ඈ) ඉතා හොඳ චරිතයෙන් හා ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

3. කොළඹ දී පවත්වන සම්මුඛ පරීක්ෂණයකට හෝ විභාගයකට අයදුම්කරුවන්/අයදුම්කාරියන් පෙනී සිටිය යුතුය. ඒවා පවත්වන වේලාව හා ස්ථානය පසුව දන්වනු ලැබේ. ඒ සඳහා ගමන් ගාස්තු හෝ අනෙකුත් වියදම් ගෙවනු නොලැබේ. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අයදුම් පතෙහි යම් අසත්‍ය සටහනක් තිබී, තෝරා ගනු ලැබීමට පෙර, ඒ බව දැනගතහොත් එයින් ම ඔහු/ඇ නුසුදුසු වීමට ද තෝරා ගනු ලැබීමෙන් පසුව දැනගත හොත් ඔහු/ඇ අස්කර දමනු ලැබීමටද සිදුවිය හැකිය.

4. පුහුණු වන කාලය තුළදී කිසිම ගෙවීමක් කරනු නොලැබේ. පුහුණුව අවසානයේ දී යෝග්‍යතාව තීරණය කරන විභාගයක් පවත්වා ඒ විභාගයෙන් සමර්ථ වූවන්ට සහතික පත් දෙනුලැබේ. පුහුණුව අවසානයේ දී අයදුම් කරුවන්ට/අයදුම්කාරියන්ට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සේවයෙහි හෝ තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ රැකීරක්ෂා දීම ගැන කිසිසේත් ඇප වන්නේ නැත.

5. පුහුණු වීමේ කාලයේදී වරින්වර පරීක්ෂණයන් පවත්වා ඒවායේ ප්‍රතිඵල අනුව ආධුනිකයන්ට තව දුරටත් පුහුණු වීමට ඉඩ දෙනු ලැබේ. යම් ආධුනිකයකුගේ/ආධුනිකාවකගේ පැමිණීම හෝ ඉගෙනීම හෝ සාමාන්‍ය යෝග්‍යතාව හෝ හැසිරීම සම්බන්ධයෙන් මේම දෙපාර්තමේන්තුව තෘප්තියට පත් නොවේ නම්, පුහුණුවීමේ කාලය අතරතුර කවර අවස්ථාවකදී වුවත් ඔහු/ඇ පන්තියෙන් වහාම අස්කර දමනු ලබන්නට පුළුවන. එසේ අස්කර දමනු ලැබුවහොත් පසුව පත්වන පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් වීමට නුසුදුසු වන්නේ ය. කලින් කල නිකුත් කරන ව්‍යවස්ථාවන් හා නියමයන් අනුව කටයුතු කරන බවට ආධුනිකයා/ආධුනිකාව විසින්ම නියමිත පොරොන්දු පත්‍රයක් අත්සන් කළ යුතුය.

6. දැන දැනම වූ නොසැළකිල්ලක් හෝ තදබල අප්‍රවේසම් කමක් නිසා බඩු නැතිවීමක් හෝ උපකරණ ආදියට හානියක් හෝ වුවහොත් අලාභය ගෙවන බවට ඇපකාරයන් දෙදෙනෙකු ඇපයට තබා රුපියල් 100 ක ඇප පත්‍රයකට අයදුම්කරුවන් පන්තියට ඇතුළත් කරගනු ලැබුවිට අත්සන් කළ යුතුය.

7. අයදුම් පත් එවිය යුත්තේ පහත අත්සන් කරන නිලධාරි තැනගේ පුද්ගලික නාමයට නොව, '' රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 598, කොළඹ 7 '' යන ලිපිනයට ය. අයදුම්පත්, මෙහි පහත පළවන ආදර්ශ පිටපත අනුව තමාගේ අත් අකුරෙන්ම ලියා 1969.10.9 වැනි දිනට හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පී. බී. තෙන්නකෝන්,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ වැඩබලන කොමසාරිස්.

1969 සැප්තැම්බර් මස 1 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, රීඩ් මාවත, කොළඹ 7.

### සිංහල යතුරු ලියනය පුහුණු කිරීමේ පන්තියට ඇතුළත්වීම සඳහා අයදුම් පත

(1) සම්පූර්ණ නම (පැහැදිලිව ලියන්න) :————.

(2) සම්පූර්ණ ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයකු වූයේ පෙලපතින් ද නැතහොත් ලියා පදිංචි වීමෙන්ද යන බව සඳහන් කරන්න) :————.

(4) 1969.10.9 වන දිනට වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. මුල් සහතික නොවේ) :————.

(5) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(6) විවාහකද ? අවිවාහකද ? :————.

(7) සමර්ථ වූ උසස් ම විභාගය (විෂයයන් හා දිනය සමග) :————.

(8) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ අ.පො.ස.ප. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය සහ සම්මාන ලැබූ විෂයයන් :————. (සහතික පිටපත් අමුණන්න. මුල් සහතික නොවේ. සහතික පත් ලැබී නැත්නම් ප්‍රධානාචාර්යවරයාගේ සහතිකයක් හෝ වෙනත් පිළිගත හැකි සහතිකයක් භාරගනු ලැබේ.)

(9) ඉගෙනීම ලැබූ පාඨශාලා (දිනයන් සමග) :————.

(10) සිංහල දැනුම පිළිබඳ විශේෂ සුදුසුකම් ඇතොත් ඒ බව :————.

(11) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යතුරු ලියනය පිළිබඳ දැනුමක් තිබේද : ————.

(12) දූත් රක්ෂාවක යෙදී සිටී නම් ඒ බව :————.

(13) පියාගේ හෝ භාරකාරයාගේ නම හා ඔහුට/ඇයට ලියුම් ලැබෙන පිළිවෙල :————.

(14) තමා ගැන තොරතුරු විමසිය යුත්තන් දෙදෙනෙකුගේ නම් හා ලියුම් ලැබෙන පිළිවෙල :————.

(15) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන්, මෙ සහතික පත්වල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි. එක් සහතිකයක් තමා අන්තිමට ඉගෙන ගත් පාසලේ මුල් ගුරුතුමාගෙන් විය යුතුයි. (අවශ්‍ය මුළු සහතික පිටපත් ගණන 3කි) :————.

(16) වෙනත් සුදුසුකම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–316—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 අධ්‍යයන වර්ෂය සඳහා මොරටුවේ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයට සිසුන් ඇතුළත් කිරීම

සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පහත සඳහන් පාඨමාලාවන් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. :—

1. ඉංජිනේරු ආයතන විභාගයේ II කොටස (සිවිල් යාන්ත්‍රික හා විදුලිය)

ඇතුලත්වීමට අවශ්‍ය අඩුම සුදුසුකම්.—(අ) අයදුම්කරුවන් ලංකාවේ පුරවැසියන්වීම හා වයස අවුරුදු 17 ට වැඩිවීම

(ආ) අයදුම්කරුවන් විභාගයේ පළමු කොටසින් සමත්වීම

2. ගොඩනැගිලි සංඛ්‍යා II :

ඇතුලත්වීමට අවශ්‍ය අඩුම සුදුසුකම්.—(අ) ගොඩනැගිලි සංඛ්‍යා I සමත් වී තිබීම හෝ

(ආ) ගෘහ නිර්මාන ශිල්පය III සමත්වී තිබීම හෝ

(ඇ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ II (සිවිල්) සමත්වීම

3. රබර් කාර්මික ආයතනයේ රබර් විද්‍යා විභාගය පිළිබඳ පාඨමාලාව :—

ඇතුලත්වීම සඳහා අවශ්‍ය අඩුම සුදුසුකම්.—(අ) අයදුම්කරුවන් ලංකාවේ පුරවැසියන් වීම හා වයස අවුරුදු 17 ට වැඩිවීම

(ආ) භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව සමග අධ්‍යාපන පොදු සහතික පත් (සාමාන්‍ය) විභාගයේ විෂයන් 6 කින් හෝ භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව ඇතුළු ඊට වඩා උසස් විභාගයකින් සමත්වීම. අධ්‍යාපන පොදු සහතික පත් උසස් පෙළ විභාගයෙන් සමත්වීම හා රබර් කර්මාන්තයේ නියතු වූවන්ට විශේෂයක් ලැබේ.

4. මැණික් විද්‍යාව :

ඇතුලත්වීමට අවශ්‍ය අඩුම සුදුසුකම්.—(අ) අයදුම්කරුවන් ලංකාවේ පුරවැසියන් වීම සහ වයස අවුරුදු 17 ට වැඩිවීම

(ආ) මැණික් හා ස්වර්ණාභරණ වෘත්තියෙහි යටත් පිරිසෙයින් අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

(ඇ) අධ්‍යාපන පොදු සහතික (සාමාන්‍යපෙළ) විභාගය රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව ඇතුළු විෂයන් 6කින් සමත්වීම හෝ රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව ඇතුළු කවර හෝ උසස් විභාගයකින් සමත්වීම.

මොරටුවේ කටුබැද්දේ උසස් කාර්මික ආයතනයේ ලේඛකාධිකාරී තැනගෙන් ලබාගන්නා අයදුම් පත් පෝරම මගින් 1969.9.25 දිනට හෝ ඊට පෙර අයදුම් පත් ඔහුට ලැබෙන සේ එවිය යුතුය. අවශ්‍ය සුදුසු කම් ලත් අයදුම්කරුවන් තෝරාගත් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට හෝ ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

ඇල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද, මොරටුව,
1969.9.1.

9–406—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

ඊ 4/69.

## ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට උසස් කරවීම පිළිබඳ තරඟ විභාගය—1969

**විභාගය පැවැත්වෙන දිනය.**—ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට උසස් කරවීම සඳහා තරඟ විභාගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 1969 දෙසැම්බර් මාසයේ දී පමණ කොළඹ දී පවත්වනු ඇත.

2. **ඇබෑර්තු සංඛ්‍යාව.**—මේ විභාගයේ ප්‍රතිඵල අනුව පියවිය යුතු ලංකා පරිපාලන සේවයේ IV වන පන්තියේ ඇති ඇබෑර්තු ගණන 20 වනු ඇතැයි ගණන් බලා ඇත. මහජන යහපත තකා අවශ්‍ය වෙතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකනු ලැබේ නම්, ඒ ඇබෑර්තු අතරින් කිසිවක් හෝ සියල්ලම හෝ නොපුරවා හැරීමේ අයිතිය එම සභාව තබා ගනී. අවශ්‍යයයි සලකතොත් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව වැඩි කිරීමේ අයිතිය ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තබා ගනු ලැබේ.

3. **වැටුප.**—සමර්ථ වන නිලධාරීන් නියමිත වැටුප් පරිමාණය මත ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට පත් කරනු ඇත.

4. **සේවා කොන්දේසි.**—මේ විභාගයේ ප්‍රතිඵල අනුව, ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට පත් කරනු ලබන සියලුම නිලධාරීන් මාරු කිරීම්වලට තවදුරටත් යටත් වන අතර ලංකාවේ කවර ස්ථානයකට වුව පත් කරනු ලැබිය හැකිය.

5. **සුදුසුකම්.**—පහත සඳහන් කරුණුවලට අනුකූලවන, ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇත. එනම්—

(1) ඔවුන් 1969 දෙසැම්බර් 1 වැනි දින හෝ ඊට පෙර හෝ ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ වර්ග කරනු ලැබූ තනතුරක අවුරුදු පහක සේවයක් සම්පූර්ණ කර සිටීම, සහ

(2) ඔවුන් 1969 දෙසැම්බර් 1 වැනි දින හෝ ඊට පෙර හෝ වර්ෂයකට රු. 5,880 යන වැටුප් තලයට පැමිණ සිටීම,

(3) ස්වකීය පත්වීම්වල ඔවුන් ස්ථිර කර තිබිය යුතුය.

**සැළකිය යුතුයි.**—පස් වතාවකට වැඩි වාර ගණනක් ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට උසස් කරවීමේ විභාගයට පෙනී සිටීමට කවර නිලධාරියෙකුට වුව අවසර නැත.

6. **ඉල්ලුම් පත්‍ර.**—(i) විභාගයට ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැපැල් පෙට්ටි අංක 500, කොළඹ යන ලිපිනයට යැවිය යුතුය.

(ii) දෙපාර්තමේන්තුවල හෝ කාර්යාලවල හෝ ප්‍රධානීන් විසින්, තම දෙපාර්තමේන්තුවල හෝ කාර්යාලවල හෝ නියුක්ත නිලධාරීන් ගේ ප්‍රයෝජනය සඳහා 1969 සැප්තැම්බර් 15 වැනි දින සිට 1969 ඔක්තෝබර් 8 වැනි දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතින් ඉල්ලුම් පත්‍ර ලබාගත යුතුය. පෞද්ගලික ඉල්ලුම් කරුවන් වෙත පෞද්ගලිකව හෝ තැපෑලෙන් හෝ වුව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී මෙම ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. අයදුම් පත් පෝරම ඉල්ලුම් කරන විට ඒ ඒ දෙපාර්තමේන්තු විසින් ලිපිනය ලියන ලද අඟල් 10× අඟල් 14 ප්‍රමාණයට කුඩා නොවූ ලියුම් කවරයක් එවිය යුතුය.

**සැළකිය යුතුයි.**—මුද්‍රිත ආකෘති පත්‍රය කවර ආකාරයකින් වුව සංශෝධනය කිරීම අපේක්ෂකයින්ට තහනම් වේ. මුද්‍රිත ආකෘති පත්‍රයක ඉදිරිපත් නොකරන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ඇත.

(iii) ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (1969 ඔක්තෝබර් 12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කෙරෙනු ඇත.

අපේක්ෂකයින් විසින් තම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙනි. කිසියම් අපේක්ෂකයකු එසේ කිරීමට අපොහොසත් වුනි නම් ඔහු විභාගයට පෙනී සිටීමට නුසුදුසු වූවෙකු ලෙස සලකනු ලැබේ. තම ඉල්ලුම් පත්‍ර 1969 ඔක්තෝබර් 12 වැනි දින හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යවන්නැයි යන ඉල්ලීම ද සහිතව අපේක්ෂකයන් විසින් කල් ඇතිව එම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

**සැළකිය යුතුයි.**—විභාගය සඳහා වූ ඉල්ලුම් පත්‍රය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ බවට සටහනක් නිලධාරියාගේ පුද්ගලික ලිපි ගොනුවේ තබා ගත යුතුය.

(iv) අයදුම්පත් සියලු ආකාරයෙන් ම සම්පූර්ණ විය යුතුය. ඉල්ලා ඇති සියලු තොරතුරු සපයා නොමැති නම්, ඉල්ලුම් පත්‍රය එහි සඳහන් කර ඇති තොරතුරු අනුව තීරණය කොට ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

(v) අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත් පෝරමය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (ඒ සලකුණු දරණ) මුද්‍රිත තැපැල් පත් එහි සඳහන් කර ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මෙම කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුන බවට දන්වීමක් නොලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දනුම් දිය යුතුය. මේ විධිවිධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බැලීම සම්බන්ධ ඔහුට ඇති අයිතිය අහිමි වේ.

7. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබූ සියලුම අපේක්ෂකයින් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඇතුළත් වීමේ ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට ඇතුලත් වන අපේක්ෂකයින් විසින් විභාගය පරිපාලනය කිරීමට පත් කොට සිටින නිලධාරියාට තම ඇතුළත්වීමේ ආකෘති පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එබඳු ආකෘති පත්‍රයක් ඉදිරිපත් නො කරන අපේක්ෂකයෙකුට විභාගයට ඇතුලත් වීමට ඉඩ දෙනු නො ලැබේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට නියම කරනු ලැබූ විභාග ශාලාවේ දී ය. නියම කරනු ලැබූ විභාග ශාලාව හැර වෙනත් විභාග ශාලාවක පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ නොලැබෙනු ඇත.

කාල සටහනෙහි හා අපේක්ෂකයන්ට අදාල රෙගුලාසිවලද පිටපතක් ඇතුලුවීමේ ආකෘති පත්‍රය සමඟ නිකුත් කරනු ඇත. අපේක්ෂකයෝ එම රෙගුලාසිවලින් බැඳී සිටිති. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂක යෙකු විසින් ම සිය ඇතුළුවීමේ ආකෘති පත්‍රය විභාගය පැවැත්වෙන පළමු දිනයේ දී විභාගයේ පරිපාලක වෙත භාර දිය යුතුය.

විභාගය පැවැත්වෙන දිනට අඩු වශයෙන් දින හතකට හෝ පෙර අපේක්ෂකයකු වෙත තම ඇතුලුවීමේ ආකෘති පත්‍ර නොලැබුණි නම්, ඔහු නොපමාව, තමා වෙත ආකෘති පත්‍රය නොලැබුන බව හා—

(1) විභාගයේ නම,
(2) සම්පූර්ණ නම,
(3) තම ඉල්ලුම් පත්‍රය යැවූ තැපැල් කාර්යාලය, රෙජිස්ටර් අංකය ඉදිරිපත් කළ දෙපාර්තමේන්තුව, හා යැවූ දිනය ද සඳහන් කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දන්වා සිටිය යුතුය.

8. **හැඳුනුම් පත්.**—අපේක්ෂකයන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයක් සඳහා විභාග ශාලාවේ දී, පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි තම අනන්‍යතාව ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් කවරක් වුව පිළිගනු ඇත :—

(අ) පෝස්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්,
(ආ) මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද වලංගු ගමන් ප්‍රවේශ පත්‍රයක්,
(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරය පිට මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද දරන්නාගේ ඡායා රූපය අඩංගු කිසියම් සහතිකයක්, බලපත්‍රයක් හෝ අන්කිසි ලියවිල්ලක්.

9. **වැරදි තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම්.**—මේ විභාගයට අදල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු යන කවර අවස්ථාවක දී වුව ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් ඔහුගේ දනුම් පරිදි වැරදි බව පෙනී යන ලද නම් හෝ ඔහු විසින් ස්වාධ්‍යාශ යෙන් ම කිසියම් වැදගත් කාරණයක් වසන කරන ලද නම් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර අනුමත කරනු ලැබූ තම දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය.

11. **විභාග පරිපාටිය.**—(i) විභාගය කොටස් දෙකකින් පැවැත්වෙනු ඇත. එනම් පළමුවැනි කොටස (ලිඛිත) හා දෙවැනි කොටස (සම්මුඛ පරීක්ෂණය) යන වශයෙනි. විභාගයේ විෂයයන් හා එක් එක් විෂයයකට නියමිත ලකුණු ගණන ද මෙහි පහත දක්වේ. සෑම ලිඛිත පත්‍රයෙකින් ම නොපැහැදිලි අත් අකුරු සඳහා සහ අක්ෂර දෝෂ සඳහා ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) මේ විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වෙනු ඇත. අපේක්ෂකයන් තම ස්ථිර පත්වීම සඳහා සුදුසුකම් ලබාගත් මාධ්‍ය යෙන් හෝ සිය කැමැත්ත පරිදි සිංහල මාධ්‍යයෙන් මේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටිය යුතු මාධ්‍යය අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පසුව වෙනස් කිරීමට අපේක්ෂකයන්ට ඉඩ දෙනු නොලැබේ.

**පළමුවැනි කොටස (ලිඛිත)** — **ලකුණු**

(1) රචනය (පැය තුනයි) ... ... 150 යි
අපේක්ෂකයන් සතු ප්‍රකාශන ශක්තිය හා සාමාන්‍ය මාතෘකා වක් තර්කානුකූලව හා මනාව අවබෝධ වන පරිදි සාකච්ඡා කිරීම සඳහා අපේක්ෂකයින්ගේ හැකියාව රචනයෙන් පරීක්ෂා කරනු ලැබේ. කැමති පරිදි එකක් තෝරා ගැනීම සඳහා මාතෘකා කිහිපයක් දෙනු ලැබේ.

(2) සාරාංශය ලිවීම (පැය 1 යි) ... ... 50 යි

(3) වත්මන් තොරතුරු (පැය 3 යි) ... ... 100 යි
සංස්කෘතික, සමාජ, ආර්ථික, දේශපාලන හා විද්‍යාත්මක කටයුතු වැනි පොදු උනන්දුවක් හා වැදගත්කමක් ඇති වත්මන් කරුණු පිළිබඳව මෙම ප්‍රශ්න පත්‍රය සකස් වනු ඇත.

(4) සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයක් (පැය 3 යි) ... ... 100 යි
විචාර ශක්තිය, කල්තබා ප්‍රතිවිපාක දකීමේ දක්ෂ තාවය හා වැදගත් හා වැදගත්කමින් අඩු දේවල් හඳුනා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වුණු ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වනු ඇත. ඉලක්කම් පාවිච්චිය හෝ ප්‍රස්තාර සටහන් හා සංඛ්‍යා ලේඛන තේරුම් කිරීමක් මෙම ප්‍රශ්නවලට අඩංගුවෙනු ඇත.

(5) රාජ්‍ය පරිපාලනය (පැය 2 යි) ... ... 100 යි
පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ක්‍රියාකාරිත්වය හා ලංකාවේ රාජ්‍ය පාලන කටයුතු සකස් කර ඇති පිළිවෙල ද ලංකා ආණ්ඩු ක්‍රමය, පළාත් පාලනය, පරිපාලන නීතිය, බලය පවරන ව්‍යවස්ථා, ජනසතු කර්මාන්ත සංවිධානය සහ අනිකුත් මහජන සේවා ද පිළිබඳ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වෙනු ඇත.

**දෙවැනි කොටස (සම්මුඛ පරීක්ෂණය)**

සම්මුඛ පරීක්ෂණය ... ... 200 යි
අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයට භාජන කරනු ලබන්නේ ඔහුගේ සේවා වාර්තාව ඉදිරියෙහි තබා ගෙන සිටින මණ්ඩලයක් විසිනි. ඔහුගෙන් ප්‍රශ්න කරනු ලබන්නේ පොදු වැදගත් කමක් ඇති කරුණු ගැනය. ඔහු ඉදිරිපත්ව ඇති සේවය සඳහා ඔහු සුදුසු වේ ද යන්න නිගමනය කිරීම සම්මුඛ පරීක්ෂණයේ පරමාර්ථය වන අතර එම කරුණු තීරණය කිරීමේ දී මණ්ඩලය විසින් ඔහුගේ බුද්ධිය හා මානසික ප්‍රබුද්ධතාව, ඔහුගේ ප්‍රාණවත් භාවය හා චරිත ශක්තිය මෙන්ම ඔහු වෙත ඇති නායකත්වය දැරීමට සුදුසුකම් ඇති කරවන ගුණාංග ද විශේෂ වැදගත්කමකින් යුතුව සලකනු ඇත. ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු, මෙම මණ්ඩලයට දෙනු නොලැබේ. වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, ලිඛිත පරීක්ෂණයෙන් සෑහෙන උසස් තත්ත්වයක් ලබා ගන්නා අපේක්ෂකයින් පමණකි.

12. **ප්‍රතිඵල ප්‍රකාශ කිරීම හා පත්වීම් ලබා දීම.**—සමර්ථවන අපේක්ෂකයන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.

13. මේ රෙගුලාසි මගින් විධිවිධාන සලසා නොමැති කිසියම් කාරණයක් ගැන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිමතය පරිදි ක්‍රියා කෙරෙනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 සැප්තැම්බර් මස 5 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1.

9–424—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—ලංකා කාර්මික විද්‍යාලය, මරදන

අංක 14,865 හා 1969.8.1 දිනැති ගැසට් නිවේදනයට අමතර වශයෙන්, ගණකාධිකරණ ඩිප්ලෝමා (සිංහල මාධ්‍ය) සිව් අවුරුදු සන්ධ්‍යා පාඨ මාලාව සඳහා පමණක් නැවත ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. අත් පොතේ සඳහන් පරිදි, මෙම පාඨමාලාවට ඇතුලත්වීමේ සුදුසුකමක් හැටියට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේදී හෝ ඉංග්‍රීසි භාෂාවට ලබාගත් සාමාර්ථයක් තිබීමේ අවශ්‍යතාවය දන් අවලංගු කොට තිබේ. අනෙකුත් සුදුසුකම් පිළිබඳ වෙනසක් නොමැත.

3. සියළුම ඉල්ලුම් පත්‍ර, කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ, ලේඛකාධිකාරී වෙතින් ලබාගත් ආකෘතිපත්‍ර වල පුරවා 1969.9.26 දින හෝ ඊට පෙර ඔහුට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. දැනටමත් ඉල්ලුම් පත්‍ර එවා ඇති අයදුම්කරුවන් නැවත ඉල්ලුම් කළ යුතු නොවේ.

එස්. එල්. ද සිල්වා,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්,
(කාර්මික අධ්‍යාපනය)
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1969 සැප්තැම්බර් මස 5 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

9–436—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## පළාත් පාලන අමාත්‍යාංශය

### ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය—රත්මලාන

### නාවලපිටිය ජලසම්පාදන ක්‍රමය—වෘධිය

600′ 18″ විෂ්කම්භයකින් යුත් සියුම් නලවලින් සහ 6″ විෂ්කම්භය ඇති අඩි 2,500ක ඩක්ටයිල් යකඩ ගුරුත්ව නලවලින්, ගැලුම් 1,00,000ක වටකුරු ජලාශයක්, ක්ලෝරිනේටරයක් හා ක්ලෝරිනේටර් ගෙයක් හා 6″ විෂ්කම්භය ඇති අඩි 1,000ක බෙදහැරීමේ වාත්තු යකඩ නලවලින්ද සමන්විත ජලවෘද්ධි යෝජනා ක්‍රමයක් නිර්මාණය කිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර, රත්මලානේ, ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වර්ෂ 1969 දෙසැම්බර් මස 3 වන බදාදා පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පෙරවරු 10.05ට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘති පත්‍ර මගින් පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධ වූ සියළු විස්තර හා තොරතුරු ද ඉහත කී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවන අතර, මෙයට අදළ සැලැස්මද ඔහුගේ කාර්යාලයේ දී බලාගත හැකි වන්නේය.

3. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් 1969 ඔක්තෝබර් මස 26 වන දින දහවල් 12 ට පෙරාතුව ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

4. පහත සඳහන් වර්ගයනට අයත් කොන්ත්‍රාත්කරුවන් පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වන්නේය.

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඒ හෝ බී කාණ්ඩයේ ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් (ලියාපදිංචි පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය).

(ආ) ඒ හෝ බී කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවන්ට සමාන තත්ත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත්කරුවන්.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මනින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමයිනාර්,
ජ. ජ. හා ප. පා. අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 4 වැනි දින,
ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන
වැඩ අංශය, රත්මලාන.

9–440—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශය

### ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය—රත්මලාන

### හලාවත ජලසම්පාදන ක්‍රමය

පහත සඳහන් අයිටම් සඳහා ටෙන්ඩර් කැඳවා ඇත.

අඩි 12,700 ක් පමණ දිගැති 8″ විෂ්කම්භයකින් යුත් ඇස්බැස්ටෝස් සිමෙන්ති නලයක්, ගැලුම් 2,10,000 ක් අල්ලන මුදුන් ටැංකියක් (අත්තිවාරම බැහැර කරමින්) වැඩි වතුර පොම්ප කිරීමේ ස්ථානයක් හා නල සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර 1969 නොවැම්බර් මස 28 වැනි දින පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පෙරවරු 10.05 ට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘති පත්‍ර මඟින් සිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධ වූ සියළු විස්තර හා තොරතුරුද ඉහත කී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි වන අතර, මෙයට අදාළ සැලැස්මද ඔහුගේ කාර්යාලයේ දී බලාගත හැකි වන්නේය.

3. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් 1969 ඔක්තෝබර් 19 වන දින දහවල් 12 ට පෙරාතුව ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

4. පහත සඳහන් වර්ගයනට අයත් කොන්ත්‍රාත්කරුවන් පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වන්නේය.

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඒ හෝ බී කාණ්ඩයේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් (ලියාපදිංචි පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය) ;

(ආ) ඒ හෝ බී කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවන්ට සමාන තත්ත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත්කරුවන්.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට යෝජිත වැඩය භාර ගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමයිනාර්,
ජ. ජ. හා ප. පා. වැඩ අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 4 වැනි දින,
ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන
වැඩ අංශය, රත්මලාන.

9–441—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදව

රාජකීය ලංකා ගුවන් හමුදවේ කටුනායක, වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ වහල අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 ඔක්තෝබර් 1 වැනි බදාදා පෙරවරු 10 දක්වා කොළඹ 2 ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ තැ. පෙ. 594, රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

2. කොළඹ 2 ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ප්‍රධාන වැඩ නිලධාරීන්ගෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල පිටපත් දෙකක් සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. අවශ්‍ය විස්තර එතුමා ගෙන් ලබා ගත හැක. 1969 සැප්තැම්බර් 30 වැනි අඟහරුවාද දහවල් 12 වනතුරු ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. අත්සන් කර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු ටෙන්ඩර් සීල් තබා, “ රාජකීය ලංකා ගුවන් හමුදවට අයත් කටුනායක වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ වහල අළුත්වැඩියා කිරීම පිළිබඳ ටෙන්ඩර් ” යනුවෙන් කවරයේ වම් පැත්තේ උඩ කෙලවරෙහි ලියා, “ සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, රාජකීය ලංකා ගුවන් හමුදව, තැ.පෙ. 594, කොළඹ ” යන ලිපිනයට එවිය යුතුය.

3. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කරන්නා වූද, රු. 1,10,000 කට නො අඩු රජයේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ලියා පදිංචි වී සිටින ටෙන්ඩර් කරුවන් පමණක් ටෙන්ඩර් එවීමට සුදුස්සෝ වෙති.

(අ) ලියාපදිංචිවීම ඔප්පු කිරීමට ලියවිලි, සහ

(ආ) ආපසු ලබාගත හැකි රු. 200 ක තැන්පත් ටෙන්ඩර් මුදලක් සඳහා සහ ආපසු ලබා ගත නොහැකි රු. 5 ටෙන්ඩර් ගාස්තුවක් සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ විට.

4. පහත සඳහන් අය ආපසු ගෙවන තැන්පත් මුදලෙන් නිදහස් වෙති.

(අ) සමුපකාර තොග ගබඩා ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවල රජයේ වාණිජ සංස්ථා, උදහරණ වශයෙන් : චීනයේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සංස්ථාව.

(ඉ) සමුපකාර සමිතිවල රෙජිස්ට්‍රාර් තැන විසින් පිළිගත් ග්‍රාම සංවර්ධන සමිති.

(ඊ) සමුපකාර සමිතිවල රෙජිස්ට්‍රාර් තැන විසින් පිළිගත් සමුපකාර සමිති.

5. ටෙන්ඩර් තැන්පත් මුදල හා ටෙන්ඩර් ගාස්තුව කොළඹ 2 ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී තැනට ගෙවිය යුතුය.

ඇම්. ඇස්. මාරුප්.
බලගන නායක,
ගුවන් හමුදපති වෙනුවට.

9–420—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ඔක්තෝබර් මස 5 දින පෙ.ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනානම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

අ. සේ. ගුනතිලක,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 සැප්තැම්බර් 4 දින දීය.

9–439—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්මේන්තුව

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාන්කුලම්හි නි.මි.යෝ.ක්‍ර. ගබඩා තැනීම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාන්කුලම්හි නි.මි.යෝ.ක්‍ර. ගබඩා තැනීම සඳහා 1969 ඔක්තෝබර් මස 4 වැනි සෙනසුරාද ප.ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 250ක් තැන්පත්කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7 හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් '' කොන්ත්‍රාත්කරුවන්ගේ සහටන් පොත '' ඉදිරිපත් කිරීමෙන් 1969 ඔක්තෝබර් මස 2 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ? තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම එවීමට හැකිවන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැකිය.

වී. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට

1969 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

9–394—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (ව්‍යාප්ති අංශය)

### කෘෂි–රසයනික ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම—1969–70 මහ කන්නය සඳහා

අංක. 14,689 දරණ, 1969 අගෝස්තු මස 29 වැනි දිනැති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද මගේ 1969 අගෝස්තු මස 18 වැනි දිනැති දැන්වීමට ඇතුලත් කර තිබූ උපලේඛනයේ පහත සඳහන් අයුරු සංශෝධනය කර ඇත:—

**කෘෂි–රසායනික ද්‍රව්‍ය**

(ඩිප්තරෙක්ස් දි. ඉ. ස. කු.) වචනය අස්කරන්න. 1/11 දරණ අංකයේ

(ඩයසිනොන් දි. ඉ. ස. කු.) වචනය අස්කරන්න. 1/13 දරණ අංකයේ

(ඩයසිනොන් තෙ. නැ. කු.) වචනය අස්කරන්න. 1/14 දරණ අංකයේ

(මැටසිල් තෙ. නැ. කු.) වචනය අස්කරන්න. 1/15 දරණ අංකයේ

(මෙටාසිස්රොක්ස් ආර්. 25) වචනය අස්කරන්න. 1/16 දරණ අංකයේ

(ඩියල්ඩ්‍රින්) වචනය අස්කරන්න. 1/19 දරණ අංකයේ

(ඩියල්ඩ්‍රින්) වචනය අස්කරන්න. 1/20 දරණ අංකයේ

(පෙනිට්‍රොතියොන්) වචනය අස්කරන්න. (අ) 1/22 දරණ අංකයේ

ප්‍රමාණය කියවිය යුත්තේ 100,000 නොව 10,000 වශයෙනි. (ආ) 1/22 දරණ අංකයේ

(බර්ලේන්) වචනය අස්කරන්න. 1/23 දරණ අංකයේ

(පොමොතියොන් උදා. අන්තියෝ) වචනය අස්කරන්න. 1/24 දරණ අංකයේ

**දීලීක නාසක**

(සෙරසාන් වෙට්) වචනය අස්කරන්න. එෆ්/1 දරණ අංකයේ
(කුප්‍රවිට්) වචනය අස්කරන්න. එෆ්/3 දරණ අංකයේ
(පර්බිම්, පර්මේට්) වචනය අස්කරන්න. එෆ්/4 දරණ අංකයේ
(අන්ත්‍රකෝල්) වචනය අස්කරන්න. එෆ්/5 දරණ අංකයේ
(කැප්ටන්) වචනය අස්කරන්න. එෆ්/6 දරණ අංකයේ
(ට්‍රුසැට්) වචනය අස්කරන්න. එෆ්/7 දරණ අංකයේ

**පළැටි නාසක**

(පැරකට්) වචනය අස්කරන්න. එච්/3 දරණ අංකයේ
(ඩැක්තල්) වචනය අස්කරන්න. එච්/4 දරණ අංකයේ
(රැම්රෝඩ්) වචනය අස්කරන්න. එච්/5 දරණ අංකයේ
(ප්‍රොපනීන්) වචනය අස්කරන්න. එච්/6 දරණ අංකයේ
(ලොරොක්ස්) වචනය අස්කරන්න. එච්/7 දරණ අංකයේ
(උදා. ගෙසාගාඩ්) වචනය අස්කරන්න. එච්/9 දරණ අංකයේ
(උදා. ලැසෝ) වචනය අස්කරන්න. එම්/10 දරණ අංකයේ

**වෙනත් දේ**

(උදා. සෙල්ඩියොන්) වචනය අස්කරන්න. එච්/1 දරණ අංකයේ

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙනුවට.

1969.9.5 දින,
කොළඹ 7, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 536.

9–415—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පේරාදෙණියේ පශු රෝහලට ආහාර සැපයීම

1969–70 වර්ෂය තුළදී මෙහි පහත දක්වෙන ද්‍රව්‍ය පේරාදෙණියේ පශු රෝහලට සැපයීම හා ගෙන ගොස් භාරදීම සඳහා සීල් තබා එවන ටෙන්ඩර් කොළඹ 1, ඩියුක් වීදියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.9.29 දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

(i) හොඳට වියලුනු ගොයම් පිදුරු—හොණ්ඩර 1,000යි.
(ii) පාන්—රාත්තල් 12,000යි.
(iii) බලු මස්—රාත්තල් 9,000යි.

2. මෙම ආහාර සැපයිය යුත්තේ 1969 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1970 සැප්තැම්බර් 30 වැනිද වනතෙක් ය.

3. කොළඹ 1, ඩියුක් වීදියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකගෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කර එවිය යුතුය. සියළුම ටෙන්ඩර් පත්‍ර නිවැරදිවත්, පැහැදිලිවත්, සම්පූර්ණ කළයුතු අතර, යම්කිසි වෙනසක් කළහොත්, ඒ එක් එක් වෙනස් කිරීමට කෙටි අත්සනද තැබිය යුතුය. නියමිත අයුරු සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ෆෝර්ම පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා සීල් තබා, ''සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඩියුක් වීදිය, කොළඹ 1'', යන ලිපිනයට එවිය යුතු අතර එම කවරයේ වම් උඩ කෙළවරේ ''පශු රෝහලට සැපයීම්'' යන්නද ලිවිය යුතු ය.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කර එවිය යුතුය. අතින්ම ගෙනවිත් භාර දියහැකි ටෙන්ඩර් පත්‍රද ඉහත සඳහන් ඡෙදයේ පරිදි, සකස් කර කොළඹ 1, ඩියුක් වීදියේ කෘෂිකර්ම උදපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළයුතු ය. ලියාපදිංචි කරනලද තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව යම්කිසි ටෙන්ඩර්කරුවකුට එම ටෙන්ඩර් විවෘත කිරීමට නියමිත දින සිට දින 4ක් ඇතුළතදී නොදැන්වුවහොත් ඒ සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් විමසිය යුතු ය.

5. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත දින 69.9.29 දවල් 12 තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. එම නිකුත් කිරීම කරනුයේ එක් එක් විෂයන් වෙනුවෙන් වෙන වෙනම රුපියල් 10 බැගින් තැන්පත් කළ

බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කළ යුත්තේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නැතහොත් කොළඹ යෝර්ක් වීදියේ, ලංකා බැංකු ශාඛාවේ ඇති අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ ගිනුමටය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන්නේ නම් එම බැංකුව විසින් සපයන පොදු ආකෘති පත්‍ර 118 සම්පූර්ණ කර, බැංකුවට ඉදිරිපත් කළයුතු ය.

6. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දින නියමිත වේලාවට ලැබී ඇති ටෙන්ඩර්, කොළඹ 1, ඩියුක් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේදී විවෘත කරනු ඇත.

7. නියමිත පෝර්මයේ ලියා නැති, නියමිත ලෙස කොන්දේසි ඉටුවී නැති ටෙන්ඩර්, ටෙන්ඩර් ලෙස නොසලකන අතර, නියමිත දිනෙන් පසු ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලිව ටෙන්ඩරයේ ලිවිය යුතුය.

9. පිළිගත් ටෙන්ඩර්කරුට, ඒ බව දන්වූ ද සිට දින දහයක් ඇතුළතදී ටෙන්ඩරයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල සම්පූර්ණ වටිනාකමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් සිදුවනු ඇත. පොරොන්දු පත්‍රය අත්සත් කරනු ලැබූ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරා ගත් ටෙන්ඩර්කරුට ඒ බව දන්වූද සිට දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රයකට බැඳීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනුවාත් හැර ඔහුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන් ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

10. ගිවිසුම් පත්‍රයට හෝ පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම ටෙන්ඩර්කරු විසින් දැරිය යුතු අතර, එම ගිවිසුමට හෝ පොරොන්දු පත්‍රයට අත්සන් තැබීම සඳහා සාක්ෂිකරුවන් දෙදෙනෙකු ද තමාගේ වියදමෙන් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කළයුතුය. මෙම සාක්ෂිකරුවන් මැනවැයි කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් සෑහීමකට පත් විය යුතුය.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමටත් ටෙන්ඩර් පත්‍රයක කොටසක් පමණක් පිළිගැනීමටත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත බලය ඇත්තේය.

12. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද වැඩ කරවීම සඳහා යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණි. මෙහි "ලාංකික" යන්නේ අදහස පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් ලංකා පුරවැසි බව ලබා ගත් අය යන්නයි.

13. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයින් වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර වලින්, කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළයුතු ය.

14. කොන්ත්‍රාත්කරුට භාර දියයුතු සියළුම දැන්වීම් ඔහුගේ අතටම භාර දුන්නොත් හෝ ඔහු විසින් ඉදිරිපත් කරඇති ලිපිනයට තැපැලෙන් යැවුව හොත් හෝ ඔහුගේ නියෝජිතයෙකුට භාර දුන්නොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නාසේ සැළකේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ, එම ලැයිස්තුවේ නම් සඳහන් අය සමග නම් යෙදී ඇති හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ විරුද්ධවත්‍ය ප්‍රකාශ කරන කවර අයකු සමග හෝ කොන් ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර, පේරාදෙනියේ පශු එන්නත්සාර මධ්‍යස්ථානයේ අධිකාරීගෙන් හෝ පේරාදෙණියේ පශු රෝහල භාර වෛද්‍ය අධිකාරීගෙන් හෝ ලියවිල්ලකින් විමසන්න.

අභයරත්න බණ්ඩාරනායක,
වැ. බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්වපාලන හා සෞඛ්‍ය).

1969 සැප්තැම්බර් 5 වැනි දින,
කොළඹ 1, ඩියුක් වීදියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

9–423—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

නැප්සක් අතින් ක්‍රියා කරවන ඉසිනය 222ක් දැනට තිබෙනතොගයකින් සැපයීම සඳහා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 සැප්තැම්බර් මස 27 වැනි දින ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතනට පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර පූර්වෝක්ත 1 ඡෙදයෙහි සඳහන්වන දිනයෙහි එකී වේලාවට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අධ්‍යක්ෂගේ කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

3. ටෙන්ඩර්, කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම නියෝජ්‍ය අධක්ෂ්‍යගෙන් (ව්‍යාප්ති) 1969 සැප්තැම්බර් 26 වැනි දින දවල් 12 තෙක් ඉල්ලුම් කොට ලබාගත හැකි ඉල්ලුම් පත්‍ර පෝර්මවල ලියා ඉදිරිපත් කළ යුතුය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ "නැප්සක් අතින් ක්‍රියා කරවන ඉසිනය 222ක් සැපයීම සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි තැපැල් මගින්ද, ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකු මගින් හෝ ටෙන්ඩර් පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දන්වීමට බලය දී සිටින පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කාර්‍යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡෙදයෙහි සඳහන් වූ විස්තරද ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය).

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50ක් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නමට ඕනෑම දිසාපති කාර්‍යාලයක හෝ තැන්පත්කර, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන් (ව්‍යාප්ති) ඉල්ලුම් කොට ඒ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

ඊ. එල්. එෆ්. අබේරත්න,
කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

1969 අගෝස්තු මස 31 වැනි දින.

9–414—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව—රත්නපුර දිස්ත්‍රික්කය

### සුළු වාරිකර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීම

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

| ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | | කර්මාන්තයේ නම |
|---|---|---|
| අටකලන් කෝරලය | ... | 1. උඩහ අමුණ |
| | | 2. හීනැටිකුඹුර අමුණ |
| | | 3. අඳුගම මහ අමුණ |
| | | 4. පොල්ගහවෙල පීල්ල |
| | | 5. බදුල්ලවෙලේ අමුණ |
| | | 6. උඩහවේල්ල අමුණ |
| | | 7. මරක්කයා අස්සැද්දුම වෙලේ අමුණ |
| | | 8. අහස්වෙල වැව |
| | | 9. කොටකෙතන අමුණ |
| කුකුල් කෝරලේ | ... | 1. අයගම පොත්තෙ ලියැද්ද වේල්ල |
| | | 2. තපස්සරකන්ද හික්ගහ කුඹුරුයාය වාරි මාර්ගය |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 සැප්තැම්බර් මස 16 දින දවල් 12 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවර වල බහා, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ " රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම

සඳහා ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 සැප්තැම්බර් මස 17 දින දවල් 12 ට පෙර, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුවේ වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුල දී රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින් වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 සැප්තැම්බර් මස 19 දින පෙ.ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

අමර හේවාමද්දුම,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
රත්නපුර දිස්ත්‍රික්කය.

රත්නපුර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ
කාර්යාලය,
1969 සැප්තැම්බර් මස 4 දින දීය.

9–396—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

ජාතික පොලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මහජන වෙළඳ හලට පොලිතින් ටියුබලර් කඩදසි භාණ්ඩ 32ක් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා මිළ ගණන්, කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 සැප්තැම්බර් 26 දින අ.භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

වැඩි විස්තර හා මිළ ගණන් ඉල්ලුම් පත්, කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇම්. ඩී. ඩබ්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969 සැප්තැම්බර් මස 4 වන දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

9–426—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1969–70 මුදල් වර්ෂයේ දෙවන භාගයට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉඩම් සංවර්ධන නිලධාරි යටතේ ඇති පහත සඳහන් ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම**

අල්ල, කන්තලේ, වාන් ඇල, ගල්මැටියාව, මොරවැව සහ ත්‍රිකුණාමලය නගරය යන ව්‍යාපාරයන්ට පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ගැනුම් යෝජනා පත් (ටෙන්ඩර් පත්) ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1969 සැප්තැම්බර් 27 දින පෙ.ව. 10 තෙක් භාරගනු ලැබේ :—

(1) 6" × 9" කළුගල් කියුබ්වලින්
(2) 4" තලාපු ගල් කියුබ්වලින්
(3) 2" තලාපු ගල් කියුබ්වලින්
(4) $1\frac{1}{2}$" තලාපු ගල් කියුබ්වලින්
(5) 1" තලාපු ගල් කියුබ්වලින්
(6) $\frac{3}{4}$" තලාපු ගල් කියුබ්වලින්
(7) $\frac{1}{2}$" තලාපු ගල් කියුබ්වලින්
(8) පිළිස්සූ ගඩොල් 1,000 බැගින් (පිළිගත් ප්‍රමාණය $8\frac{3}{4}$" × $2\frac{3}{4}$")
(9) ගංගා වැලි කියුබ්වලින්
(10) තම්බාපු හුණු බුසල්වලින්
(11) පුලුස්සන ලද හුණු බුසල්වලින්
(12) පොල් අතු ජෝඩු (7' × 18") 1,000 බැගින්

2. ගල්වලේදී හෝ පෝරණුවේදී හෝ වැඩපලේදී හෝ එක් එක් ද්‍රව්‍යයන් ඒ ඒ ව්‍යාපාරයන්ට සැපයිය හැකි මිළ ගණන් වෙන වෙනම සඳහන් කළ යුතුය (ගල්වල හෝ පෝරණුව ව්‍යාපාරයේ සිට සැ. 10ක් ඇතුළත විය යුතුය).

3. අනුමත කරන ලද ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් රුපියල් 50.00ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම කායර්‍යාලයේ හෝ කච්චේරියක තැන්පත් කර, එම රිසිට් පත මා වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම 1969 සැප්තැම්බර් 26 වැනි දින දහවල් 12 තෙක් මෙම කායර්‍යාලයේදී නිකුත් කරනු ලැබේ.

4. මෙම කායර්‍යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම 1969 සැප්තැම්බර් 27 වැනි දින පෙ.ව. 10ට පෙර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ මෙම කායර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කොටසේ '' ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර '' යන්න සඳහන් කර එය ඉඩම් සංවර්ධන නිලධාරි, ත්‍රිකුණාමලය යන ලිපිනයට එවිය යුතුය.

5. ඉඩම් සංවර්ධන නිලධාරිගේ නියමය පරිදි නියම කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රමාණය වරින්වර දන්වා දෙසතියක් ඇතුළත සැපයීමට පිළිගනු ලැබූ ගැනුම් යෝජනාකරුට හැකිවිය යුතු අතර, මා සමග පොරොන්දු පත්‍රයක අත්සන් තබා පොරොන්දුවකට බැඳිය යුතුය. සැපයීම පැහැර හරින හෝ සැපයීමට අපොහොසත් වන ගැනුම්කරුවන්ගේ නම, කොන්දේසි කඩ කළ අයගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට සිදුවන අතර තැන්පත් මුදල රජය සතු වනවා ඇත.

6. ගැනුම්කරුවන්ට 1969 සැප්තැම්බර් 27 වැනි දින පෙ.ව. 10.15 ට ගැනුම් යෝජනා පත් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටිය හැක.

7. හේතු නොදන්වා ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීම, එහි කොටසක් පිළිගැනීම හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ඉඩම් සංවර්ධන නිලධාරී සතුය.

8. වැඩි විස්තර පහත අත්සන් කරන නිලධාරි තැනගෙන් ලබාගත හැක

එච්. ආර්. එල්. ද අල්විස්,
ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන නිලධාරි.

ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන කාර්‍යාලයේ දීය.
1969 සැප්තැම්බර් මස 1 වැනි දින.

9–348—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## වනසත්ව දෙපාර්තමේන්තුව

රුහුණු ජාතික උද්‍යානයේ මහසීලව හි වැහි වතුර ගබඩා කරන ටැන්කියක් තැනීම සඳහා සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ, වනසත්ව දෙපාර්තමේන්තුවේ, වනසත්ව භාරකාර විසින් 1969 සැප්තැම්බර් මස 30 වැනි දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ.

2. 1969 සැප්තැම්බර් මස 26 වැනි දින පස්වරු 3 දක්වා කාර්‍යාල වේලාවන්හිදී, ආපසු ලබාගත හැකි රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

3. මෙම සේවාව සඳහා ටෙන්ඩර් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ " රුහුණු ජාතික උද්‍යානයේ මහසීලව හි වැහි වතුර ගබඩා කරන ටැන්කියක් තැනීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් ලියා ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම කාර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. මෙම වතුර ටැන්කියේ නිර්මාණය හා අය පත්‍රය මෙම කාර්‍යාලයේදී 1969 සැප්තැම්බර් මස 26 වැනි දින පස්වරු 3 දක්වා වැඩ කරන දිනයන්හිදී පරීක්ෂා කළ හැකිය.

5. ටෙන්ඩරයට අදාල කොන්දේසි ටෙන්ඩර් පෝර්මයේ මුල් පිටුවේ සඳහන් කර ඇත.

ඩබ්ලියු. එල්. ඊ. ද අල්විස්,
වැඩබලන වනසත්ව භාරකාර.

1969 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ,
වනසත්ව දෙපාර්තමේන්තුවේ දීය.

9–361—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

1969 නොවැම්බර් මස 20 වැනි දින පෙරවරු 10 වන තෙක් පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(1) ගල් අඟුරු
(2) ෆේරෝ සිලිකන්
(3) ෆේරෝ පොස්පරස්
(4) සිලිකන් කාබයිඩ් බ්‍රිකට්ස්
(5) කැල්සියම් කාබයිඩ්
(6) ගල් අඟුරු කුඩු
(7) ගල් අඟුරු තාර
(8) බෙන්ටනයිට් මැටි
(9) ලින්සීඩ් තෙල්
(10) යකඩ බෝල
(11) දල්වන පයිප්ප

රුපියල් 100 ක් ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම් කොල ලබා ගත හැක. ටෙන්ඩර් පෝරම කොල ලබා ගැනීම සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් 1969 නොවැම්බර් මස 19 වැනි දින දහවල් 12 න් පසුව බාර නොගනු ලබන අතර, ටෙන්ඩර් පෝරම කොල ටෙන්ඩරය අවසන් වන දින, නිකුත් කරනු නොලැබේ.

අවලංගු කරන ලද ටෙන්ඩර් පිටපත් රු. 10 ක් ගෙවීමෙන් ලබාගත හැක.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව, මිළට ගැණුම් නිලධාරි,
අංක 242, හැව්ලොක් පාර,
කොළඹ 5.

9–339—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇල්ඩබලිව්/8/5 (II)

## පුත්තලම් කච්චේරිය

රු. 15,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියාපදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිතිවලින් මෙහි සඳහන් තැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1969 ඔක්තෝබර් මස 12 වැනි ඉරුදින සවස 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

(1) සේරුකැලේ-මුදලක්කුලිය මධ්‍යම පංති ව්‍යාපාර පාරේ හියුම්-පයිප්ප බෝක්කු 10 ක් තැනීම.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැන ගත හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබා ගත හැකි ආකෘති පත් මගින් එකී එක් එක් වැඩය සඳහා වෙන වෙනම පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. එකී එක් එක් වැඩය සඳහා රු. 50 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබාගත හැකිය. එම ටෙන්ඩර් ආකෘති පත් 1969 ඔක්තෝබර් මස 11 වැනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්, පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 සැප්තැම්බර් මස 2 වැනි දින,
පුත්තලම කච්චේරියේ දී ය.

9–364—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### පී.වී.සී. බහන් යනාදිය සපයා භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969ක් වූ ඔක්තෝබර් මස 26 වන ඉරිද පූ.භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ පාසන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙහිදී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්ෂ 1969ක් වූ ඔක්තෝබර් මස 22 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969ක් වූ ඔක්තෝබර් මස 26 වන ඉරිද පූ.භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්‍යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 සැප්තැම්බර් මස 12 වැනි දින.

9–308—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : එල්. එම්. 1505 (2).

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩය සඳහා 1969 සැප්තැම්බර් මස 19 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි වියයුතු මුදල |
|---|---|
| අප්සල්ලාගොඩ ජනපදයට නල මගින් ජලය සැපයීම ... | රු. 20,000 |

2. ඉහත සඳහන් වැඩය ඒ ඉදිරියෙන් සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිති වලට සහ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 1969 සැප්තැම්බර් මස 15 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපෙක්ෂකයින් විසින් මහනුවර කච්චේරියේ තමන් විසින් ඉල්ලුම් කරන වැඩය වෙනුවෙන් රු. 100.00 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛන ගත තැපෑලෙන් ඉහත සඳහන් ලිපිනයට යැවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් උඩ කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම් ගාළු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 19 වෙනි දින සවස 2.30 ට ඉහත කී 357 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු සහ නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ සඳහා මේ කොන්දේසි සපුරා ලීමට කොන්ත්‍රාත්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන නිලධාරියාට විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇති නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත් කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම් පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ රටවැසියෙකු වශයෙන් අදහස් කරන අතර, එවැන්නක් එකී පාඨයට ඇතුළත් වේ.

මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීම සඳහා සෑම කොට්ඨාශයකටම සාධාරණ වූ ද කම්කරු වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින්පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූ ද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුය. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලබන කම්කරුවන් හා සම්බන්ධිත ඔහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විධිමත් පරිදි බලය දෙනු ලැබූ නිලධාරියෙකුට ඉඩම දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

7. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළ විට මහනුවර දිසාපතිගෙන් ලබා ගත හැකිය.

ඇම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

1969 අගෝස්තු මස 23 වැනි දින,
මහනුවර කච්චේරියේ දී ය.

9–321—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මුද්‍රා තබා වෙන් වශයෙන් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1969 සැප්තැම්බර් මස 24 වෙනි බදාදා පූ. භා. 10.00 වන තෙක් භාරගනු ලැබේ.

(1) **කිලිනොච්චි**

යෝජිත ඩිපෝවේ ගොඩනැගිලි, පාරවල් සහ අංගන ඉදි කිරීම

(2) **මාහෝ**

යෝජිත ඩිපෝවේ ගොඩනැගිලි, පාරවල් සහ අංගන ඉදි කිරීම.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි අතර, අදල සැලසුම් පත් යනාදිය ඔහුගේ කායඪාලයේදී පරීක්ෂාකර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 4,00,000 ක් හෝ එයට අධික වැය වන කර්මාන්ත සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. එවැනි කොන්ත්‍රාත් කරුවන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන අනුමත කළහොත් පමණක් අංක 1 සහ 2 දරණ කර්මාන්තයන් සඳහා රු. 500 බැගින් වන ටෙන්ඩර් ඇප මුදල් සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රු. 25ක මුදලක් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරණ කුවිතාන්සි ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට 1969.9.20 වෙනි සෙනසුරාද මධ්‍යාහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. මෙම කර්මාන්ත සඳහා ටෙන්ඩර් කිරීමට ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අතිරේකව රු. 5,00,000 වැය වන සිවිල් ඉංජිනේරු කර්මාන්තයන් අවුරුද්දක් ඇතුලත සතුටුදායක අන්දමින් නිම කර භාර දීමට හැකියාවක් හා තත්වයක් ඇති බැව් ඔප්පු කිරීමට අවශ්‍ය සාධකයන් මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට.

9–430—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල පිහිටි පාසැල්වලට " ඇදිහැස " කිරි විස්කෝතු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි—1969–70**

වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ පහත දැක්වෙන කායඪයන් සඳහා සීල් තබන ලද පිටපත් 2කින් යුත් ටැන්ඩර් පත්‍ර, 1969 සැප්තැම්බර් මස 26 වැනි දින පෙරවරු 10.00 දක්වා, බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

සැපයීමේ මධ්‍යස්ථානවලින් ඇදිහැස කිරි විස්කෝතු පාසැල්වලට ප්‍රවාහනය කිරීම.

(1) පහත දැක්වෙන අයුරු විස්කෝතු අසුරා ඇත :—

19" × 11" × 9" ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටිවල රා. 20 බැගින් අසුරා ඇත (ආසන්න වශයෙන්).

**පහත සඳහන් සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—**

**බදුල්ල සැපයීමේ මධ්‍යස්ථානයේ සිට—**

1. බදුල්ල, මහියංගනය, සොරණාතොට, **පස්සර**, මීගහකිවුල, බිබිල සහ මොනරාගල මණ්ඩලය

**බණ්ඩාරවෙල සැපයීමේ මධ්‍යස්ථානයේ සිට—**

2. බණ්ඩාරවෙල මණ්ඩලය

**හපුතලේ සැපයීම් මධ්‍යස්ථානයේ සිට—**

3. හපුතලේ සහ වැල්ලවාය මණ්ඩලය

**2.** බණ්ඩාරවෙල ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල ඉල්ලුම් කළ යුතුයි. බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ බදුල්ල කච්චේරියේ හෝ රු. 100ක් තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන්, 1969 සැප්තැම්බර් 24 වනදා දහවල් 12 දක්වා, ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක. අනුමත කරන ලද සමිති විසින් ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යයි,

3. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් 1969 සැප්තැම්බර් 26 වැනි දින පෙරවරු 10.30 ට, බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, ටෙන්ඩර් භාරදීමට බලාපොරොත්තු වන අය තමා සතුව රු. 10,000කට නොඅඩු වටිනාකම ඇති නිශ්චල දේපොල ඇති බවට, තම ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි තුමාගෙන් මෑතකදී ලබාගත් සහතිකයක්ද ඉල්ලුම්කරු නමින් ලියාපදිංචි කරන ලද, මේ වර්ෂයට වලංගු බලපත්‍ර ඇති ලොරියක්, 2ක් වත් ඇති බවට සෑහෙන සාක්ෂිද, බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

5. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර, එකී සමිතියට මෙම සේවාව ඉටු කිරීමට හැකියාවක් ඇති ලොරි සේවයක් ඇති බවට, සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ ගෙන් හෝ කම්කරු කොමසාරිස්ගෙන් හෝ ලබාගත් සහතිකයක්, බණ්ඩාර වෙල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් භාර නොගැනීමට හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමට බලය, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතු වේ. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට, සති 6ක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුය.

7. අමතර විස්තර සඳහා බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ඉල්ලුම් කරන්න.

පී. බී. රත්නායක,
වැ.බ. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
බණ්ඩාරවෙල.

1969 සැප්තැම්බර් මස 2 වැනි දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

9–349—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—මාතර

### මාතර, වැලිගම සහ කහදාව සැපයීම් මධ්‍යස්ථානවල සිට පාසල් කරා ඇදිහැස විස්කෝතු ගෙනයාම හා භාරදීම—1969–70

වර්ෂ 1969 ක් වූ ඔක්තෝබර් මස 1 දින සිට 1970 සැප්තැම්බර් මස 30 දින දක්වා කාලය තුළ පහත සඳහන් සැපයීම් මධ්‍යස්ථානවල සිට එකී මණ්ඩලවල පාසැල් වෙත, පෙට්ටියක රාත්තල් 20 ක් පමණ ඇති කාඩ් බෝඩ් පෙට්ටිවල අසුරන ලද ඇදිහැස විස්කෝතු පාසල් වාරයකට දෙවතාවක් බැගින් ප්‍රවාහණය කිරීම සහ භාරදීම යන සේවයන් සඳහා වෙන් වෙන් වශයෙන් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 27 දින පෙරවරු 10.30 දක්වා මාතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

පහත සඳහන් කොටස් 7 සඳහා වෙන වෙනම ටෙන්ඩර් 7 ක් ඉදිරිපත් කළ යුතු වේ:—

(1) මාතර සැපයීම් මධ්‍යස්ථානයේ සිට දෙවිනුවර සහ මාතර මණ්ඩලවල සියළුම පාසැල්වලට, එක ටෙන්ඩර් පත්‍රයක් ;

(2) මාතර සැපයීම් මධ්‍යස්ථානයේ සිට කඹුරුපිටිය සහ හක්මණ මණ්ඩල වල සියළුම පාසැල්වලට, එක ටෙන්ඩර් පත්‍රයක් ;

(3) වැලිගම සැපයීම් මධ්‍යස්ථානයේ සිට වැලිගම මණ්ඩලයේ සියළුම පාසැල්වලට එක ටෙන්ඩර් පත්‍රයක් ;

(4) වැලිගම සැපයීම් මධ්‍යස්ථානයේ සිට අකුරැස්ස සහ දෙනියාය මණ්ඩල වල සියලුම පාසැල්වලට, එක ටෙන්ඩර් පත්‍රයක් ;

(5) කහදාව සැපයීම් මධ්‍යස්ථානයේ සිට තිස්ස I සහ තිස්ස II මණ්ඩල වල පාසැල්වලට, එක ටෙන්ඩර් පත්‍රයක් ;

(6) කහදාව සැපයීම් මධ්‍යස්ථානයේ සිට බෙලිඅත්ත I සහ බෙලිඅත්ත II යන මණ්ඩලවල පාසැල්වලට, එක ටෙන්ඩර් පත්‍රයක් ;

(7) කහදාව සැපයීම් මධ්‍යස්ථානයේ සිට මුල්ගිරිගල I සහ මුල්ගිරිගල II යන මණ්ඩලවල පාසැල්වලට, එක ටෙන්ඩර් පත්‍රයක්.

ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට ප්‍රථම ටෙන්ඩර් භාර දීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන් විසින් මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ඉල්ලුම්කරුට අයත් නිශ්චල දේපලවල වටිනාකම යටත් පිරිසෙයින් රු. 10,000 ක් (දහදාහක්) වත් වන බව ඒත්තු යන අන්දමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. තවද, එක් කොටසක් සඳහා ටෙන්ඩර් පත්‍රයක් එවන ඉල්ලුම් කරුවකුට ඒ කොටස සඳහා යටත් පිරිසෙයින් එක ලොරියක්වත් අයිතිව තිබිය යුතු අතර, ඉල්ලුම්කරුගේ නමින් ලියාපදිංචි කරණ ලද බවටත් අදාල ආදායම් වර්ෂයට බලපත්‍ර ලබා ඇති බවටත්, සතුටුදායක අන්දමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර කම්කරු සමිති මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රථම මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත, සමුපකාර සංවර්ධන කොමසාරිස් තුමාගෙන් (සමුපකාර සමිති වෙනුවෙන්), ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගෙන් (ග්‍රාම සංවර්ධන සමිති වෙනුවෙන්) හා කම්කරු කොමසාරිස් තුමාගෙන් (සමුපකාර කම්කරු සමිති වෙනුවෙන්) එකී සමිතියට මෙම වැඩය කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි. එක අධ්‍යාපන ප්‍රදේශයකට වැඩියෙන් ඇදිහැස විස්කෝතු ප්‍රවාහණය සඳහා යම්කිසි ඉල්ලුම්කරුවකු ඉදිරිපත් වන්නේ නම් එක අධ්‍යාපන ප්‍රදේශයක් සඳහා යටත් පිරිසෙයින් ලොරි 2 ක් වත් තිබිය යුතුයි.

මාතර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයෙන් 1969 සැප්තැම්බර් මස 26 දින පස්වරු 3.00 දක්වා ලබාගත හැකි පෝරමවල, පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 50 ක් (පනහක්) කච්චේරියේ තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ද ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ලීමෙන් පසුවය. අමතර විස්තර මාතර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල යෙන් ලබාගත හැක.

කේ. පතිරණ-විමලධර්ම,
මාතර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

1969 අගෝස්තු 31 වෙනි දින,
මාතර, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

9–267—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපර්තමේන්තුව

### බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, බතල ගොඩ ගොවිපලේ ලෙලි පොල් 45,000 ක් පමණ හා වාරියපොල ගොවිපලේ ලෙලි පොල් 25,000 ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1969 සැප්තැම්බර් මස 30 වන දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුලත සම්පූර්ණ පොල් තොගය ගොවිපලේ කළමනාකරුට එකවර මුදල් ගෙවා භාරගෙන එකී ගොවිපලෙන් පිටත ගෙනයා යුතුයි.

පොල් තොගය භාර ගැනීමේදී කිසිම පිළිවෙලක වර්ග කිරීමකට ඉඩ නැත. එමෙන්ම කුණුවූ හෝ කුඩාවූ හෝ වශයෙන් වර්ග කිරීමටද ඉඩ නැත.

2. පේරාදෙණියේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබා ගන්නා ලද පෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා '' පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති '' නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරෙහි බතලගොඩ/වාරියපොල ගොවිපලේ ලෙලි පොල් මිළට ගැනීම ක්‍රියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. 1969 සැප්තැම්බර් මස 30 වන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරුවෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරිය වුන්ගේ නාම ලේඛණයට ඇතුලත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වෙතොත් එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැත හොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර '' බතලගොඩ/වාරිය-පොල ගොවිපලේ ලෙලි පොල් මිළට ගැනීම සඳහා ටෙන්ඩර් '' යනු වෙන්ද, ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කොට '' පේරාදෙණි යේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාල යේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන '' වෙත ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින

හතරක් ඇතුලත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමතිනම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියානැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර් කරුවන් නම, ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකලහොත් ඔහුගේ ඇප මුදල රාජ සන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේත් කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේවූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්තුකරුවා යම්කිසි විදියකින් අසමත් වූවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගුවීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එලැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා ''ලාංකික'' යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත,චැක්රෝල් පොත්,පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කලාසේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපණතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛණයේ තනි තනිව හෝ ලේඛණයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමඟ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට හැඟි යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ/වාරියපොල ගොවිපලවල කළමනාකරුවන්ගෙන් දැනගත හැකිය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල්).

1969 අගෝස්තු මස 29 දින,
පේරාදෙණියේ දීය.

9–367—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව — කළුතර

1969 සැප්තැම්බර් මස 27 වැනිදා පෙ.ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| (1) ක/පතහවත්ත විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ලක්, වැසිකිළි දෙකක් හා ලිඳක් තැනීම |

**සංලක්ෂාය.**—ක = කළුතර දිස්ත්‍රික්කය.

2. කළුතර අධ්‍යාපන කාර්‍යාලයේ හෝ කළුතරින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්‍යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රුපියල් 35,000 කට හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1969 සැප්තැම්බර් මස 26 වැනි දා ප.ව. 3.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හ සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළුම විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව අධ්‍යාපන කාර්‍යාලයේ, කාර්‍යාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 27 වැනි දා පෙ.ව. 10.30 ට කළුතර අධ්‍යාපන කාර්‍යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරුගේ හෝ ඔහුගේ නියෝජිත යෙකු විසින් පුද්ගලිකව මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේ ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා පෙ.ව. 10.30 ට මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු කමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ කාර්‍යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්‍යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දුන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩී. වී. බී. විලත්ගමුව,<br>
මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1969 සැප්තැම්බර් මස 4 වැනි දින,<br>
මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේ දී ය.

9–398/2—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කොළඹ දකුණ ප්‍රදේශයේ පාසැල්වලට කිරි, විස්කෝතු ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම

මෙහි පහත දක්වෙන සේවය සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

මැලිබන් හා ලංකා විස්කෝතු සමාගමේ විස්කෝතු නිෂ්පාදන ස්ථානවල සිට රාත්තල් 20 පෙට්ටිවල අසුරන ලද විස්කෝතු පහත දක්වෙන මණ්ඩලයන්හි පිහිටි පාසැල් වෙත ප්‍රවාහනය කිරීම :—

| | |
|---|---|
| (1) මැද කොළඹ | (7) කොලොන්නාව |
| (2) උතුරු කොළඹ | (8) කොට්ටාව |
| (3) දකුණු කොළඹ | (9) හෝමගම |
| (4) දෙහිවල-ගල්කිස්ස | (10) අවිස්සාවේල්ල |
| (5) මොරටුව | (11) කැස්බෑව |
| (6) කෝට්ටේ | (12) බොරැල්ල. |

ඉහත සඳහන් මණ්ඩල සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 7, ග්‍රීන්පාත් හි, දකුණු කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 1969 සැප්තැම්බර් 26 වැනි දින පෙරවරු 10.30 තෙක් භාරගනු ලැබේ.

කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රු. 100 ක තැන්පත් මුදලක්, කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත් අයට 1969 සැප්තැම්බර් මස 24 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම්, එකී මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් කොළඹ 7, ග්‍රීන්පාත් හි, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 10,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි, ප්‍රාදේශීය ආදායම් පාලක නිළධාරිගෙන් සහතිකයක් හා මණ්ඩල දෙකකට වැඩි සංඛ්‍යාවකට ටෙන්ඩර් ගාස්තු ඉදිරිපත් කරන්නේ නම්, ඉල්ලුම්කරුගේ නමට ලියාපදිංචි කරන ලද 1969 වර්ෂයේ බලපත්‍ර ලබාගත් ලොරි දෙකක් වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. මූලික අවශ්‍ය තාවය ඉහත කී පරිදි ලොරි දෙකක් වන අතර, ප්‍රවාහනය භාරගන්නා මණ්ඩල ගණන අනුවත්, ඒ මණ්ඩලවල ගමනා ගමන පහසුකම් අනුවත්, අතිරේකව පාවිච්චි කළයුතු ලොරි ගණන ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කළ යුතු වේ. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට පෙර, කොළඹ 7, ග්‍රීන්පාත් හි, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත, සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇනවුම් පත් ලැබී සතියක් ඇතුළත පාසැල්වලට විස්කෝතු ගෙන ගොස් භාරදීම නිම කළ යුතුවේ. ටෙන්ඩරයක් සම්පූර්ණ යෙන්ම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි කොටසක් පමණක් භාරගැනීමේ හෝ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල්දිය යුතුය. ටෙන්ඩර් පිළිබඳ සියළුම කොන්දේසි හා වෙනත් විස්තර, කොළඹ ග්‍රීන්පාත් හි, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, පාලන නිළධාරිගෙන් ලබාගත හැකිය.

වී. ජී. බී. මුණසිංහ,<br>
කො. ප්‍ර. අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 5 වැනි දින,<br>
කොළඹ 7, ග්‍රීන්පාත් හි,<br>
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

9–413—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 26 වෙනි දින ප. ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| අ/හොරොව්පොතාන මහා විද්‍යාලය ... | වානිජ විද්‍යා ගොඩනැගිල්ල තැනීම |

සංලක්ෂ්‍යය.—අ = අනුරාධපුර දිස්ත්‍රික්කය,

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 19,000 ට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 24 ද දවල් 12.00 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරණු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණි.

3. දෙවෙනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිති වලටද මේ වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය. ඔවුන් දෙවෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වි ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වෙනි හා 3 වෙනි ඡේදවල සඳහන් පරිදි අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගතහැකි අතර සැලැස්ම ආදියද බලාගතහැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 26 වැනිද ප. ව. 2.30ට අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරණ නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරණ ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැති විය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වෙතොත් අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත්කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරණ ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරණ ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. ගුණසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අනුරාධපුර.

1969 සැප්තැම්බර් 4 වැනිද,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදීය.

9–400—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාද පෙ.ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාසැලේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. | කො/අධ්‍යාපන දෙපාර්තමේන්තුව—ග්‍රීන් පාත්, කොළඹ 7 | කාර්යාල ගොඩනැගිල්ලක් තැනීම |
| 2. | කො/ජයවර්ධන පුර පිරිමි මහා විද්‍යාලය ... | අළුත්වැඩියාව සහ ජල සේවය |
| 3. | කො/කොරලවැල්ල රෝ. ක. විද්‍යාලය ... | අළුත්වැඩියාව |
| 4. | කො/ග්‍රැන්ඩ්පාස් ශ්‍රී සංඝබෝධි විද්‍යාලය ... | වැසිකිළි (ඉතිරි වැඩ) |
| 5. | කො/ශාන්ත ඇන්ඩෘ පිරිමි විද්‍යාලය ලුනුපොකුණ .. | අළුත්වැඩියාව |

**සංලක්ෂය.**—කො = කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායභාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කායභාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1—රු. 40,000, අංක 2—රු. 21,000, අංක 3, 4 සහ 5 රු. 10,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 24 වැනි බදාද පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2 මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩ නැගිලි ශාඛාවෙන් හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන්, ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව, ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන කායභාලයේ කායභාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා පෙ.ව. 10.30 ට ග්‍රීන්පාත් කොළඹ 7, අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. ජී. බී. මුණසිංහ,
අධ්‍යාපනාධ්‍යක්ෂ, කොළඹ ප්‍රදේශය.

1969 සැප්තැම්බර් මස 5 වැනි දින,
කොළඹ 7, ග්‍රීන්පාත්,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී.

9–421—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පේරාදෙණිය, ලංකා විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා සහ භූ විද්‍යා අංශවලට අතිරේක දුව භාණ්ඩ සැපයීම සඳහාවූ ටෙන්ඩර් පත්, පේරාදෙණිය ර.වැ.දෙ. ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු කායභාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 15 වැනි බදාද පෙරවරු 11.00 වන තෙක් බාර ගනු ලැබේ.

2. පේරාදෙණිය, විශ්ව විද්‍යාල යෝජනා ක්‍රමයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායභාලයෙහිදී බලාගැනීමට පිළිවන.

3. ර.වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 22,000කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි දී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ජ්. රාජපඩවම්,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු,
සරසවි යෝජනා ක්‍රමය, පේරාදෙණිය.

ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු කායභාලය,
රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
විශ්ව විද්‍යාල යෝජනා ක්‍රමය,
පේරාදෙණිය,
1969 අගෝස්තු මස 28 වැනි දින.

9–407—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### රත්නපුරේ තැපැල් කාර්‍යාලයක් සඳහා ගොඩනැගිල්ලක් තැනීම

ඉහත සඳහන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය රාශියක් වුවමනා වී තිබේ. මොරටුව-රත්මලානේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි වන සැපයුම්කරුවන්ගෙන් පමණක් ඒ ඒ අවස්ථාවන්හිදී ලබා ගන්නා ලද මිළ ගණන් අනුව අවශ්‍ය ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය සපයා ගනු ලැබේ.

ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය සැපයීම සඳහා ලියාපදිංචිවීමට කැමති අය විසින් 69.9.27 දින දවල් 12.00 ට පෙර මොරටුව, රත්මලානේ, ර.වැ.දෙ. ගොඩනැගිලි ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත, ස්වකීය නම් හා ලිපිනයන් ඉදිරිපත් කළ යුතුයි. ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම—රත්නපුර තැපැල් කාර්‍යාලය" යනුවෙන් සඳහන් කළ යුතුයි. ද්‍රව්‍ය සහ උපකරණ සැපයීමට ලියාපදිංචිවීම සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍ර සමඟ පහත සඳහන් විස්තරද සැපයිය යුතුය.

(අ) ඉල්ලුම්කරුට සැපයිය හැකි කුමන ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍යදැයි දක්වෙන ලැයිස්තුවක් ;

(ආ) ලොරි, ටිපර් සහ ට්‍රැක්ටර් වැනි තමන් සතු වාහනවල ලියාපදිංචි කිරීමේ අංක දක්වෙන ලැයිස්තුවක් (එක් එක් වාහනය මේ අවුරුද්ද සඳහා ලියාපදිංචි කොට සහ රක්ෂණය කොට තිබේදැයි සඳහන් කළ යුතුය) ;

(ඉ) මෙවැනි සැපයීම් වැඩ කොට ලත් පළපුරුද්ද සනාථ කිරීමේ ලිඛිත සාධක.

අවශ්‍ය වී තිබෙන උපකරණ පහත සඳහන් වේ :—

1. පිරවීම සඳහා බොරලු පස්
2. අඟල් 6 සිට අඟල් 9 දක්වා සක්ක ගල්
3. අඟල් 2 කළුගල්
4. අඟල් 1½ කළුගල්
5. අඟල් 1 කළුගල්
6. අඟල් ¾ කළුගල්
7. ගංගා වැලි
8. ගඩොල්
9. අලුහුණු හා පුළුච්චාපු හුණු
10. පලංචි සඳහා උණ බම්බු
11. වැරැටි හුණු
12. ඉරාපු ලී

එච්. සී. ඩී. ද සිල්වා,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු (ගොඩනැගිලි).

කැ. පෙ. 6,
මොරටුව.

9–323—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### වවුනියාවේ දිසා වන නිලධාරි කාර්‍යාලයේ විශේෂ අළුත්වැඩියා කිරීම

වහලය සහ වැට ප්‍රකෘතිමත් කිරීම සඳහාවූ ටෙන්ඩර් පත්, යාපනයේ, ර.වැ.දෙ. අධිකාරි ඉංජිනේරු කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 8 වැනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. වවුනියාවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්‍යාලයේදී බලාගැනීමට පිළිවන.

3. ර.වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 11,000කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ස. පත්මනාදන්,
අධිකාරි,
ඉංජිනේරු,උ.කො.

අධිකාරි ඉංජිනේරු කාර්‍යාලය,
ර. වැ. දෙ., යාපනය,
1969 සැප්තැම්බර් මස 1 වැනි දින.

9–318—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1969–70 මුදල් වර්ෂය තුළ දර සැපයීම

ඉහත සඳහන් කරුණ පිළිබඳව 1969.8.22 වෙනි දින අංක 14,868 දරණ ගැසට් පත්‍රයේ සිංහල නිවේදනයේ 1,459 වෙනි පිටුවේ 6 වෙනි ඡෙදයේ සඳහන් ටෙන්ඩර් විවෘත කරන දිනය 1968.9.8 වෙනි දින නොව 1969.9.14 වෙනි දිනට සංශෝධනය කළ බව මෙයින් දන්වමි.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1969.8.30.

9–271—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ටෙන්ඩර් ප්‍රතිඵල

### දෙමළ යතුරු ලියන සැපයීම

| ඉදිරිපත්වූ ටෙන්ඩර් කරුවන්ගේ ගණන | ද්‍රව්‍ය විස්තරය | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | ටෙන්ඩරය පියවූ දිනය | පිළිගත් මිළ ගණන් |
|---|---|---|---|---|
| 3 ... | දෙමළ යතුරු ලියන කොන්/ඇල්/ඒ/425/69 | — ... | 69.4.29 ... | මිලදීගැන්මක් නොකරන ලදි. ලැබී ඇති ටෙන්ඩර් සියල්ල ප්‍රතික්ෂේප කරන්නට යෙදුනි. |

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 සැප්තැම්බර් මස 12 වෙනි දින,
ලංකාළඹ දී ය.

## ටෙන්ඩර් ප්‍රතිඵල

### මෙරට සාදන ලද කම්බි ඇණ සැපයීම

| විෂය අංකය | සැපයීමේ හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|---|
| 1 | කම්බි ඇණ, පැතලි හිස යකඩ හොණ්ඩරය බැගින් බහාලූ පෙට්ටිවල හෝ භාජනවල 1″ × 14 මිම්ම | 3 යි | සී/ස. නවලෝක ඉන්ඩස්ට්‍රීස් | හොණ්ඩරයක් රු. 83.70 බැගින් |
| 2 | 1½″ × 14 මිම්ම | — | එම | හොණ්ඩරයක් රු. 82.90 බැගින් |
| 3 | 2″ × 12 මිම්ම | — | එම | හොණ්ඩරයක් රු. 77.75 බැගින් |
| 4 | 3″ × 9 මිම්ම | — | එම | හොණ්ඩරයක් රු. 69.70 බැගින් |
| 5 | 3½″ × 8 මිම්ම | — | එම | හොණ්ඩරයක් රු. 67.75 බැගින් |
| 6 | 4″ × 6 මිම්ම | — | සී./ස. මහාරාජා සංවිධානය | හොණ්ඩරයක් රු. 65.00 බැගින් |
| 7 | 5″ × 5 මිම්ම | — | සී/ස. නවලෝක ඉන්ඩස්ට්‍රීස් | හොණ්ඩරයක් රු. 63.80 බැගින් |
| 8 | 6″ × 4 මිම්ම | — | සී/ස. මහාරාජ සංවිධානය | හොණ්ඩරයක් රු. 56.00 බැගින් |
| 9 | ½″ × 18 මිම්ම | — | සෙන්ට් ඇන්තනීස් එන්ටර් ප්‍රයිසස් | හොණ්ඩරයක් රු. 95.23 බැගින් |
| 10 | ¾″ × 15 මිම්ම | — | එම | හොණ්ඩරයක් රු. 91.99 බැගින් |
| 11 | 1¼″ × 14 මිම්ම | — | සී/ස. නවලෝක ඉන්ඩස්ට්‍රීස් | හොණ්ඩරයක් රු. 83.70 බැගින් |

සැ. ඕ. පෙ. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 සැප්තැම්බර් මස 12 වෙනි දින,
කොළඹ දී ය.

## ටෙන්ඩර් ප්‍රතිඵල

### මෙරට සාදන ලද සපත්තු ඔප ද්‍රව්‍ය සැපයීම

| විෂය අංකය | සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|---|
| 1 | මෙරට සාදන ලද සපත්තු ඔප ද්‍රව්‍ය කළු පාට ('කිවි' වලට සමාන) ලොකු ප්‍රමාණයේ ටින්, ශුද්ධ බර දල වශයෙන් අවුන්ස 1¼ ක් (ග්‍රෑම් 36.2 පමණ) ග්‍රොස් එක බැගින් අසුරන ලද පෙට්ටිවල | 4 යි | සී/ස. කලම්බු ඒජන්සීස් | රු. 96.48, ග්‍රොස් එකක් (''කොලැග්'' වර්ගය) |

සැ. ඕ. පෙ. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 සැප්තැම්බර් මස 12 වෙනි දින,
කොළඹ දී ය.

9–293—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් පිළිබඳ තීරණ දැක්වෙන දැන්වීමයි

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙනිය

| ටෙන්ඩර් අංකය | සේවාව | ටෙන්ඩර් සංඛ්‍යාව | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|---|
| ඇම්. ටී. 686901 | අශ්වබල 70 පමණ ට්‍රැක්ටර් 20 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 13 | සි./ස.සත්‍යවාදි ස්ටෝර්ස් සහ මෝටර් ට්‍රාන්ස්පෝර්ටර්ස්, 21, දඹුල්ල පාර, කුරුණෑගල. | එකක් රු. 18,747.53 බැගින් |
| ඇම්. ටී. 686902 | අශ්ව බල 50 පමන ට්‍රැක්ටර් 25 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 19 | සි/ස. රෝලන්ඩ් (ට්‍රැක්ටර්) 103 ධර්ම පාල මාවත, කොළඹ 7. | එකක් රු. 14,558.16 බැගින් |
| ඇම්. ටී. 686903 | බී.එච්.පී. 60 ට නොඅඩු ස්ටේෂන් වැගන් (ඇල්. ඩබ්. බී.) 15 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 6 | සි/ස. කොලෝනියල් මෝටර්ස් 297, යූනියන් පෙදෙස, කොළඹ 2 | එකක් රු. 21,720 බැගින් |
| ඇම්. ටී. 686904 | ත්‍රි පරෝඩිස් ප්ලවුස් 12 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 13 | ක්‍රවුන් ඒජන්තවරු, 4 මිල්බැනක් ලන්ඩන් ඇස්. ඩබ්. 1 | එකක් රු. 4,526.16 බැගින් |
| ඇම්. ටී. 686905 | ටු පරෝඩිස් ප්ලවුස් 6ක් සැපයීම සඳහා ටැන්ඩර් | 15 | එම | අමතර කොටස් සහ උපකරණ සහිතව එකක් රු. 1,863.49 බැගින් |
| ඇම්. ටී. 686906 | පොලිඩිස් ටිලර්ස් 8 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 10 | සි/ස. සත්‍යවාදි ස්ටෝර්ස් සහ මෝටර් ට්‍රාන්ස්පෝටර්ස්, 21, දඹුල්ල පාර, කුරුණෑගල | එකක් රු. 3,662.25 බැගින් |
| ඇම්. ටී. 686907 | ටැන්ඩම් ඩිස් හැරෝස් 6 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 14 | එම | අමතර කොටස් සහ උපකරණ සමග එකක් රු. 4,031.66 බැගින් |
| ඇම්. ටී. 686910 | ස්ප්‍රින් ටයින් කල්ටිවේටර්ස් 4 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 13 | සි/ස. සිලෝන් සර්විස් ඇන්ඩ් සප්ලයිස් සමාගම, ,29, අත්තිඩිය පාර, රත්මලාන | එකක් රු. 882 බැගින් |
| ඇම්. ටී. 686912 | බී.එච්.පී. 60 ට නොඅඩු ස්ටේෂන් වැගන් (ඇස්.ඩබ්.බී.) 10 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 4 | සි/ස. කොලෝනියල් මෝටර්ස් 297, යූනියන් පෙදෙස, කොළඹ 2 | එකක් රු. 18,921 බැගින් (ලෑන්ඩ් රෝවර් පික්-අප්-ට්‍රක්ස් 88 වීල් බේස්) |
| ඇම්. ටී. 686914 | බී.එච්.පී. 60 ට නොඅඩු පික් අප් ට්‍රක්ස් (ඇල්.ඩබ්.බී.) 10 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 4 | එම | එකක් රු. 18,675 බැගින් (ලෑන්ඩ් රෝවර් පික්-අප්-ට්‍රක්ස් 109 '' වීල් බේස්) |

| ටෙන්ඩර් අංකය | සේවාව | ටෙන්ඩර් සංඛ්‍යාව | පිළිගත් ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|---|
| ඇම්. ටී. 686916... | වතුර පොම්ප 40 ක් සැපයීම සඳහා ටෙන්ඩර් (300 ජී.වී.ඇම්.) | 21 ... | කන්ට්‍රැක් ඇන්ඩ් සප්ලයිස් සමාගම තැ. පෙ. 487, කොළඹ | එකක් රු. 7,313.40 බැගින් (සිග් මන්ඩ් පල්සොමීටර් ජී.කේ.ජී. වයි) පොම්ප |
| ඇම්. ටී. 686917... | වතුර පොම්ප 10 ක් සැපයීම සඳහා ටැන්ඩර් (150 ජී.වී.ඇම්.) | 20 ... | සිලෝන් සර්විසස් ඇන්ඩ් සප්ලයිස් සමාගම, 29, අත්තිඩිය පාර, රත්මලාන | එකක් රු. 6,227.82 බැගින් (ඩෙස්මි ඇස්.ජී. 65) පොම්ප |
| ඇම්. ටී. 686920... | ඩිලිවරි වෑන් 12 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 7 ... | සි/ස. ඔටෙඩ්‍රෝම් තැ. පෙ. 330 කොළඹ | ඩිලිවරි වෑන් එකක් රු. 14,604.08 බැගින් |
| ඇම්. ටී. 686921... | ආවරන නොකරන ලද ලොරි 10 ක් සැපයීම සඳහා ටෙන්ඩර් | 8 ... | සමුපකාර තොග වෙළඳ ආයතනය, 290, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 | එකක් රු. 31,086 බැගින් (ආවරන නොකරන ලද ටොන් 5 ලොරි) |
| ඇම්. ටී. 686922... | ගවයින් ප්‍රවාහනය කිරීම සඳහා ට්‍රක්ස් රථ 5ක් සැපයීම සඳහා ටෙන්ඩර් | 7 ... | එම | එකක් රු. 33,650 බැගින් (ටොන් 5 බී.ඇම්.සී. ලොරි 830 ඩබ් ඇප්. (ඩබ්. ඇස්.කේ. 100) 160 '' වීල් බේස්) |
| ඇම්. ටී. 686924... | වතුර බව්සර් 4 ක් සැපයීම සඳහා ටැන්ඩර්... | 10 ... | එම ... | එකක් රු. 36,875 බැගින් (ඉසුසු ටී එක්ස් ඩී 20) |
| ඇම්. ටී. 686925... | ට්‍රැක්ටර් ට්‍රක්ස් 1 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 6 ... | ක්‍රවුන් ඒජන්තවරු, 4 මිල්ක් බෑන්ක් ලන්ඩන් ඇස්. ඩබ්. 1 | රු. 89,059.11 (පෝඩන් 4 ඒ ඇල් 6/41 වර්ගයේ ට්‍රැක්ටර් රථයක්) |
| ඇම්. ටී. 686926... | දියර පොහොර විහිදුවන යන්ත්‍ර සහ ටැන්කි 8ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම | 4 ... | සි/ස. රයිට් රෙයින්, රින්වුඩ් හැම්ෂයර්, එංගලන්තය | එකක් රු. 11,659.88 බැගින් |
| ඇම්. ටී. 686927... | පොහොර විසුරුවා හැරීමේ යන්ත්‍ර 8 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම | 8 ... | ක්‍රවුන් ඒජන්තවරු 4 මිල්ක් බෑන්ක් ලන්ඩන් ඇස්. ඩබ්. 1 | එකක් රු. 5,117.50 බැගින් (ඇම් ඇප්. 19—7 වර්ගය) |
| ඇම්. ටී. 686928... | රසායන පොහොර විසුරුවා හරින යන්ත්‍ර 6ක් සඳහා ටෙන්ඩර් පත් කැඳවීම | 5 ... | එම ... | එකක් රු. 7,856.62 බැගින් |
| ඇම්. ටී. 686929... | ට්‍රැක්ටර් මගින් ක්‍රියා කරන තණ කපන යන්ත්‍ර 23 ක් සැපයීම සඳහා ටෙන්ඩර් | 9 ... | සි/ස. බ්‍රවුන් සහ සමාගම, 481, ඩාලි පාර, කොළඹ 10 | එකක් රු. 1,821.17 බැගින් (අඩි 5 අහල් 0 කැපුම් තලයක් සහිත ඇම්. ඇප්. 732 තණ කපන යන්ත්‍ර) |
| ඇම්. ටී. 686931... | රොටරි තලයක් සහිත ට්‍රැක්ටර් මගින් ක්‍රියා කරන තණ කපන යන්ත්‍ර 2 ක් සැපයීම | 7 ... | සි/ස. කොලට්ස් 101, ඩී. ඇස්. සේනා නායක මාවත කොළඹ 8 | එකක් රු. 4,095.50 බැගින් |
| ඇම්. ටී. 686936... | අඩි 8—$8\frac{1}{2}$ දක්වා පලලැති ට්‍රැක්ටර් මත ක්‍රියා කරවන කැපූ තණ රැස් කරන යන්ත්‍ර 19 සැපයීම සඳහා ටැන්ඩර් | 12 ... | ක්‍රවුන් ඒජන්තවරු 4 මිල්ක් බෑන්ක්, ලන්ඩන් ඇස්. ඩබ්. 1 | එකක් රු. 836.83 බැගින් |
| ඇම්. ටී. 686937... | ට්‍රක්ටරයේ ඉදිරිපස සවිකල හැකි අහල් 40 සිට 45 දක්වා පළලැති මුල්ලු සහිත බාල්දිවලින් යුත් පටවන යන්ත්‍ර 6 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 11 ... | සි/ස. කලම්බු කොමෂල් සමාගම තැ. පෙ. 33 කොළඹ | එකක් රු. 2,459.52 බැගින් (ස්ටීල් ඇප්.ඒ.බී. මොඩල් 600) |
| ඇම්. ටී. 686938... | ට්‍රැක්ටරයෙන් ක්‍රියාකරවන තණ කපා එක් රැස්කොට ට්රේලරයට පටවන යන්ත්‍ර 5 (ෆේපාරේජ් හා වෙස්ටර් සැපයීම සඳහා ටෙන්ඩර් | 11 ... | ක්‍රවුන් ඒජන්තවරු 4 මිල්ක් බෑන්ක් ලන්ඩන් ඇස්.ඩබ්. 1 | එකක් රු. 8,581.30 බැගින් |
| ඇම්. ටී. 686939... | පික් අප් හේ බේලර්ස් 6ක් සැපයීම සඳහා ටැන්ඩර් | 12 ... | එම ... | එකක් රු. 11,554.14 බැගින් (නිව් හොලන්ඩ් සුපර් ඒ ලයිනර් වර්ගයේ හේ බේලර්ස්) |
| ඇම්. ටී. 686940... | fපින්ගර් වීල් හේ රෙක් ට්‍රෙඩර්ස් 5 ක් සැපයීම සඳහා ටෙන්ඩර් | 8 ... | එම ... | එකක්. රු. 2623.30 බැගින් |
| ඇම්. ටී. 686942... | පෝස්ට් හොල් ඩිජර්ස් 3 ක් සැපයීම සඳහා ටැන්ඩර් | 15 ... | එම ... | එකක් රු. 1,461 96 බැගින් (ලිස්ටර් පෝස්ට් හෝල් ඩිගර්ස්) |
| ඇම්. ටී. 686943... | පොfරේජ් වැගන් 2ක් සැපයීම සඳහා ටැන්ඩර | 7 ... | එම ... | එකක් රු. 13,948.20 බැගින් (නිව් හොලන්ඩ් පොfරේජ් බොක්ස් මොඩල් 14) |
| ඇම්. ටී. 686944... | ටිපිං ට්‍රෙලර්ස් 6 ක් සැපයීම සඳහා ටෙන්ඩර් | 11 ... | එම ... | එකක් රු. 4,269.12 බැගින් (සැලොප් ට්‍රෙලර්ස්) |
| ඇම්. ටී. 686945... | ට්‍රැක්ටරයෙන් ක්‍රියා කරවන ටොන් $2\frac{1}{2}$ ක ධාරක ශක්තිය ඇති සයිලේජ් කේජ් ට්‍රෙලර්ස් 10ක් සැපයීම සඳහා ටෙන්ඩර් | 10 ... | එම ... | එකක් රු. 4,322.22 බැගින් (සැලොප් සයිලේජ් කේජ් ටිපිං ට්‍රෙලර්ස්) |
| ඇම්. ටී. 686946... | ට්‍රැක්ටරයෙන් ක්‍රියා කරවන ටොන් $3\frac{1}{2}$ ක ධාරන ශක්තිය ඇති ටිපිං ට්‍රෙලර්ස් 14 ක් සැපයීම සඳහා ටෙන්ඩර් | 13 ... | එම ... | එකක් රු. 3,609/02 බැගින් (වීට්ලි ට්‍රෙලර්ස් |

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

ඉංජිනේරු අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය,
1969 අගෝස්තු මස 28 වෙනි දින.

9–388—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

සම්බන්ධය : කොන්/ඇල්/බී/645/69.

## ප්‍රාදේශීයව නිපදවන ප්ලාස්ටික් ජලනල හා උපකරණ ආදිය සැපයීම

| සැපයීම් වර්ගය හෝ සේවය | ලද ටෙන්ඩර් ගණන | ප්‍රමාණය හා මිණුම් ප්‍රමාණය | පිළිගත් ටෙන්ඩර් කරුණු | පිළිගත් මිළ | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| ජේ.අයි.ඇස්. 6742 ට අනුකූල " ඇන් ටන් " රිජිඩ් පී.වී.සී. ජලනල සම්මත දිගින් | මුල් ටෙන්ඩර් 2 යි | (1) දිග අඩි 30,000යි. ½" විශ්. | සැන්ට් ඇන්තනීස් තර්මෝප්ලාස්ටික් ඉන්ඩස්ට්‍රීස්, 752/1, බේස්ලයින් පාර, කොළඹ 9 | (1) දිග අඩියක් 0.34 බැගින් ... | — |
| | | (2) දිග අඩි 1,00,000යි. ¾" විශ්. | | (2) දිග අඩියක් 0.40 බැගින් ... | — |
| | | (3) දිග අඩි 75,000යි. 1" විශ්. | | (3) දිග අඩියක් 0.59 බැගින් ... | — |
| | | (4) දිග අඩි 20,000යි. 1¼" විශ්. | | (4) දිග අඩියක් 0.69 බැගින් ... | — |
| | | (5) දිග අඩි 50,000යි. 1½" විශ්. | | (5) දිග අඩියක් 0.99 බැගින් ... | — |
| | | (6) දිග අඩි 60,000යි. 2" විශ්. | | (6) දිග අඩියක් 1.40 බැගින් ... | — |
| ජේ.අයි.ඇස්. 6741 ට අනුකූල " ඇන් ටන් " රිජිඩ් පී.වී.සී. ජලනල සම්මත දිගින් | එම ... | (7) දිග අඩි 10,000යි. 2½" විශ්. | | (7) දිග අඩියක් 1.85 බැගින් ... | — |
| | | (8) I. දිග අඩි 40,000යි. 3" විශ්. සොකට් රහිත | | (8) I. දිග අඩියක් 2.65 බැගින් | — |
| | | II. එක් කොනක් සහිත | | II. දිග අඩියක් 2.71 බැගින් | — |
| | | (9) I. දිග අඩි 20,000යි. 4" විශ්. සොකට් රහිත වී.පී. වර්ගය | | (9) I. දිග අඩියක් 4.48 බැගින් | — |
| | | II. එක් කොනක් සොකට් සහිත | | II. දිග අඩියක් 4.54 බැගින් | — |
| | | III. වී.යූ. වර්ගය සොකට් රහිත | | III. දිග අඩියක් 3.75 බැගින් | — |
| | | IV. වී.යූ. වර්ගය එක් කොනක් සොකට් සහිත | | IV. දිග අඩියක් 4.00 බැගින් ප්‍රතික්ෂේප කර ඇත | — |
| | | V. 6" | | | |
| | | VI. 8" | | එම | |

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

9-384—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිනීම

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### බටහිර දිසාව, දව වෙන්දේසිය

තොග 1කින් යුත් ලැලි 22ක්, තොග 7කින් යුත් සිල්පර 121ක් සහ තොග 8කින් යුත් ඉරූ ලී ඝ.අ. 840.0ක් රත්නපුර බස්නාහිර දිසා වන නිලධාරි විසින් 69.9.26 දින පෙරවරු 10.00 ට රක්වාන අඩවි වන නිලධාරි කායර්‍යාල යේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දව රක්වාන වන රක්ෂක බාරයේ සහ කහවත්ත දුම්රියාංගනයේ ඇත.

අපේක්ෂිත ඉල්ලුම්කරුවන් ප්‍රථමයෙන් ඒ ඒ ස්ථානවල ඇති දව පරීක්ෂා කර බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර රත්නපුර බස්නාහිර දිසා වන නිලධාරිගෙන් හෝ රක්වාන අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

ඇස්. ඇන්. යූ. ප්‍රනාන්දු,
දි. ව. නි.—බ. දි.

දි. ව. නි. කායර්‍යාලය,
රත්නපුර,
1969 අගෝස්තු මස 28 වැනි දින.

9–428—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය තොගයක් 1969 සැප්තැම්බර් 27 වන සෙනසුරාද දින පෙරවරු 10.00 ට රත්මලාන-අත්තිඩිය පාරේ පිහිටි ප්‍රධාන ගුවන් විදුලි ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකුණනු ලබන දින පෙරවරු 9.00 සිට මෙම බඩු බාහිරාදිය පරීක්ෂා කර බැලීම පිණිස තබනවා ඇත. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, ලෝටස් පාර, කොළඹ 1 යන ලිපිනයට ඉල්ලුම් පතක් එවීමෙන් හෝ රත්මලාන-අත්තිඩිය පාරේ ප්‍රධාන ගුවන් ඉංජිනේරු තැනගේ කායර්‍යාලයෙන් හෝ මෙම බඩු බාහිරාදියේ ලැයිස්තුවක් ලබාගත හැක.

3. මිළදී ගනු ලබන බඩු බාහිරාදිය සඳහා එම ස්ථානයේදීම මුදල් ගෙවිය යුතු වන අතර මිළ දී ගත් බඩු එදින පස්වරු 4.30 ට පෙර ඉවත් කරගත යුතුය.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 5 වැනි දින,
තැ. පෙ. 535,
කොළඹ 1.

9–427—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

---

## රේගු විකිණීම

පහත සඳහන් බඩුබාහිරාදිය 1969 සැප්තැම්බර් මස 23 වෙනි දින පෙරවරු 11 ට යාපනය රේගු කායර්‍යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම බඩු විකුණනු ලබන දින පෙරවරු 9.30 සිට බැලිය හැක. සෑම ඉල්ලුම්කරුවෙක්ම තමන් ඉල්ලූ මුදලට බඩුවක් තීරණය වූ විට මුදලෙන් අඩක් ගෙවිය යුතුය. සතියක් ඇතුළත මුළු මුදලම ගෙවා බඩු රැගෙන යා යුතුය. සතුටුදායක යයි හැඟෙන ඉල්ලුම් පමණක් භාරගැනීමට අයකැමිට බලය ඇත. කරුංකා, කර්දමුංගු ආදිය සඳහා බර අනුව ඉල්ලුම් කළ හැක.

### වෙන්දේසියේ විකුණනු ලබන බඩු

1. කරුංකා ගෝනි 1 යි
2. කරාබු නැටි ගෝනි 1 යි
3. කරාබු නැටි ගෝනි 5 යි
4. කරුංකා ගෝනි 3 යි
5. කරුංකා ගෝනි 15 යි
6. සාදික්කා ගෝනි 1 යි
7. සාදික්කා ගෝනි 1 යි
8. කරාබු නැටි ගෝනි 3 යි
9. කරුංකා ගෝනි 5 යි
10. කරුංකා ගෝනි 24 යි
11. කරුංකා ගෝනි 10 යි
12. කරුංකා ගෝනි 13 යි
13. කරදමුංගු ගෝනි 1 යි
14. බයිසිකල් 1 යි
15. කරදමුංගු ගෝනි 21 යි
16. කරුංකා ගෝනි 15 යි
17. කරුංකා ගෝනි 2 යි
18. කරුංකා ගෝනි 31 යි

එස්. එම්. ජේ. සේනාරත්න,
යාපනය දිස්ත්‍රික් රේගු අයකැමි වෙනුවට.

ලංකා රේගුව,
යාපනය,
1969 අගෝස්තු මස 25 වන දින.

9–301—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

## වෙන්දේසියේ විකිණීම

පදලගෙල වන්ද්‍රිකාවැව, ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් වැල්ලවායේ හඳපාන්ගල ලී මෝලෙහි ඇති පහත සඳහන් දැව තොගය 1969 සැප්තැම්බර් 26 වන දින ප.ව. 2 ට වැල්ලවායේ හඳපාන්ගල ලී මෝලෙහි දී වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 15 වන දින සිට 20 වන දින දක්වා නිවාඩු දිනයන්හි හැර උදේ 9 සිට සවස 4 දක්වා ගැනුම්කරුවන්ට පරීක්ෂාකර බැලිය හැක. ගැනුම් කරුවන් විසින් කීන්දුවූ මුදල වෙන්දේසිය අවසානයේදී එකවර ගෙවිය යුතුය. මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා දැව වෙන්දේසිය අනුමතකර දින හතක් ඇතුලත ගෙන යා යුතුය. වෙන්දේසිය අවසානයෙහි දින හතකින් පසුවත් මෙම දැව ලී මෝලෙහි තබාගනු ලබන්නේ ගැනුම්කරුගේ වගකීම පිටය.

| | | | |
|---|---|---|---|
| 4″ × 3″ | — | 3′0″ | 6යි |
| ,, | — | 3′6″ | 27යි |
| ,, | — | 4′0″ | 218යි |
| ,, | — | 4′6″ | 178යි |
| ,, | — | 5′0″ | 260යි |
| ,, | — | 5′6″ | 220යි |
| ,, | — | 6′0″ | 65යි |
| ,, | — | 6′6″ | 42යි |
| ,, | — | 7′0″ | 56යි |
| ,, | — | 8′0″ | 92යි |
| ,, | — | 8′6″ | 52යි |
| ,, | — | 9′0″ | 22යි |
| ,, | — | 9′6″ | 60යි |
| ,, | — | 10′0″ | 13යි |
| ,, | — | 10′6″ | 8යි |
| ,, | — | 11′0″ | 24යි |
| ,, | — | 11′6″ | 17යි |
| ,, | — | 12′6″ | 5යි |
| ,, | — | 13′0″ | 3යි |
| ,, | — | 13′6″ | 4යි |
| ,, | — | 14′0″ | 4යි |
| ,, | — | 15′0″ | 7යි |
| ,, | — | 16′0″ | 1යි |
| ,, | — | 17′0″ | 2යි |
| ,, | — | 17′6″ | 2යි |
| ,, | — | 18′0″ | 1යි |
| 4″ × 2″ | — | 4′0″ | 60යි |
| ,, | — | 7′0″ | 34යි |
| ,, | — | 7′6″ | 23යි |
| ,, | — | 8′6″ | 38යි |
| ,, | — | 11′0″ | 14යි |
| ,, | — | 11′6″ | 15යි |
| 4″ × 3″ | — | 4′6″ | 4යි |
| 4″ × 2″ | — | 12′0″ | 19යි |
| ,, | — | 12′6″ | 37යි |
| ,, | — | 13′0″ | 38යි |
| ,, | — | 13′6″ | 28යි |
| ,, | — | 14′0″ | 33යි |
| ,, | — | 14′6″ | 8යි |
| ,, | — | 15′0″ | 8යි |
| ,, | — | 15′6″ | 8යි |
| ,, | — | 16′0″ | 4යි |
| ,, | — | 16′6″ | 4යි |
| 3″ × 2″ | — | 4′0″ | 32යි |
| ,, | — | 4′6″ | 28යි |
| ,, | — | 5′0″ | 38යි |
| ,, | — | 5′6″ | 29යි |
| ,, | — | 6′0″ | 123යි |
| ,, | — | 8′0″ | 2යි |
| ,, | — | 8′6″ | 1යි |
| ,, | — | 9′0″ | 2යි |
| ,, | — | 9′6″ | 11යි |
| ,, | — | 10′0″ | 14යි |
| ,, | — | 10′6″ | 1යි |
| ,, | — | 11′0″ | 5යි |
| ,, | — | 11′6″ | 2යි |
| ,, | — | 12′0″ | 10යි |
| ,, | — | 13′0″ | 5යි |
| ,, | — | 15′6″ | 5යි |
| ,, | — | 16′0″ | 2යි |
| 2″ × 2″ | — | 2′0″ | 164යි |
| ,, | — | 3′0″ | 80යි |
| ,, | — | 5′0″ | 181යි |
| ,, | — | 6′0″ | 145යි |
| ,, | — | 7′0″ | 310යි |
| ,, | — | 8′0″ | 7යි |
| ,, | — | 9′0″ | 13යි |
| ,, | — | 10′0″ | 64යි |
| ,, | — | 11′0″ | 46යි |
| ,, | — | 13′0″ | 53යි |
| ,, | — | 14′0″ | 10යි |
| ,, | — | 15′0″ | 19යි |
| ,, | — | 16′0″ | 14යි |
| 2″ × 1″ | — | — | 151,000යි |
| 4″ × 4″ | — | — | 12,000යි |

වී. කනගලිංගම්,
ඉඩම් සංවර්ධන නිලධාරි, වන්ද්‍රිකා වැව.

1969 අගෝස්තු මස 29 වැනි දින,
වන්ද්‍රිකාවැව, ඉඩම් සංවර්ධන කාර්යාලය,
පදලගෙල.

9–291—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ගෙයක් සහිත ඉඩම් වෙන්දේසියක්

1969 ඔක්තෝබර් මස 3 ද ප.ව. 4 ට පිහිටි ස්ථානයේදී නො. 10/4, මුත්ත විනායගර කෝවිල් පාර (ප්‍රසිද්ද පාරක්) කච්චේරි නල්ලූර් පාරට මායින්ව. විදුලි බලය තිබේ. නල්ලූර් කන්දසාමි කෝවිලට සැ. ½ යි. කච්චේරියට සැතැපුම් ¾ යි. දුම්රිය පොලට සැ. 1½ යි. යාපනය නගර සභා සීමාව තුල හා යාපනයේ නගරයට ආසන්න ජාතික නිවාස සහකාර කොමසාරිස් ධනපාල සිරිසේන විජේසිංහ තුමා විසින් මට දී ඇති බලය පිට වෙන්දේසියේ විකුනමි. මෙය වෙන්දේසියේ විකුනනුයේ, යාපනයේ එම්. ආර්. කාරලිසිංහම්, ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1960.1.4 දින අංක 4793 උකස්කරය යටතේ මුදල් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එම්. මුතුලිංගම් මහතා සහ අන්නලෙච්චමි මිය ගෙන් 1968.7.1 දිනතෙක් අයවිය යුතු රුපියල් දෙලොස්දස් අනූ එකයි ශත හතලිස් නවය (රු. 12,091.49) සඳහාත්, එසේම 1968.7.1 දින සිට විකිණීමට පැමිණෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තව දුරටත් වූ රුපියල් අටදහස් නමසිය අනූනමයයි සහ හැට (රු. 8,999.60) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට 3¾ ප්‍රමාණයට යථෝක්ත උකස්කර්ය ප්‍රකාර 68.7.1 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමග අය කර ගැණීමත් එසේ අයකර ගැණීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අය කරගැණීම සඳහාත්ය.

### උපලේඛණය

උතුරු පලාතේ, යාපනය දිස්ත්‍රික්කයේ සහ කොට්ඨාශයේ නල්ලූර් ග්‍රාමයේ නල්ලූර්හි පිහිටි ලාච්මස් 3 යි. වී.සී. සහ කුලිස් 10½ ක ප්‍රමාණයෙන් යුත් එහෙත් ජෝන් මැනුවෙල් බලය ලත් මිනින්දෝරු තැන විසින් සකසන ලද අංක 861 හා 1958.8.31 දින දරණ සැලැස්ම අනුව ලාච්මස් 3 යි වී.සී. සහ කුලිස් 12½ ක ප්‍රමාණයෙන් යුත් නැගෙනහිරින් රත්නම්ගේ භාර්යාව වන රාසම්මාගේ දේපොලින් ද, උතුරින් මූර්තවිනයගාර් කෝවිල් පාර (ප්‍රසිද්ධ පාරක්) දක්වා ඇති අතුරු පටු මගින් ද, බටහිරින් ආරුමුගම් මහලින්ගම්ගේ දේපොලින් සහ දකුණින් වෙල්ලයියා බාලසුබ්‍රමානියම් සහ තවත් අයට අයත් දේපොලින් ද, මායිම වූ යාපනේ මූර්තවිනයගාර් පාරේ වරිපනම් අංක 14/7 (අළුත්) සහ 10/4 (පරණ) දරණ ''කන්නන්වලව්'' නැමැති ඉඩම, ලිඳ, වැව්ල්ල සහ එහි තනා ඇති නිවාසය.

වැඩි විස්තර ජාතික නිවාස කොමසාරිස්තුමා, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ 2 න් ලබාගත හැක.

ඒ. පී. පී. එදිරිමන්නසිංහම්,
වෙන්දේසිකරු.

107, කෙළින් වීදිය,
යාපනය.
දිනය 69.9.2.

9–252—69.9.12 දින අංක 14,871 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම එවිය යුතුය.

### උපලේඛනය

### 1969

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 69. 6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි